6 ශ්‍රේණිය

සිංහල



# දිවිය දිනන කතා

සිංහල දෙපාර්තමේන්තුව

ජාතික අධ්‍යාපන ආයතනය

# දිව්‍ය දිනන කතා

## 6 ශ්‍රේණිය
## සිංහල

සිංහල දෙපාර්තමේන්තුව
භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය
ජාතික අධ්‍යාපන ආයතනය
ශ්‍රී ලංකාව

වෙබ් අඩවිය : www.nie.lk
විද්‍යුත් තැපැල : info@nie.lk

දිවිය දිනන කතා
6 ශ්‍රේණිය
සිංහල

ප්‍රථම මුද්‍රණය : 2021

© ජාතික අධ්‍යාපන ආයතනය
ISBN ....................

සිංහල දෙපාර්තමේන්තුව
භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය
ජාතික අධ්‍යාපන ආයතනය
ශ්‍රී ලංකාව

වෙබ් අඩවිය : www.nie.lk
විද්‍යුත් තැපැල : info@nie.lk

unicef | for every child
සැම දරුවෙක් වෙනුවෙන්ම
ஒவ்வொரு சிறுவர்களுக்காகவும்

අනුග්‍රහය
යුනිසෙෆ් ආයතනය

## හැඳින්වීම

මෙම ග්‍රන්ථය පාසල් ශිෂ්‍යයන් තුළ හුවමාරු කුසලතා Transversal (Transferable) Skills සංවර්ධනය සඳහා සම්පාදනය කරන ලද අතිරේක පාඨ ග්‍රන්ථයකි. ළමා වයසට උචිත කතන්දර කිහිපයක් මගින් ශිෂ්‍යයන් තුළ හුවමාරු කුසලතා සංවර්ධනය කිරීම මෙහි දී භාවිත කළ උපාය මාර්ගය යි. කතන්දර මගින් ළමා මනස තුළ කුසලතා සංවර්ධනයට අවශ්‍ය මූල බීජ ජනිත කරවීම පැරණි අධ්‍යාපන ක්‍රමවේදයකි.

හුවමාරු කුසලතා Transversal (Transferable) Skills යනු අධ්‍යාපනය, පුහුණුව හෝ විවිධ රැකියාවල නිරත වීම මගින් පුද්ගලයා තුළ ගොඩ නැගෙන පෞද්ගලික කුසලතා සමූහයකි. මේවා රැකියාවකට ආවේණික කුසලතා නො වන අතර ඕනෑ ම රැකියාවකට යොදා ගත හැකි, රැකියාවෙන් රැකියාවකට උචිත පරිදි යොදා ගත හැකි කුසලතා වේ. එහෙයින් ම ඒවා මාරු කළ හැකි කුසලතා නම් වේ. මෙම කුසලතාවල ද යම් යම් මට්ටම් පවතී. අධ්‍යාපනයේ මෙන් ම රැකියාවල ද නිරත වීම මගින් පුද්ගලයා තුළ මේ කුසලතා සංවර්ධනය වේ. රැකියාවකට පුද්ගලයෙකු සුදුසුකම් ලබන්නේ ද මෙම කුසලතා නිසා ය. මනාව රැකියාවේ නිරත වීම මගින් මෙම කුසලතා සංවර්ධනය වේ. පුහුණුවෙන් ද මෙම කුසලතා සංවර්ධනය වන බව ඉහත සඳහන් විය. පුහුණු පාඨමාලා සංවිධානයේ දී පුහුණුලාභින් තුළ මෙම කුසලතා සංවර්ධනය වන අයුරින් පාඨමාලාව සංවිධානය කිරීම කළ යුතු ය. ඒ සඳහා ද කිසි යම් පෙලඹවීමක් මෙමගින් සිදු වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

විසි එක් වන සියවසේ කුසලතා (21st Century Skills) සහිත සිව්වන කාර්මික යුගයට (Fourth Industrial Revolution) යෝග්‍ය පුරවැසියන් බිහි කිරීම සඳහා අත්වැලක් සැපයීම මෙම ග්‍රන්ථයේ අපේක්ෂාව යි. විසි එක් වන සියවසේ කුසලතා (21st Century Skills) වශයෙන් විචාරාත්මක චින්තනය (Critical Thinking), නිර්මාණශීලීත්වය (Creativity), සාමූහිකත්වය (Collaboration), සන්නිවේදනය (Communication), තොරතුරු සාක්ෂරතාව (Information Literacy), මාධ්‍ය සාක්ෂරතාව (Media Literacy), තාක්ෂණ සාක්ෂරතාව (Technology Literacy), නම්‍යශීලී භාවය (Flexibility), නායකත්ව කුසලතා (Leadership Skills), මූලිකත්ව දැරීම (Initiative), ඵලදායීතාව (Productivity), සමාජ කුසලතා (Social Skills) යනාදිය දැක්විය හැකි ය.

හුවමාරු කුසලතා (Transversal Skills) තුළ ම මෘදු කුසලතා ද (Soft Skills) ඇතුළත් ය. එම කුසලතා කිහිපයක් උදාහරණ ලෙස මෙසේ දැක්විය හැකි ය. කණ්ඩායම් ක්‍රියාකාරකම් (Team work), ගැටලු විසඳීම (Problem Solving), තීරණ ගැනීම (Decisiveness), නිෂ්පාදන දැනුම (Product Knowledge), කාල කළමනාකරණය (Time Management), මූල්‍ය කළමනාකරණය (Financial Management), සැලසුම්කරණය (Planning), සහකම්පනය (Empathy), ඉවසීම (Patience), අනුවර්තනය වීමේ හැකියාව (Adaptability), සංවිධාන හැකියාව (Organization), ප්‍රසිද්ධියේ කතා කිරීම (Public Speaking), පාරිභෝගික සේවය (Customer Service), විශ්වසනීයත්වය (Dependability), වැඩ ආචාර ධර්ම (Work

Ethics), ගෝලීය දැනුවත් භාවය (Global Awareness), උපායශීලී බව (Tactical), අන්‍යයන්ට උපකාර කිරීම (Helping Others), අනුකම්පාව (Compassion), අන්‍ය මත ඉවසීම (Patience on the other), ආචාරශීලී බව (Politeness), වෙහෙස මහන්සි වී වැඩ කිරීමට කැමැති වීම (Willingness to Work Hard), සාකච්ඡා කුසලතා (Negotiation Skills) යනාදි කුසලතා අදාළ කතා ඇසුරෙන් ශිෂ්‍යයන් සහ ගුරු දෙගුරුන් තුළ වර්ධනය කරවීම කෘතිය සම්පාදනයෙහි අභිලාෂය යි. භුවමාරු කුසලතා, මෘදු කුසලතා ශිෂ්‍ය අවදියේ පමණක් නො ව රැකියා කරන අවදියේ දී ද අත්‍යවශ්‍ය වේ.

මෙම කෘතිය සම්පාදනය සඳහා මාර්ගෝපදේශකත්වය සැපයූ ජාතික අධ්‍යාපන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් ආචාර්ය සුනිල් ජයන්ත නවරත්න මැතිතුමාටත් භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨාධිපති, නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්තුමාටත් මෙහෙයවීම කළ සිංහල දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂතුමාටත් සිංහල දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර ලේඛක මණ්ඩලයටත් බාහිර ලේඛක මණ්ඩලයටත් මූල්‍ය අනුග්‍රහය දැක්වූ යුනිසෙෆ් ආයතනයටත් නන් අයුරින් සහයෝගය දැක්වූ සියලු ම දෙනාටත් මාගේ හෘදයාංගම ස්තුතිය පිරිනැමේ.

ආචාර්ය, රාජකීය පණ්ඩිත පූජ්‍ය වාවින්නේ පඤ්ඤානන්ද හිමි
සහකාර කථිකාචාර්ය, සිංහල දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය

## සම්පාදක මණ්ඩලය


| | | |
|---|---|---|
| උපදේශකත්වය හා අනුමැතිය | : | ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලය<br>ජාතික අධ්‍යාපන ආයතනය |
| මෙහෙයවීම | : | ආචාර්ය සුනිල් ජයන්ත නවරත්න<br>අධ්‍යක්ෂ ජනරාල්<br>ජාතික අධ්‍යාපන ආයතනය |
| | | ආචාර්ය දර්ශන සමරවීර<br>නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්<br>භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය<br>ජාතික අධ්‍යාපන ආයතනය |
| අධීක්ෂණය | : | එම්. ආර්. ඩබ්ලිව්. මද්දුම<br>අධ්‍යක්ෂ<br>සිංහල දෙපාර්තමේන්තුව<br>ජාතික අධ්‍යාපන ආයතනය |
| සම්බන්ධීකරණය | : | ආචාර්ය, රාජකීය පණ්ඩිත<br>පූජ්‍ය වාවින්නේ පඤ්ඤානන්ද හිමි<br>සහකාර කථිකාචාර්ය<br>සිංහල දෙපාර්තමේන්තුව<br>ජාතික අධ්‍යාපන ආයතනය |

සංස්කාරක මණ්ඩලය : මහාචාර්ය කේ. ඊ. කරුණාරත්න
කොළඹ විශ්වවිද්‍යාලය

මහාචාර්ය පී. බී. ඒකනායක
රුහුණ විශ්වවිද්‍යාලය

කථිකාචාර්ය එච්. එම්. ඩී. කේ. ආරියවංස
පේරාදෙණිය විශ්වවිද්‍යාලය

කථිකාචාර්ය ඩබ්ලිව්. ආර්. පී. එම්. ඩී. යූ. රණසිංහ
විවෘත විශ්වවිද්‍යාලය

පිටපත් රචක ජනිත් කුමාර උත්තමාවඩු
එම්. ඩී. ගුණසේන සහ සමාගම

අභ්‍යන්තර ලේඛක මණ්ඩලය : ආචාර්ය සුනිල් ජයන්ත නවරත්න
අධ්‍යක්ෂ ජනරාල්
ජාතික අධ්‍යාපන ආයතනය

එම්. ආර්. ඩබ්ලිව්. මද්දුම
අධ්‍යක්ෂ
සිංහල දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය

පූජ්‍ය කුකුරම්පොල ඤාණවිමල හිමි
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය
සිංහල දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය

එම්. ජී. මුණසිංහ
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය
සිංහල දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය

ඩබ්ලිව්. පී. මංගල ගුණරත්න
ජ්‍යෝෂ්ඨ කථිකාචාර්ය
සිංහල දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය

පී. ඒ. ඩී. රුවනි සිසිජා
ජ්‍යෝෂ්ඨ කථිකාචාර්ය
සිංහල දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය

ආචාර්ය, රාජකීය පණ්ඩිත
පූජ්‍ය වාවින්නේ පඤ්ඤානන්ද හිමි
සහකාර කථිකාචාර්ය
සිංහල දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය

ජේ. මදාරා උත්පලා ජයරත්න
සහකාර කථිකාචාර්ය
සිංහල දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය

බාහිර ලේඛක මණ්ඩලය :

ඩබ්ලිව්. කරුණාරත්න
ජ්‍යෝෂ්ඨ කථිකාචාර්ය
ගුරු මධ්‍යස්ථානය, ගිරාගම, පිළිමතලාව

එච්. පී. සුසිල් සිරිසේන
කථිකාචාර්ය
හාපිටිගම් ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය, මීරිගම

ප්‍රදීප් ඉඳුනිල් පියරත්න
සහකාර ප්‍රකාශන කොමසාරිස්
ප්‍රකාශන දෙපාර්තමේන්තුව

ඩී. ජී. අප්සරා කුමුදු කුමාරි
සහකාර කථිකාචාර්ය
රුහුණ විශ්වවිද්‍යාලය

එච්. ඒ. ඩී. සී. පෙරේරා
ශ්‍රී ලංකා ගුරු සේවය 2-i

ගලෙන්බිඳුණුවැවේ සුදීපා මෙහෙණින් වහන්සේ
පරිවේණාචාර්ය

තාක්ෂණික සහාය : ලක්ෂ්මී සුරේෂ්කුමාර්
අධ්‍යාපන නිලධාරි
යුනිසෙෆ් ආයතනය

චිත්‍ර සහ පිටකවර නිර්මාණය : සමන් කලුබෝවිල
කථිකාචාර්ය
හාපිටිගම් ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය
මීරිගම

# පටුන


| | | |
|---|---|---|
| 1. | සියඹලා මල් ............................................ | 1 |
| 2. | අකුරු ............................................ | 8 |
| 3. | උදාරගේ හපන්කම් ............................................ | 13 |
| 4. | අලුත් ඇසකින් අවට බලමු ............................................ | 18 |
| 5. | කුමුදුගේ කතාව ............................................ | 23 |
| 6. | දිනූ ජීවිතයක් ............................................ | 27 |
| 7. | මනුස්සකම ............................................ | 35 |
| 8. | මිනිස්සු ............................................ | 43 |
| 9. | අපෙන් අකුරු උදුරගන්න<br>'කොරෝනා' ට බැරිවුණා ............................................ | 47 |
| 10. | ශීතාගාරයක සිර වී ............................................ | 52 |
| 11. | පිල් කඩ............................................ | 57 |
| 12. | පසිඳුයි යාළුවොයි ............................................ | 64 |
| 13. | දුර්ග භූමිය............................................ | 68 |
| 14. | කවුද දුප්පත්?............................................ | 72 |
| 15. | නූලෙන් බේරුණු විදුරංග ............................................ | 77 |


දිවිය දිනන කතා
6 ශ්‍රේණිය
සිංහල
6 ශ්‍රේණිය
සිංහල
දිවිය දිනන
කතා
unicef



# 1 සියඹලා මල්

"ඉක්මනට දුවල ගිහින් සියඹලා ගහ වටේට රවුමක් හැදෙන්න"

සුබා ගුරුතුමිය හය වන පන්තියේ දරුවන්ට කීවෙ ඉණට අත් දෙක ම තියා ගෙන, පන්තියේ කොට බිත්තියට හේත්තු වෙලා. ඇයගේ හඬ මුළු ශාලාවට ම ඇහුණ කියල දැනුණෙ, ළමයින්ගේ සද්දේ අඩු වෙලා එකපාරට ඇති වූ නිහඬතාව නිසා.

පන්තිය පුරා ම පුටු එහාට මෙහාට වෙන සද්දේ ටික ටික අඩු වෙලා ගියා. ළමයි පේළියට ආසාවෙන් ගියත්, සියඹලා ගහ වටේට තව ම රවුමක් හැදිල නැහැ කියලා සුබා ගුරුතුමියට හිතුණා.

රවුම හැදෙන්න කලින් දරුවො කරන දේ ඈ දන්නවා. එයාලගේ ආසාවට ඉඩ දීලා ටික වෙලාවක් ඇය ඈතට වෙලා හිටියා.

ගහ යට වැටිච්ච සියඹලා මල් අහුල ගෙන, අල්ලේ තියලා එහාට මෙහාට ගසලා දාලා, කටේ දාගෙන තලු මරන දරුවන්ගේ හැසිරීම් දිහා ඈ බලා ගෙන හිටියා. එක් කෙනෙක්, දෙන්නෙක් හැර හැමෝ ම තරගෙට සියඹලා මල් අහුලනවා. ගහ දිහා උඩ බලනවා, තව මල් වැටෙයි ද කියලා.

"දැන් රවුම හදා ගන්න ඕනෙ. ඉක්මනට වට දෙකක්, දුවල රවුම හැදෙන්න. වටපිට බලන්නෙ නැති ව අත් දෙක උඩට උස්ස ගෙන දුවන්න."

ගුරුතුමිගෙ නියෝගයෙන් පුංචි අත් ඉහළට එස වුණත්, අත් මිට මොළවා ගෙන,

"අත් මිට මොළවන්නෙ නැති ව දිග ඇරගෙන දුවන්න"



ඇගේ ඒ විධානයෙන් ළමයි වැඩි දෙනෙක් අසරණ වුණා. අත්වල ඇඟිලි අතරින් රතු පාට සියඹලා මල් ආපහු බිමට වැටුණා. ඇය අපේක්ෂා කළෙත් ඒක ම තම යි. අතේ සියඹලා මල් ගුලිවෙද්දී, හිතට අලුත් දෙයක් ගන්න මේ දරුවෝ පුංචි වැඩි බව ඈ දැන ගෙන හිටියා. දුවල හති වැටුණත්, ගුරුතුමියගේ වටේට රවුම හැදිලා, තමන්ගේ සීමාව වෙන් කර ගන්නවා කකුල්වලින්. කකුලේ විළුඹ කොටස පොළවට තද කරලා, මහපට ඇඟිල්ලෙන් තද කර ගෙන වටේට කැරකෙනවා. එක්කෙනෙකුට රවුම් දෙක යි. ඒක ඉර හඳ වාගේ වටිනවා, මේ වෙලාවෙ දී සියඹලා මල් වැටෙනවා සුබා ගුරුතුමියගේ සාරි පොටේ දැවටී ගෙන.

"ඊයෙ පාඩමේ ඉතුරු ටික අද මං කියලා දෙනවා. ආහාර ජාති නරක් නො වී කල් තියා ගන්න තියෙන ක්‍රම මොනවද කියල." කථාව ඉවර කරන්නත් පෙර යසිරු ආඩම්බරයෙන් අත් දෙක ම උස්සා ගෙන උත්තර දෙන්න පටන් ගත්ත.

"බත් වේළලා හදපු අග්ගලා තමයි, මං අද ඉස්කොලෙ ගෙනාවෙ"

සමහරු හිනා වුණා.

"ඊයියා! අග්ගලත් කෑමක් ද?" කවුද කට හැකර කාරයෙක් කෑ ගැහුවා මුළු පන්තියට ම ඇහෙන්න.

ගුරුතුමියගේ මූණ කොයි වගේ ද කියල විතරයි, යසිරු බැලුවෙ.

"පුතයි අම්මයි දෙන්න ම හරි ම හොඳයි." ගුරුතුමියගේ හඬ යසිරුට ශක්තියක්.

"මං ගෙනාවෙ ජෑම් ගාලා පාන්", සොසේජස් බනිස්, පැස්ටා, නූඩ්ල්ස් එක එක උත්තර පේළියට කියවෙන්න පටන් ගත්තා. සුබා ගුරුතුමියට කතා කරන්නවත් ඉඩක් නැහැ. හැමෝ ම ගෙනත් තියෙන්නෙ කල් තබා ගන්න කෑම ජාති. පාට පාට උත්තර ලැබුණත්, කිහිපදෙනෙක් මුහුණු කළු කර ගෙන. ඒ අයට දෙන්න උත්තරයක් නැහැ කියල සුබා ගුරුතුමියට දැනුණා.





සියඹලා ගහ උඩත්
ඉස්කෝලයක් වගේ
ලේන්නු එහාට මෙහාට
සරඹ සංදර්ශනයක් පවත්වනවා.
ඒ අයගේ දැඟලිල්ල සුබා ගුරුතුමියගේ පන්තියට
බාධාවක්. පුංචි පුංචි අතු කැලි එහෙන් මෙහෙන් බිමට
ඇද වැටෙනවා.


මොන තරම් බාධක තිබුණත්, ගුරුතුමියයි, දරුවොයි ලස්සන පාඩමක්. සිනාව, සතුට මැද්දෙ අත් ඉස්සෙනවා, පහත වැටෙනවා, අප්පුඩි සද්දෙට ලේන්නුන්ගේ පන්තිය ම බය වෙලා. පාඩම අතරතුර එක එක ප්‍රශ්න ගුරුතුමියගෙන් දරුවන්ට, දරුවන්ගෙන් ගුරුතුමියට. ප්‍රශ්න උත්තර මැද්දෙ යසෝදා නිහඬ ව ම ඉන්නවා. ඇයගේ වෙනස, ඊයෙත් මේ සියඹලා ගහ යට දී සුබා ගුරුතුමිය දැක්කා.

යසෝදාගේ ඇස් දෙක තියෙන්නෙ, පාසලේ තාප්පේ හදන්න වැලි අදින දෙමාපියන්ගේ ශ්‍රමදානය දිහා, දෙපැත්තෙ ඉන්න යාළුවෝ යසෝදගේ අත් දෙකෙන් අල්ලලා එහාට මෙහාට පද්දන්න උත්සාහ කළත් රවලා බලලා අත ගසල දානවා. ඒක එයාට කරදරයක් වාගේ.

ඉස්කෝලෙ තාප්පේ දැන් හුඟක් දුරට වැඩ ඉවර යි.

"තාප්පේ බැන්දම ඉස්කෝලේ වත්ත
ලස්සන වෙයි."






"අපේ බෝල, කම්බි
වැටෙන් පාරට යන්නෙ නෑ."

"පන්තියේ කුණු බාල්දිය
පෙරළන්න බල්ලන්ට එන්නත්
බැහැ නේ."

පන්තියේ ළමයින්ගේ කථා ගුරුතුමිට වැදගත් නැතත්, යසෝදට ඒවා වැදගත්.

නිහඬ ව හිටපු ඇයගේ හිතට සිතුවිලි රාශියක් ගලා ගෙන ගලා ගෙන ආවා. කියන්න බැරිවෙච්ච දේවල් කටින් පනින්න ලෑස්ති වෙනවා. ගහ උඩ කාටවත් ඇගේ හිත පේන්නෙ නැහැ. ගහ යට අයට ඇව තේරුම් ගන්න බැහැ. අනෙක් අයට කොහොම වුණත් යසෝදාට මේ තාප්පේ පේන්නේ යකෙක් වගේ. තාප්පේ නිසා පාඩු වෙන්නෙ අපේ ගෙදර අයට. අපේ අම්ම කොහොම ද කම්බි වැටෙන් එහා ඉඳන් ඉස්කෝලේ ළමයින්ට පලතුරු විකුණන්නෙ? කකුල් පණ නැති අයියලා තුන් දෙනෙක් ගේ ඇතුළෙ තනි කරලා, යසෝදා දෙපයින් පාසල් එවන්න, අම්මා විදින දුක, ඇයගේ පුංචි හිතට හොඳට දැනෙනවා.



යසෝදා ඉස්කෝලෙන් ගෙදර ගියාම, අම්මා ගමේ ඇවිදින්න යනවා, ලාබෙට පලතුරු හොයා ගෙන එන්න. පලතුරු වට්ටිය මැද්දට යසෝදගේ හිත වැටුණා, ලබන වාරෙ ඉඳන් කොහොම ද අපි ජීවත් වෙන්නේ. ගෙදර ගිහින් ඉස්කෝලෙ තාප්පෙ ගැන යසෝදා මොනවා කතා කළත්, අම්මා කිසි ම දවසක උත්තරයක් දුන්නෙ නැහැ.

යාළුවො පන්තියට යන්න සූදානම්. ඒත් යසෝදගේ හිත සියඹලා ගහ උඩින්, පැනල කොහෙද ගිහින්.


"ආයුබෝවන්" සුබා ගුරුතුමියගේ හඬට යසෝදගේ හිත පන්තියට ආවා. වේගයෙන් පන්තියට දුව ගෙන ගිහින් යසෝදා පොත් බෑගය අරන් පන්තියෙන් එළියට දිව්වා. යසෝදාගෙ යාළුවොත් දුවගෙන ආවා යසෝදට වුණේ මොකද්ද බලන්න. සුබා ගුරුතුමිය අනෙක් පන්තියට යන්න පඩිපෙළ බහිනවා. යසෝදා දුව ගෙන ගිහින් එතුමියගේ දෙපා අල්ලලා ගුරුතුමියට දණ ගහලා වැන්දා,

"ඉස්කෝලේ තාප්පේ හැදුණම අපේ අම්මට රස්සාව නැති වෙනවා. ඒ හින්දා මං ආයේ ඉස්කෝලේ එන්නේ නැහැ."

ගුරුතුමී දැන ගෙන හිටිය, යසෝදගේ අම්මා ගැන.

"යසෝදා, කොහොමද? හෙට ඉඳන් සියඹලා මල් කන්නෙ"


සියඹලා ගහ දිහා උඩ බලපු යසෝදට පුංචි සතුටක් දැනුණා.



"ඇයි මිස් තාප්පෙන් එහා පාර පැත්තට වැටෙන අර අත්තේ සියඹලා මල්"

යසෝදා ඇඟිල්ල දික් කරල ගුරුතුමීට පෙන්නුවා. ලොකු දිනුමක් වාගේ යසෝදා හිනා වුණා. සුබා ගුරුතුමිය ඇඬුවා හදවතින් ම. යසෝදාගෙ යාළුවො දුව ගෙන ඇවිත් යසෝදව බදා ගත්තා.

ඔයා දිගට ම ඉස්කෝලෙ එන්න ඕනෙ යසෝ. අපි විසඳුමක් හොයමු නේ ද සුබා මිස්? කියලා නිපුනි බොහොම උනන්දුවෙන් කිව්වා. එතකොට ම සමන්ත ගෙනාපු යෝජනාවෙන් හැමෝ ම පුදුම වුණා.



සුබා මිස් අපි විදුහල්පතිතුමාට කියමු යසෝදගෙ අම්මට ඉස්කෝලෙ ඇතුළට ඇවිත් පලතුරු විකුණන්න අවසර දෙන්න කියලා. එතකොට යසෝදට පුළුවන් විවේක වෙලාවෙ දී අම්මට උදව් කරන්නත්.

ඔව්, අපි ලොකු සර්ට කියලා බලමු. සර් අකමැති වෙන එකක් නෑ කියලා සුබා ගුරුතුමිය කියද්දි ම විදුහල්පතිතුමා එතනට ඇවිත්.

මොකද මේ ළමයි මෙතන කරන්නේ? විදුහල්පතිතුමා ඇහුවා. සුබා ගුරුතුමිය දරුවො වෙනුවෙන් යසෝදගෙ ගැටලුව ඉදිරිපත් කළා. ටික වෙලාවක් කල්පනා කරපු විදුහල්පතිතුමා යසෝදගෙ ඔළුව අත ගාලා මෙහෙම කිව්වා.

''හොඳයි අපි යසෝදගෙ අම්මට පාසල ඇතුළෙ පලතුරු විකුණන්න අවස්ථාව දෙමු. යසෝදට ඉගෙන ගන්න පාසල් සංවර්ධන සමිතිය මගිනුත් උදව් ගන්න පුළුවන් වෙයි. හෙට යසෝදා, අම්මා එක්ක ඇවිත් මාව හමුවෙන්නකෝ. මොන දේ වුණත් යසෝදා හොඳින් මහන්සි වෙලා දිගට ම ඉගෙන ගන්න ඕනෙ.''

කියලා විදුහල්පතිතුමා කිව්වා.

යසෝදටත් යාළුවන්ටත් සුබා ගුරුතුමියටත් හරි ම සතුටු යි. යාළුවෝ සේරම යසෝදා වට කර ගෙන අත් අල්ලන් පන්තියට ගියා.

''මම හැමදා ම ඉස්කෝලෙ ඇවිත් හොඳට ඉගෙන ගන්නවා.''

යසෝදා ගහ උඩ ඉන්න ලේන් යාළුවන්ටත් ඇහෙන්න කෑ ගහලා කිව්වා.

සියඹලා මල් බලා ගෙන හිටියා, සුළඟ හමන තුරු, උපන් ගහට සමුදෙන්න.

## ● මෙම කතාවෙන් ඉස්මතු වන කුසලතා

- සන්නිවේදනය (Communication)
- ස්වයං දැනුවත්භාවය (Self Awareness)
- ඇහුම්කන් දීම (Listening)
- සහකම්පනය (Empathy)
- විශ්ලේෂණ කුසලතා (Analytical Skills)
- තීරණ ගැනීම (Decision Making)

## ● මෙම කතාවෙන් ඉස්මතු වන කුසලතා

1. මේ කතාව පිළිබඳ පවුලේ අය සමග සාකච්ඡා කරන්න.
2. යසෝදාගේ ක්‍රියා කලාපය පිළිබඳ ඔබේ අදහස් පන්තියට ඉදිරිපත් කරන්න.
3. යසෝදා ඔබගේ මිතුරියක් නම් ඇය වෙනුවෙන් ඔබට කළ හැකි දේ පන්තියට ඉදිරිපත් කරන්න.
4. ආර්ථික දුෂ්කරතා සහ වෙනත් අපහසුතා ඉදිරියේ ජීවිතය ජය ගත් මිනිසුන් පිළිබඳ කියවා ඔබට ලබා ගත හැකි ආදර්ශ සටහනක් සකසා එය පන්තියට ඉදිරිපත් කරන්න.
5. ඔබ යසෝදා නම් ඔබ මෙම ගැටලුවට ප්‍රතිචාර දක්වන ආකාරය පිළිබඳ අදහස් ඉදිරිපත් කරන්න.

## දිවිය දිනන කතා
### ඇගයීම් පත්‍රිකා ආකෘතිය

කතාවේ නම.................................................. දිනය..........................

| අනු අංකය | ඇගයීම් නිර්ණායක / නම | නිවැරදි උච්චාරණයෙන් යුතු ව කියවයි. | කතාව ආශ්‍රයෙන් අසන ප්‍රශ්නවලට පිළිතුරු සපයයි. | හුවමාරු කුසලතා හඳුනා ගෙන ප්‍රකාශ කරයි. | මනා නිමාවකින් යුතු ව නියමිත වේලාවට ක්‍රියාකාරකම් සිදු කර ඉදිරිපත් කරයි. | හුවමාරු කුසලතා ජීවිතයට බද්ධ කර ගනිමින් කටයුතු කරන බව ප්‍රදර්ශනය කරයි. | මුළු ලකුණු |
|---|---|---|---|---|---|---|---|
| | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |

### ලකුණු දීමේ නිර්ණායක සඳහා ප්‍රමිති

| ඇගයීම් නිර්ණායක | ලකුණු 20යි (ඉතා හොඳයි) | ලකුණු 15යි (හොඳයි) | ලකුණු 10යි (සතුටුදායකයි) | ලකුණු 05යි (සාමාන්‍යයයි) | ලකුණු 03යි (සංවර්ධනය විය යුතුයි) |
|---|---|---|---|---|---|
| නිවැරදි උච්චාරණයෙන් යුතු ව කියවයි. | වැරදීමට හැකි උපරිම වචන සංඛ්‍යාව 5කි. | වැරදීමට හැකි උපරිම වචන සංඛ්‍යාව 10කි. | වැරදීමට හැකි උපරිම වචන සංඛ්‍යාව 15කි. | වැරදීමට හැකි උපරිම වචන සංඛ්‍යාව 20කි. | වැරදීමට හැකි උපරිම වචන සංඛ්‍යාව 25ට වැඩි නම් |
| කතාව ආශ්‍රයෙන් අසන ප්‍රශ්නවලට පිළිතුරු සපයයි. | අසන ලද ප්‍රශ්න පහට ම නිවැරදි පිළිතුරු සපයයි. | අසන ලද ප්‍රශ්න පහෙන් හතරකට නිවැරදි පිළිතුරු සපයයි. | අසන ලද ප්‍රශ්න පහෙන් තුනකට නිවැරදි පිළිතුරු සපයයි. | අසන ලද ප්‍රශ්න පහෙන් දෙකකට නිවැරදි පිළිතුරු සපයයි. | අසන ලද ප්‍රශ්න පහෙන් එකකට නිවැරදි පිළිතුරු සපයයි. |
| හුවමාරු කුසලතා හඳුනා ගෙන ප්‍රකාශ කරයි. | කතාව ඇසුරෙන් හුවමාරු කුසලතා පහක් ප්‍රකාශ කරයි. | කතාව ඇසුරෙන් හුවමාරු කුසලතා හතරක් ප්‍රකාශ කරයි. | කතාව ඇසුරෙන් හුවමාරු කුසලතා තුනක් ප්‍රකාශ කරයි. | කතාව ඇසුරෙන් හුවමාරු කුසලතා දෙකක් ප්‍රකාශ කරයි. | කතාව ඇසුරෙන් හුවමාරු කුසලතා එකක් ප්‍රකාශ කරයි. |
| මනා නිමාවකින් යුතු ව නියමිත වේලාවට ක්‍රියාකාරකම් සිදු කර ඉදිරිපත් කරයි. | ක්‍රියාකාරකම් පහක් සම්පූර්ණ කරයි. | ක්‍රියාකාරකම් හතරක් සම්පූර්ණ කරයි. | ක්‍රියාකාරකම් තුනක් සම්පූර්ණ කරයි. | ක්‍රියාකාරකම් දෙකක් සම්පූර්ණ කරයි. | ක්‍රියාකාරකම් එකක් සම්පූර්ණ කරයි. |
| හුවමාරු කුසලතා ජීවිතයට බද්ධ කර ගනිමින් කටයුතු කරන බව ප්‍රදර්ශනය කරයි. | හුවමාරු කුසලතා පහකට වැඩි ප්‍රමාණයක් හැසිරීමේ දී ප්‍රදර්ශනය කරයි. | හුවමාරු කුසලතා හතරකට වැඩි ප්‍රමාණයක් හැසිරීමේ දී ප්‍රදර්ශනය කරයි. | හුවමාරු කුසලතා තුනකට වැඩි ප්‍රමාණයක් හැසිරීමේ දී ප්‍රදර්ශනය කරයි. | හුවමාරු කුසලතා දෙකකට වැඩි ප්‍රමාණයක් හැසිරීමේ දී ප්‍රදර්ශනය කරයි. | හුවමාරු කුසලතා එකකට වැඩි ප්‍රමාණයක් හැසිරීමේ දී ප්‍රදර්ශනය කරයි. |

- ශිෂ්‍යයා වඩාත් කැමැති නිර්මාණයක් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
  කතාවක් නිර්මාණය කිරීම/නාට්‍ය පිටපතක් නිර්මාණය කිරීම/නාට්‍යයක් රඟ දැක්වීම/වීඩියෝ පටයක් නිර්මාණය කිරීම/පුවත්පතකට ලිපියක් සකස් කර පළ කිරීම/ගීතයක් නිර්මාණය කිරීම/ කවි පන්තියක් නිර්මාණය කිරීම

ලකුණු 100යි.



# 2 අකුරු

"අම්මේ මෙන්න පබසර ඇවිල්ලා..." ඉඳුවර උද්දාමයෙන් කෑගැහුවා.

"ඉඳුවර ඔයා ඊයෙ රචනා තරගෙකින් දිනල, තෑගි උත්සවේකට ගියාලු නේ ද? අසනීප වෙච්ච හින්ද මට ඉස්කෝලෙ එන්නත් බැරිවුණා නේ. මං දන්නෙ ඊයෙ හවස. මට හරි ම සතුටු යි. මං ඒකමයි ඔයා බලන්න ආවෙ. නැත්තං සඳුද නෙ ආයි අපි හම්බවෙන්නෙ." පබසර ඉඳුවරගේ අත් දෙකෙන් ම අල්ලා ගත්තේ බොහොම සතුටෙන් හිනා වෙන ගමන්.

"අනේ... කොච්චර දෙයක් ද ආපු එක ?  එන්න වාඩිවෙන්නකෝ.." ඉඳුවර, පබසර ගේ ඇතුළට එක්ක ගෙන ආවා.

"ඔයා ඔහොම ඉඳ ගෙන ඉන්නකො පබසර. මං අරං එන්නම්කො මට හම්බවුණ තෑගි ටික ඔයාට පෙන්නන්න. "

ගේ ඇතුළට ගිය ඉඳුවර, පොත් මිටියකුයි කුසලානයකුයි අරං ආවා.

"හරි ම ලස්සනයි නෙ... " පබසර එකපාරට ම කුසලානෙ අතට අරං ඒකෙ හැඩ බලන්න පටන් ගත්තා.

"මේ බලන්නකො කුසලානෙ ඔයාගේ නමත් රත්තරන් පාටින් ලියලා තියෙනවා. අපේ ඉස්කෝලෙ නම විතරක් නෙමේ අපේ පන්තියෙ නමත් තියෙනව නේ. මේ කුසලානෙ පැනක හැඩේට හදල තියෙන්නෙ. යටින් පොතක්. පොතක් උඩ පෑනක්. "

"මේ දැන් ම කියවල ම බලන්නකො. මගෙ දිනපු රචනාව පොතකට දාල තිබුණා. ඒ විතරක් නෙවේ. ලස්සන කතන්දර පොත් මිටියකුත් හම්බවුණා නේ. මේ බලන්නකො."ඉඳුවර කතන්දර පොත් එක එක අතට අරන් පබසර අතට දුන්නා.

"මේ තියෙන්නෙ පොත්... මඩොල් දූව, වනගත ළමෝ, දිරිය දරුවෝ, අඹ යහළුවෝ, කල්ලන්දූවේ මුතු කොල්ලය. තව ගොඩක් තියෙන්නෙ. පොත් මල්ලක්."පබසර ඒ පොත්වල පිටු එක දෙක පෙරළන්න පටන් ගත්තා.

"මං 'වනගත ළමෝ' පොත කියවල ඉවර කළා. ළමයි ටිකක් කැලේකට ගිහිං අතරමං වෙනවා. පස්සෙ කොහොම හරි ඒ ගොල්ලො පාර හොයා ගෙන ආපහු එනවා. දිගට ම කියව ගෙන යන්න පුළුවන්, පොත බිමින් තියන්නෙ නැතුව. පබසර මේ පොත අරං යන්න. තව ඕන පොතක් අරන් යන්න. ඔයා කියවල පස්සෙ මට ගෙනත් දෙන්නකො. මට තව පොත් තියෙනවා කියවන්න. මං මේ පොත් ටික පස්සෙ යාළුවන්ටත් කියවන්න ගිහිං දෙනවා. ඒ ගොල්ලොත් මේ පොත්වලට කැමති වෙයි."

"ස්තුතියි ඉඳුවර. මං මේ පොත් ටික ඉක්මනට කියවල පරිස්සම් කරලා ගෙනත් දෙන්නම්කො."

"මෙන්න පුතේ ඊයෙ ගෙනාපු බූන්දියි, රට ඉඳියි. දෙන්නත් එක්ක කන්නකො. මං තේ හදා ගෙන එන්නං." ඉඳුවරගෙ අම්මා පබසරගෙ ඔළුව අත ගෑවා.

"කන්න පබසර, ඕවා හරි රහ යි. රචනා තරගෙ තව තෑග්ගක් විදියට රුපියල් දහදාහක සල්ලි හම්බ වුණා නේ. නංගිලටයි මල්ලිටයි කෑම ජාතිත් අරං ආවා, ඒ සල්ලවලින්. ලොකු උත්සවයක් තිබ්බා. මට තෑගි දෙන්ඩ නම කතා කරද්දි බෙර එහෙමත් ගැහුවා. කොළඹ බණ්ඩාරනායක සම්මන්ත්‍රණ ශාලාවෙ තමා උත්සවේ තිබ්බෙ. අකුරු ලියලා මෙච්චර දේවල් හම්බෙනවා කියල මං දැන ගත්තෙ එදා නෙ" ඉඳුවර හිනා වුණා.

"කොහොම ද ඉඳුවර පාරවල් එහෙම හොයා ගත්තේ. මං නම් කොළඹ ගිහිං නෑ නේ වැඩිය." පබසර රතුපාට බූන්දි කෑල්ලක් හපන ගමන් ඇහුවා.

"මාත් කොළඹ ගියේ දෙවෙනි පාර. මායි අම්මයි ගියේ. එහෙන් එවපු ලියුම එක්ක සම්මන්ත්‍රණ ශාලාවට එන විදිය ඇඳල එවල තිබුණා. අම්මයි මායි පාන්දර කොළඹට යන බස් එකේ ගියේ. තව එහෙ පොලිසියෙ මහත්තුරු ඉන්නව නේ. එයාලගෙනුත් පාර හරියට ම අහගෙන ගියා. එතකොට බයක් නෑ නේ. සිංහල මිසුත් යන විදිය කියලා දුන්නා"

අම්මා ගෙනාපු තේ බන්දේසියෙන් උණු තේ එකක් ඉඳුවර ඉක්මනට පබසර අතට දුන්නා.

"ඉඳුවර ඔයා මේ රචනාව හරි ලස්සනට ලියල තියෙනවා නේ. පොත් කියවීමේ වටිනාකම ගැන ගොඩක් දේවල් මේ රචනාවෙන් දැන ගන්න පුළුවන් නේ. සිංහල මිස් කියන විදියට ම උපමා, පිරුළු එහෙම දාලා ලියල තියෙනව ගැළපෙන තැන්වලට ම. කියවන්නත් ආස හිතෙනවා. ඒ වගේ ද මේ පොතෙත් තියෙනව නෙ දැන්. අනික අත් අකුරුත් නෙවෙයි. අපේ අච්චු පොත්වල තියෙන අකුරුවලින්. අකුරු ගිහිං තියෙන දුර. මටත් ලියන්න ආසා හිතුණා."

"මං කියන්න හැදුවා විතර යි. ඔයත් ලියන්න ඕනම යි. සමහර වෙලාවට ඔය පත්තරවල එහෙම තියෙනවා රචනා තරගවල විස්තර. මාත් පුස්තකාලේ දී පත්තරේකින් දැක්කෙ මේ තරගෙ ගැන. මං දැක්කෙ ටිකක් පහුවෙලා නේ. ඒ හින්ද ටිකක් ඉක්මනට ලියල තැපැල් කරන්න වුණා."

"මාතෘකාව, ලියන්න ඕන වචන ප්‍රමාණෙ එහෙම ගැන විස්තර තියෙනව ද ඒකෙ?"

"ඔව්. ඔව්. ඒ දැන්වීම්වල තියෙනව ඔක්කොම විස්තර. ඒ කියන විදිහට ලියල ඒකෙ කියල තියෙන ලිපිනයට තැපැල් කරා ම හරි. ලොකු සල්ලියක් යන වැඩක් නෙවේ නේ. රචනාවට ඕන කරුණු අපිට පුස්තකාලෙන් හොයා ගන්න පුළුවන්. සිංහල මිසුත් අපට උදව් කරනව නේ. ඊළඟ පාර අපි දෙන්න ම තරගෙට දාමු." ඉඳුවර කිව්වෙ පිඟානේ අන්තිම රටඉඳි ගෙඩිය පබසරගේ අතේ තියන ගමන්.

"ඉතිං ඉඳුවර අපි මහන්සි වෙලා ලියලා යැවුවට, දිනුවෙ නැත්නම් වැඩක් නෑනේ." පබසර කිව්වෙ හිනා වෙන ගමන්.

"අයියෝ එහෙම හිතන්න එපා. අපි ඉස්සෙල්ලා ඉදිරිපත් වෙලා බලමුකෝ. රචනා ලියන්න ලියන්න අපිට හොඳට ලියන්න පුළුවන් වෙනව කියල එදා උත්සවේදිත් කිවුවා. කලින් ම දන්නෙ කොහොම ද අපි දිනයි ද පරදියි ද කියල? අපි ඉස්කෝලෙදිත් රචනා ලියනව නේ. ඇයි විභාගෙදිත් රචනා ලියන්නේ. පිටපත් ලිවීම් ලියන්නේ. ඒ වගේ හිතලා මේ තරගවලටත් දිගට ම ලියමුකෝ." ඉඳුවර පබසරගෙ අත අල්ල ගත්තා.

"හරි එහෙනම් අපි දෙන්න ම ලියමු." එහෙම කිවුවෙ පබසර.

"ඔව් පබසර අපි දෙන්නත් ලියමු. ඒ වගේ ම පන්තියෙ ඔක්කොමත් එක්ක ලස්සන අකුරුවලින් රචනා ලියමු." ඉඳුවර පබසර දිහා බලා ගෙන කිවුවා.



## • මෙම කතාවෙන් ඉස්මතු වන කුසලතා

- ලිවීම (Writing)
- නිර්මාණශීලීත්වය (Creativity)
- අලුත් දෙයක් ඉගෙන ගැනීම (Learn Something New)
- අන්‍යයන්ට උපකාර කිරීම (Helping Others)

## • ක්‍රියාකාරකම්

1. මෙම කතාව පන්තියේ මිතුරන් සමග සාකච්ඡා කරන්න.
2. මෙම කතාව පවුලේ අයට කියන්න.
3. පවුලේ අයගේ අදහස් සටහන් කර ගන්න.
4. පන්තියේ ශිෂ්‍යයන් කණ්ඩායම් දෙකකට බෙදී රචනා ලිවීමට සුදුසු මාතෘකා සකස් කොට ලයිස්තුගත කර පන්තියේ ප්‍රදර්ශනය කරන්න.
5. එම මාතෘකාවලින් එකක් තෝරා ගෙන රචනාවක් ලියන්න.
6. එම මාතෘකාවලින් එකක් තෝරා ගෙන කවි පන්තියක් නිර්මාණය කරන්න.

## දිවිය දිනන කතා
### ඇගයීම් පත්‍රිකා ආකෘතිය

කතාවේ නම.................................................. දිනය..........................

| අනු අංකය | ඇගයීම් නිර්ණායක / නම | නිවැරදි උච්චාරණයෙන් යුතු ව කියවයි. | කතාව ආශ්‍රයෙන් අසන ප්‍රශ්නවලට පිළිතුරු සපයයි. | හුවමාරු කුසලතා හඳුනා ගෙන ප්‍රකාශ කරයි. | මනා නිමාවකින් යුතු ව නියමිත වේලාවට ක්‍රියාකාරකම් සිදු කර ඉදිරිපත් කරයි. | හුවමාරු කුසලතා ජීවිතයට බද්ධ කර ගනිමින් කටයුතු කරන බව ප්‍රදර්ශනය කරයි. | මුළු ලකුණු |
|---|---|---|---|---|---|---|---|
| | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |

### ලකුණු දීමේ නිර්ණායක සඳහා ප්‍රමිති

| ඇගයීම් නිර්ණායක | ලකුණු 20යි (ඉතා හොඳයි) | ලකුණු 15යි (හොඳයි) | ලකුණු 10යි (සතුටුදායකයි) | ලකුණු 05යි (සාමාන්‍යයි) | ලකුණු 03යි (සංවර්ධනය විය යුතුයි) |
|---|---|---|---|---|---|
| නිවැරදි උච්චාරණයෙන් යුතු ව කියවයි. | වැරදීමට හැකි උපරිම වචන සංඛ්‍යාව 5කි. | වැරදීමට හැකි උපරිම වචන සංඛ්‍යාව 10කි. | වැරදීමට හැකි උපරිම වචන සංඛ්‍යාව 15කි. | වැරදීමට හැකි උපරිම වචන සංඛ්‍යාව 20කි. | වැරදීමට හැකි උපරිම වචන සංඛ්‍යාව 25ට වැඩි නම් |
| කතාව ආශ්‍රයෙන් අසන ප්‍රශ්නවලට පිළිතුරු සපයයි. | අසන ලද ප්‍රශ්න පහට ම නිවැරදි පිළිතුරු සපයයි. | අසන ලද ප්‍රශ්න පහෙන් හතරකට නිවැරදි පිළිතුරු සපයයි. | අසන ලද ප්‍රශ්න පහෙන් තුනකට නිවැරදි පිළිතුරු සපයයි. | අසන ලද ප්‍රශ්න පහෙන් දෙකකට නිවැරදි පිළිතුරු සපයයි. | අසන ලද ප්‍රශ්න පහෙන් එකකට නිවැරදි පිළිතුරු සපයයි. |
| හුවමාරු කුසලතා හඳුනා ගෙන ප්‍රකාශ කරයි. | කතාව ඇසුරෙන් හුවමාරු කුසලතා පහක් ප්‍රකාශ කරයි. | කතාව ඇසුරෙන් හුවමාරු කුසලතා හතරක් ප්‍රකාශ කරයි. | කතාව ඇසුරෙන් හුවමාරු කුසලතා තුනක් ප්‍රකාශ කරයි. | කතාව ඇසුරෙන් හුවමාරු කුසලතා දෙකක් ප්‍රකාශ කරයි. | කතාව ඇසුරෙන් හුවමාරු කුසලතා එකක් ප්‍රකාශ කරයි. |
| මනා නිමාවකින් යුතු ව නියමිත වේලාවට ක්‍රියාකාරකම් සිදු කර ඉදිරිපත් කරයි. | ක්‍රියාකාරකම් පහක් සම්පූර්ණ කරයි. | ක්‍රියාකාරකම් හතරක් සම්පූර්ණ කරයි. | ක්‍රියාකාරකම් තුනක් සම්පූර්ණ කරයි. | ක්‍රියාකාරකම් දෙකක් සම්පූර්ණ කරයි. | ක්‍රියාකාරකම් එකක් සම්පූර්ණ කරයි. |
| හුවමාරු කුසලතා ජීවිතයට බද්ධ කර ගනිමින් කටයුතු කරන බව ප්‍රදර්ශනය කරයි. | හුවමාරු කුසලතා පහකට වැඩි ප්‍රමාණයක් හැසිරීමේ දී ප්‍රදර්ශනය කරයි. | හුවමාරු කුසලතා හතරකට වැඩි ප්‍රමාණයක් හැසිරීමේ දී ප්‍රදර්ශනය කරයි. | හුවමාරු කුසලතා තුනකට වැඩි ප්‍රමාණයක් හැසිරීමේ දී ප්‍රදර්ශනය කරයි. | හුවමාරු කුසලතා දෙකකට වැඩි ප්‍රමාණයක් හැසිරීමේ දී ප්‍රදර්ශනය කරයි. | හුවමාරු කුසලතා එකකට වැඩි ප්‍රමාණයක් හැසිරීමේ දී ප්‍රදර්ශනය කරයි. |

- ශිෂ්‍යයා වඩාත් කැමැති නිර්මාණයක් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
  කතාවක් නිර්මාණය කිරීම/නාට්‍ය පිටපතක් නිර්මාණය කිරීම/නාට්‍යයක් රඟ දැක්වීම/වීඩියෝ පටයක් නිර්මාණය කිරීම/පුවත්පතකට ලිපියක් සකස් කර පළ කිරීම/ගීතයක් නිර්මාණය කිරීම/ කවි පන්තියක් නිර්මාණය කිරීම
  ලකුණු 100යි.




# 3 උදාරගේ හපන්කම්

උදාරගේ ගෙදර තිබුණේ ලොකු වත්තක් මැද. ගේ වටේට ම ලොකු මිදුලක් තියෙනවා. වත්ත ගස්වැල්වලින් පිරිලා. මිදුල වටේට මත් ගස්කොළන්. හරි ම සිසිල් පරිසරයක්. ගහකොළ අතරින් එන සිසිල් සුළං ගතට සිතට හරි ම සුවදායක යි. ගේ ඇතුළෙත් උණුසුමක් නැති තරම්. ගස්වල ඉගිලෙන කුරුල්ලන්ගේ නාදය හරි ම මිහිරි යි. ඉදෙන පලතුරු කන ලේන්නු වගේ ම උන්ගේ නාදයත් නිතර අහන්න පුළුවන්. උදේ ම අව්දි වන විට ගස් අතරින් එන හිරු එළිය හරි ම සුවදායක යි.

ඒත් උදාරලාට එක ගැටලුවක් තිබුණා. හැම දවසක ම ගස්වැල්වලින් වැටෙන මහා කොළ ගොඩක් මිදුල පුරා විසිරෙනවා. ඒවයින් මුළු මිදුල ම හැඩි වෙනවා. අම්මා තම යි හැමදා ම වගේ මිදුල අතු ගාන්නේ. නිවාඩු දවස්වලට තාත්තා අතු ගානවා. උදාර පාසල් යන නිසා උදාරට මිදුල අතු ගාන්න උදව් වෙන්න වෙලාවක් නැහැ. පැය එකහමාරක් විතර යනවා මිදුල අතු ගාන්න. අම්මා ගැන උදාරට හරි ම දුක යි.

උදාර දවස් ගාණක් කල්පනා කළා අම්මාට උදව් වෙන විදියක් ගැන. උදාරට හිතුණා කොළ ඇහිඳින විදියෙ යන්ත්‍රයක් නිර්මාණය කරන්න. ඒත් කොහොම ද ඒක හදන්නෙ? උදාර මේ ගැන නිතර කල්පනා කළා. පාසල් පුස්තකාලේ තියෙන නව නිපැයුම් පිළිබඳ පොතපත සඟරා හෙවුවා. හොයා ගෙන කියෙවුවා. තාත්තාගේ උදව් ඇතිව අන්තර්ජාලයේත් මේ ගැන තොරතුරු හෙවුවා.

අන්තිමට උදාරට පොඩි අදහසක් ආවා මිදුලට වැටෙන කොළ ඇහිඳින විදියේ යන්ත්‍රයක් හදන්න. උදාර ඒකට දළ සැලැස්මක් ඇන්දා.



පහසුවෙන් හැසිරවිය හැකි
අත් දණ්ඩක්

කොළ ඇදගන්නා කොටසක්

තල්ලු කර ගෙන යන්න පහසු
වෙන්න රෝද

උදාරගේ සැලැස්මේ කොටස්. කොළ ඇතුළට ඇද ගන්න වැකියුම් යන්ත්‍රයකුත් ඇතුළත් කළා.

යන්ත්‍රයට ඇද ගන්නා කොළ එකතු කර ගන්නේ කොහොම ද? ඒකටත් විසඳුමක් උදාර සොයා ගත්තා. ලොකු කවර දෙකක් දෙපැත්තෙන් සවිකරන්න.

උදාර තාත්තාට මේ සැලැස්ම පෙන්නුවා. තාත්තා සැලැස්ම හොඳින් අධ්‍යයනය කළා. උදාරව දිරිමත් කළා.

''කොහොමද පුතේ මේ යන්ත්‍රයට බලය සපයන්නෙ?''

තාත්තා ප්‍රශ්නයක් නැගුවා. උදාරට එතකොට යි ඒ ගැන කල්පනා වුණේ.

''අපිට බැරි ද පුතේ මේකට සූර්ය බලය යොදා ගන්න?''

තාත්තා යෝජනාවක් ඉදිරිපත් කළා.


''කොහොම ද තාත්තේ අපි සූර්ය බලය යොදා ගන්නේ?''

උදාර තාත්තාගෙන් ඇහුවේ ටිකක් දුර්මුඛ විලාසයෙන්. තාත්තා අන්තර්ජාලය පරීක්ෂා කරලා ඒ ගැන විස්තර හොයලා දුන්නා.

උදාරට හරි ම සතුටු යි. දැන් සැලැස්ම සූදානම්. තාත්තා අවශ්‍ය උපකරණ ආදිය සපයා දුන්නා. ගෙදර තිබුණු කැඩිච්ච වැකියුම් යන්ත්‍රයක් නැවත අලුත්වැඩියා කරලා දුන්නා. සූර්ය කෝෂ හා බැටරියකුත් ගෙනත් දුන්නා. උදාර සැලැස්මේ විදියට වැඩේ පටන් ගත්තා. සමහර අවස්ථාවල දී උදාරට අතපසු වීම් එහෙමත් සිදු වුණා. කොහොම හරි සති දෙකක් විතර යන විට යන්ත්‍රය නිර්මාණය කර ගන්න හැකි වුණා.

උදාර අම්මාටත් තාත්තාටත් කතා කළා. යන්ත්‍රය ක්‍රියාත්මක කළා. උදාරගේ නිර්මාණය සාර්ථක යි. ඒ තරම් මහන්සියක් නැතිව මිදුල පිරිසිදු කර ගන්න පුළුවන්. කාලයත් ඉතිරි යි. අම්මයි තාත්තයි දෙන්නා උදාරට නො සෑහෙන්න ප්‍රශංසා කළා.

තාත්තා උදාරත් එක්ක තවත් වැඩක් කළා. දිනපතා එකතු වෙන කොළ රොඩු දාන්න කොම්පෝස්ට් කොටු කිහිපයක් සකස් කළා.



දැන් අම්මා වැඩි වෙහෙසක් නැති ව මිදුල පිරිසිදු කරනවා. ඒ තරම් කාලයක් යන්නෙත් නැහැ. කොළ රොඩුවලින් කොම්පෝස්ට් කොටු පිරෙනවා. ඒකෙන් ගෙවත්තට අවශ්‍ය පෝරත් ලැබෙනවා. දැන් උදාර කල්පනා කරමින් ඉන්නෙ මේ යන්ත්‍රය එක තැනක ඉඳන් ක්‍රියාත්මක කරන්න පුළුවන් විදියට හදන්න. ඒකට දුරස්ථ පාලකයක් යොදා ගන්න විදිය ගැන උදාර මේ දවස්වල තොරතුරු එකතු කරමින් ඉන්නවා.

## ● මෙම කතාවෙන් ඉස්මතු වන කුසලතා

- අභිප්‍රේරණය (පෙලඹ වීම) හා උද්යෝගය (Motivation and Enthusiasm)
- ගැටලු විසඳීම (Problem Solving)
- ස්වයං දැනුවත් භාවය (Self Awareness)
- නිර්මාණශීලීත්වය හා නවෝත්පාදනය (Creativity and Innovation)
- තාක්ෂණ හැකියාව (Technical skills)
- ගෝලීය දැනුවත් භාවය (Global Awareness)
- අලුත් දෙයක් ඉගෙන ගන්න (Learn Something New)
- ඵලදායීතාව (Productivity)

## ● ක්‍රියාකාරකම්

1. මේ කතාව පිළිබඳ මිතුරන් සමග සාකච්ඡා කරන්න. එහි දී උදාර සතු කුසලතා සහ එම කුසලතා ඉස්මතු වන අවස්ථාව කතාවෙන් සොයා ලියන්න.

| කුසලතා | අවස්ථාව |
|---|---|
| | |

2. උදාර මෙන් ඔබට, ඔබේ පවුලේ අයට උදව් කළ හැකි ආකාර පිළිබඳ සිතන්න. ඔබ ජීවත් වන ප්‍රදේශයේ ගැටලු සහ අවශ්‍යතා අනුව ඔබට සරල ව උදව් කළ හැකි ආකාර පිළිබඳ ලයිස්තුවක් සකස් කරන්න.

| උදාර කළ දේවල් | මා කරන දේවල් | මට කළ හැකි දේවල් |
|---|---|---|
| | | |

3. ඔබට ඔබේ පවුලේ අයට උදව් කළ හැකි එක් ක්‍රමයක් තෝරා ගන්න. ඒ ක්‍රමය ක්‍රියාත්මක කරන්න. ඒ සඳහා ඔබේ මිතුරන්ගේ සහ වැඩිහිටියන්ගේ උදව් ද ලබා ගන්න. එය ක්‍රියාත්මක කළ ආකාරය පන්තියට ඉදිරිපත් කරන්න.
4. නව නිර්මාණ පිළිබඳ ලියවී ඇති ලිපි ලේඛන කියවන්න. අන්තර්ජාලය ද පරිශීලනය කරන්න.

   නිදසුන් - https://www.thebetterindia.com/11596/ignite-innovations/
5. පාසලේ නව නිපැයුම් සංගමයට එකතු වන්න. සැම විට ම අලුත් යමක් නිර්මාණය කිරීමට උත්සාහ ගන්න.
6. ඔබ කියවා සොයා ගත් කරුණු ඔබේ මිතුරන් සමග බෙදා ගන්න.

## දිවිය දිනන කතා
## ඇගයීම් පත්‍රිකා ආකෘතිය

කතාවේ නම.................................................. දිනය.........................

| අනු අංකය | ඇගයීම් නිර්ණායක / නම | නිවැරදි උච්චාරණයෙන් යුතු ව කියවයි. | කතාව ආශ්‍රයෙන් අසන ප්‍රශ්නවලට පිළිතුරු සපයයි. | හුවමාරු කුසලතා හඳුනා ගෙන ප්‍රකාශ කරයි. | මනා නිමාවකින් යුතු ව නියමිත වේලාවට ක්‍රියාකාරකම් සිදු කර ඉදිරිපත් කරයි. | හුවමාරු කුසලතා ජීවිතයට බද්ධ කර ගනිමින් කටයුතු කරන බව ප්‍රදර්ශනය කරයි. | මුළු ලකුණු |
|---|---|---|---|---|---|---|---|
| | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |

### ලකුණු දීමේ නිර්ණායක සඳහා ප්‍රමිති

| ඇගයීම් නිර්ණායක | ලකුණු 20යි (ඉතා හොඳයි) | ලකුණු 15යි (හොඳයි) | ලකුණු 10යි (සතුටුදායකයි) | ලකුණු 05යි (සාමාන්‍යයයි) | ලකුණු 03යි (සංවර්ධනය විය යුතුයි) |
|---|---|---|---|---|---|
| නිවැරදි උච්චාරණයෙන් යුතු ව කියවයි. | වැරදීමට හැකි උපරිම වචන සංඛ්‍යාව 5කි. | වැරදීමට හැකි උපරිම වචන සංඛ්‍යාව 10කි. | වැරදීමට හැකි උපරිම වචන සංඛ්‍යාව 15කි. | වැරදීමට හැකි උපරිම වචන සංඛ්‍යාව 20කි. | වැරදීමට හැකි උපරිම වචන සංඛ්‍යාව 25ට වැඩි නම් |
| කතාව ආශ්‍රයෙන් අසන ප්‍රශ්නවලට පිළිතුරු සපයයි. | අසන ලද ප්‍රශ්න පහට ම නිවැරදි පිළිතුරු සපයයි. | අසන ලද ප්‍රශ්න පහෙන් හතරකට නිවැරදි පිළිතුරු සපයයි. | අසන ලද ප්‍රශ්න පහෙන් තුනකට නිවැරදි පිළිතුරු සපයයි. | අසන ලද ප්‍රශ්න පහෙන් දෙකකට නිවැරදි පිළිතුරු සපයයි. | අසන ලද ප්‍රශ්න පහෙන් එකකට නිවැරදි පිළිතුරු සපයයි. |
| හුවමාරු කුසලතා හඳුනා ගෙන ප්‍රකාශ කරයි. | කතාව ඇසුරෙන් හුවමාරු කුසලතා පහක් ප්‍රකාශ කරයි. | කතාව ඇසුරෙන් හුවමාරු කුසලතා හතරක් ප්‍රකාශ කරයි. | කතාව ඇසුරෙන් හුවමාරු කුසලතා තුනක් ප්‍රකාශ කරයි. | කතාව ඇසුරෙන් හුවමාරු කුසලතා දෙකක් ප්‍රකාශ කරයි. | කතාව ඇසුරෙන් හුවමාරු කුසලතා එකක් ප්‍රකාශ කරයි. |
| මනා නිමාවකින් යුතු ව නියමිත වේලාවට ක්‍රියාකාරකම් සිදු කර ඉදිරිපත් කරයි. | ක්‍රියාකාරකම් පහක් සම්පූර්ණ කරයි. | ක්‍රියාකාරකම් හතරක් සම්පූර්ණ කරයි. | ක්‍රියාකාරකම් තුනක් සම්පූර්ණ කරයි. | ක්‍රියාකාරකම් දෙකක් සම්පූර්ණ කරයි. | ක්‍රියාකාරකම් එකක් සම්පූර්ණ කරයි. |
| හුවමාරු කුසලතා ජීවිතයට බද්ධ කර ගනිමින් කටයුතු කරන බව ප්‍රදර්ශනය කරයි. | හුවමාරු කුසලතා පහකට වැඩි ප්‍රමාණයක් හැසිරීමේ දී ප්‍රදර්ශනය කරයි. | හුවමාරු කුසලතා හතරකට වැඩි ප්‍රමාණයක් හැසිරීමේ දී ප්‍රදර්ශනය කරයි. | හුවමාරු කුසලතා තුනකට වැඩි ප්‍රමාණයක් හැසිරීමේ දී ප්‍රදර්ශනය කරයි. | හුවමාරු කුසලතා දෙකකට වැඩි ප්‍රමාණයක් හැසිරීමේ දී ප්‍රදර්ශනය කරයි. | හුවමාරු කුසලතා එකකට වැඩි ප්‍රමාණයක් හැසිරීමේ දී ප්‍රදර්ශනය කරයි. |

- ශිෂ්‍යයා වඩාත් කැමැති නිර්මාණයක් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
  කතාවක් නිර්මාණය කිරීම/නාට්‍ය පිටපතක් නිර්මාණය කිරීම/නාට්‍යයක් රඟ දැක්වීම/වීඩියෝ පටයක් නිර්මාණය කිරීම/පුවත්පතකට ලිපියක් සකස් කර පළ කිරීම/ගීතයක් නිර්මාණය කිරීම/ කවි පන්තියක් නිර්මාණය කිරීම

ලකුණු 100යි.



# 4 අලුත් ඇසකින් අවට බලමු

අප අවට සිටින, මල් කැකුළු වැනි ශිෂ්‍යයන් දෙස බලන විට අප සිතන්නේ සියලු දෙනා සුවපහසු ජීවිත ගෙවන බව යි. ඒත් අපට නො පෙනෙන පැත්තක් ඇත. මවක තම දරුවාට සියලු සැප සම්පත් ලබා දීමට සිතන්නේ ඇය ඇයගේ ජීවිතය ගැන නො සිතා, ඇයගේ සැපසම්පත් ගැන නො සිතා, හද පත්ලෙන් නැගෙන උතුරා යන සෙනෙහස නිසා ය. නිමාලි එවැනි මවකි. ඇය තම සැමියා සමග ඉතා ම ආදරයෙන් කාලය ගත කරද්දී මල්ෂා, සිඟිති දියණිය ලැබෙයි. ඔවුන්ගේ පැල්පතේ සතුට තවත් වැඩි වෙයි. මෙලෙස සතුටින් කාලය ගෙවෙද්දී නිමාලිගේ සැමියාට සර්පයකු දෂ්ට කර මෙලොව හැර යයි. මල්ෂා යාන්තම් බහ තෝරන වයසේ සිටි දී ඔවුන්ගේ ජීවිතවලට කණකොකා හැඬුවේ ය. නිමාලිට ඇගේ නෑදෑ පිරිසගෙන් එන දෝෂාරෝපණවල කෙළවරක් නැත. සියලු දෙනා ඇය හා දරුවා කොන් කළහ. එහෙත් ඇය ඒ සියලු දේ ඉවසා ජීවිතය ජය ගන්නට වෙර දරන්නී ය. ඇය තම දියණිය ඇගේ ඇස් පේනමානේ තබා ගෙන කුලීවැඩ කරන්නී ය. ඇගේ අධිෂ්ඨානය වූයේ දියණියගේ අභිවෘද්ධිය වෙනුවෙන් කැප වීම යි.

මෙසේ තුන් වසරක් ගත වූ පසු ඇය තම දියණිය පෙර පාසලට ඇතුළත් කළා ය. ඇයගේ සතුටු කඳුළු මැද සිඟිති දියණිය පියවරක් ඉදිරියට යන්නී ය. එහි වසරක් ගත කරන මල්ෂා ගමේ පාසලට ඇතුළත් කරන ලදි. එහි දී ද තම දියණිය අඟහිඟකම් නො පෙන්වා ඉහළින් ම කටයුතු කරයි.

පාසලේ ගෙවන වසරක් පාසා සියලු දස්කම් පාන මල්ෂා ගුරු මෑණිවරුන්ගේ ද ගුරු පියවරුන්ගේ ද ආදරයට ලක් වෙයි. ඇය සියලු දෙනාගේ ආදරයට පාත්‍ර වන්නේ මවගේ දුක්බර ජීවිතයට සතුට එක්කරමිනි.



මල්ෂාටත් යමක් තේරුම් ගත හැකි වයසකි. මල්ෂාගේ අධ්‍යාපනය, පෝෂණය ගැන ඇයගේ මව සිතද්දී නො දැනීම මව වැහැරී ඇති බව මල්ෂා තේරුම් ගනියි. මල්ෂා කිසිදු අඩුපාඩුවක් නො පෙන්වා උදේට මව කවන බත් කටක් දෙකක් ආහාරය සඳහා ගෙන පාසල් ගොස් මව ගැන කල්පනා කරයි. විවේක කාලයේ යෙහෙළියන් කෑම කා ඔබ මොබ ඇවිදිමින් සතුටු සාමිචියේ යෙදෙන විට මල්ෂා ද තමන් ආහාර ගත් බව හඟවමින් වතුර ටිකක් බී කුසගින්න නිවා ගත්තා ය.

මේ වෙනස තේරුම් ගත් යෙහෙළියෝ කිහිප දෙනෙක් ඇය කෙරෙහි අවධානයෙන් සිට විමසූහ. ඇයට නො දැනීම ඇස්වල කඳුළු පිරෙයි. ඇය පවසා සිටියේ ඇයගේ මව ප්‍රමාණවත් තරම් කුසට අහරක් නොමැති ව ශරීරය කෘශ වී ඇති බව යි, මවට ටිකක් හෝ සහනයක් ලබා දීමට ඇය ද ආහාර නො ගන්නා බව යි. යෙහෙළියෝ එකතු වී මල්ෂාට ආහාර ලබා දීමටත් පොත් පත් ලබා දීමටත් උත්සුක වූහ. සමහර ළමයි බස් ගාස්තුව ඉතිරි කර ගෙන පයින් අවුත් මුදල් එකතු කළහ. ඔවුන්ගේ උපකාර ලබමින් මල්ෂා පාසලේ දක්ෂතම තරුව බවට ද පත් වූවා ය.

දිනක් මල්ෂාගේ මව පාසල් වියේ යෙහෙළියක වන පියුමිට අහම්බෙන් හමු වූවා ය. ඇයගේ දුක්බර ජීවිය ගැන අසා කම්පා වූ පියුමි නිමාලිට පිහිට වෙයි. පියුමි කාර්යාලයක ඉහළ තනතුරක් දරන නිලධාරිනියක් වූවා ය. එම කාර්යාලයේ කම්කරු රැකියාවක් ලබා දී නිමාලිට උදව් කළා ය. නිමාලිට මාසයක් අවසානයේ වැටුපක් ලැබෙන අතර එම මුදල ඇයගේ ජීවිකාව සඳහා මහත් පිටිවහලක් විය. ඇයගේ ජීවිතයට මසක් තුළ ලැබෙන මුදල ද මෙය වේ. එය ඉතා අගනේ ය. ඇය සිතන්නේ ඇයගේ දුක බලා ලැබුණු මෙම රැකියාව සුරැකිය යුතු බව යි. උදෑසන නැගිට කෑම පිළියෙල කර නිවසින් පිටවන ඇය මල්ෂාට ගුරුහරුකම් දී ආශිර්වාද කර පිටත් ව යයි. මල්ෂා ද තම මවට සෙවණැල්ලක් සේ සිටිමින් අධ්‍යාපන කටයුතු, ගෙදර දොර වැඩ ද කර රාත්‍රි ආහාරය ද සකස් කර මවට සහයෝගය දැක්වූවා ය. අවංක ව රැකියාව කරන මව සියලු දෙනාගේ ම සිත් දිනා ගත්තා ය. එහි ප්‍රතිඵලයක් ලෙස ඇයට උසස් වීම් ලැබුණි. ඇයගේ වැටුප ද තවත් වැඩි විය. ඔවුන් දෙදෙනාගේ දුක් කරදර නිමා විය.

මල්ෂා තමාට උදව් කළ යෙහෙළියන්ට ස්තුති කළා ය. ඇය, ඇයගේ දුක්බර අතීතය නිමා වූ බව ඉතා ම සතුටින් පැවසුවා ය. ඇයගේ මව ජීවත් වීමට දරන උත්සාහය සාර්ථක වූයේ ඇයගේ අවංක නිහතමානී ගුණ නිසා බව යෙහෙළියන්ට පැහැදිලි කළා ය. මල්ෂා මේ වන විට අට වන වසරේ පසු වන නව යොවුන් දැරියකි. ඇය පවසන්නේ වර්තමාන ලෝකයේ දැනුමෙන් ඉහළට යද්දී ගුණධර්ම පහළට වැටෙන බව යි. එහෙත් ඇයට උපකාර කළ යෙහෙළියන් අධ්‍යාපනය හා ගුණධර්ම දෙකින් ම පිරිපුන් බව යි. මල්ෂා වැනි ගුණධර්ම පිරි දියණියන් සමාජයට දායාද කළ අම්මා උතුම් අම්මා කෙනෙකි. එවැනි දියණියෝ රටට දැයට මහත් වූ සම්පතකි.

## • මෙම කතාවෙන් ඉස්මතු වන කුසලතා

- අභිප්‍රේරණය (පෙලඹ වීම) හා උද්‍යෝගය (Motivation and Enthusiasm)
- කණ්ඩායම් වැඩ (Teamwork)
- ගැටලු විසඳීම (Problem Solving)
- සහකම්පනය (Empathy)
- සාකච්ඡා කිරීම (Negotiation)
- වැඩ ආචාර ධර්ම (Work Ethics)
- අන් අයට උපකාර කිරීමට අත් වැල් බැඳ ගැනීම (Willingness to Help Others)

## • ක්‍රියාකාරකම්

1. මෙම කතාව පිළිබඳ පවුලේ අය සමග සාකච්ඡා කරන්න.
2. පාසලේ මිතුරන් සමග මෙම කතාව පිළිබඳ සාකච්ඡා කරන්න.
3. මෙම කතාව ඇසුරෙන් අභියෝගවලට මුහුණ දීම පිළිබඳ සාකච්ඡා කරන්න.
4. අන් අයට උදව් කිරීමේ වැදගත්කම පිළිබඳව මිතුරන් සමග සාකච්ඡා කරන්න.

   ඔවුන් සමග අද්දැකීම් හුවමාරු කර ගන්න.
5. පොදු වැඩවල දී සාමූහික ව කටයුතු කිරීමේ වැදගත්කම හා එකමුතුකමේ අගය පැහැදිලි කරමින් පන්තිය ඉදිරියේ කතාවක් ඉදිරිපත් කරන්න.

## දිවිය දිනන කතා
## ඇගයීම් පත්‍රිකා ආකෘතිය

කතාවේ නම................................................ දිනය.........................

| අනු අංකය | ඇගයීම් නිර්ණායක / නම | නිවැරදි උච්චාරණයෙන් යුතු ව කියවයි. | කතාව ආශ්‍රයෙන් අසන ප්‍රශ්නවලට පිළිතුරු සපයයි. | හුවමාරු කුසලතා හඳුනා ගෙන ප්‍රකාශ කරයි. | මනා නිමාවකින් යුතු ව නියමිත වේලාවට ක්‍රියාකාරකම් සිදු කර ඉදිරිපත් කරයි. | හුවමාරු කුසලතා ජීවිතයට බද්ධ කර ගනිමින් කටයුතු කරන බව ප්‍රදර්ශනය කරයි. | මුළු ලකුණු |
|---|---|---|---|---|---|---|---|
| | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |

### ලකුණු දීමේ නිර්ණායක සඳහා ප්‍රමිති

| ඇගයීම් නිර්ණායක | ලකුණු 20යි (ඉතා හොඳයි) | ලකුණු 15යි (හොඳයි) | ලකුණු 10යි (සතුටුදායකයි) | ලකුණු 05යි (සාමාන්‍යයයි) | ලකුණු 03යි (සංවර්ධනය විය යුතුයි) |
|---|---|---|---|---|---|
| නිවැරදි උච්චාරණයෙන් යුතු ව කියවයි. | වැරදීමට හැකි උපරිම වචන සංඛ්‍යාව 5කි. | වැරදීමට හැකි උපරිම වචන සංඛ්‍යාව 10කි. | වැරදීමට හැකි උපරිම වචන සංඛ්‍යාව 15කි. | වැරදීමට හැකි උපරිම වචන සංඛ්‍යාව 20කි. | වැරදීමට හැකි උපරිම වචන සංඛ්‍යාව 25ට වැඩි නම් |
| කතාව ආශ්‍රයෙන් අසන ප්‍රශ්නවලට පිළිතුරු සපයයි. | අසන ලද ප්‍රශ්න පහට ම නිවැරදි පිළිතුරු සපයයි. | අසන ලද ප්‍රශ්න පහෙන් හතරකට නිවැරදි පිළිතුරු සපයයි. | අසන ලද ප්‍රශ්න පහෙන් තුනකට නිවැරදි පිළිතුරු සපයයි. | අසන ලද ප්‍රශ්න පහෙන් දෙකකට නිවැරදි පිළිතුරු සපයයි. | අසන ලද ප්‍රශ්න පහෙන් එකකට නිවැරදි පිළිතුරු සපයයි. |
| හුවමාරු කුසලතා හඳුනා ගෙන ප්‍රකාශ කරයි. | කතාව ඇසුරෙන් හුවමාරු කුසලතා පහක් ප්‍රකාශ කරයි. | කතාව ඇසුරෙන් හුවමාරු කුසලතා හතරක් ප්‍රකාශ කරයි. | කතාව ඇසුරෙන් හුවමාරු කුසලතා තුනක් ප්‍රකාශ කරයි. | කතාව ඇසුරෙන් හුවමාරු කුසලතා දෙකක් ප්‍රකාශ කරයි. | කතාව ඇසුරෙන් හුවමාරු කුසලතා එකක් ප්‍රකාශ කරයි. |
| මනා නිමාවකින් යුතු ව නියමිත වේලාවට ක්‍රියාකාරකම් සිදු කර ඉදිරිපත් කරයි. | ක්‍රියාකාරකම් පහක් සම්පූර්ණ කරයි. | ක්‍රියාකාරකම් හතරක් සම්පූර්ණ කරයි. | ක්‍රියාකාරකම් තුනක් සම්පූර්ණ කරයි. | ක්‍රියාකාරකම් දෙකක් සම්පූර්ණ කරයි. | ක්‍රියාකාරකම් එකක් සම්පූර්ණ කරයි. |
| හුවමාරු කුසලතා ජීවිතයට බද්ධ කර ගනිමින් කටයුතු කරන බව ප්‍රදර්ශනය කරයි. | හුවමාරු කුසලතා පහකට වැඩි ප්‍රමාණයක් හැසිරීමේ දී ප්‍රදර්ශනය කරයි. | හුවමාරු කුසලතා හතරකට වැඩි ප්‍රමාණයක් හැසිරීමේ දී ප්‍රදර්ශනය කරයි. | හුවමාරු කුසලතා තුනකට වැඩි ප්‍රමාණයක් හැසිරීමේ දී ප්‍රදර්ශනය කරයි. | හුවමාරු කුසලතා දෙකකට වැඩි ප්‍රමාණයක් හැසිරීමේ දී ප්‍රදර්ශනය කරයි. | හුවමාරු කුසලතා එකකට වැඩි ප්‍රමාණයක් හැසිරීමේ දී ප්‍රදර්ශනය කරයි. |

- ශිෂ්‍යයා වඩාත් කැමැති නිර්මාණයක් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
  කතාවක් නිර්මාණය කිරීම/නාට්‍ය පිටපතක් නිර්මාණය කිරීම/නාට්‍යයක් රඟ දැක්වීම/වීඩියෝ පටයක් නිර්මාණය කිරීම/පුවත්පතකට ලිපියක් සකස් කර පළ කිරීම/ගීතයක් නිර්මාණය කිරීම/ කවි පන්තියක් නිර්මාණය කිරීම

  ලකුණු 100යි.



# 5 කුමුදුගේ කතාව

ඇය නමින් කුමුදු. කුමුදු පාසල් ගියේ ඇයගේ ගමේ තිබුණු කනිෂ්ඨ විද්‍යාලයට. ජීවිතයේ බොහෝ දුරක් ගෙවා පැමිණෙන්න, අභියෝගවලට සාර්ථක ව මුහුණ දෙන්න ඇයට දිරියක් වුණේ ඇයගේ පාසල. පොඩි කාලේ ඉඳල ම ඇය කාට හරි උදව් කරන්න පැකිළුණු කෙනෙක් නො වෙයි.


ඒ නිසා ම කුමුදුට මතක යි, හයේ පන්තියේ දී ඇයට සිදු වුණු අමතක නො වන සිදු වීමක්. ලකීෂා හිටියේ කුමුදුගේ පන්තියේ. ඇයට තිබුණේ අවපැහැ වුණු පුස් බැඳුණු එක සුදු ගවුම යි. ඒ වගේ ම ඇගේ තිබුණු ඇතැම් දුර්වලතා නිසා ළමයි ඇය ප්‍රතික්ෂේප කළා. පන්තියේ අවසාන පේළියේ තමයි ලකීෂා තනියෙන් හිටියේ. කුමුදු හිටියේ මුල් ම පේළියෙ. ඒත් කුමුදු සල්ලිකාර පවුලක සැපට හැදුණු කෙනෙක් නො වෙයි. කුමුදුගේ තාත්තා කළේ කුලී වැඩ. අම්මා හිටියේ පිටරට.

කුමුදු දවසක් ලකීෂා ළඟට ගිහින් කතා කළා. ඇයට හැම විෂය ම ලියන්න තිබුණේ එක පොත යි. පෙළ පොත් කවර නො දා කිළිටි වෙලා තිබුණා. ලියන්න තිබුණේ පොඩි පැන්සල් කොට කෑල්ලක්. කුමුදු ලකීෂාට උදව් කරන විදියක් ගැන හිතුවා. ඇය, ලකීෂා පන්තියෙන් එළියට යන වෙලාවක් බලලා පන්තියේ හිටිය අනෙක් ළමයි එක්ක කතා කළා. කුමුදු කියන දේ අහලා ගොඩක් ළමයි කැමති වුණා. එයාලට පුළුවන් විදිහට පොත් පෑන් පැන්සල් ගෙනත් දෙන්න.

ඒ අනුව පසු දින පන්තියේ ළමයි සියලු දෙනා ම වාගේ ඔවුන්ට පුළුවන් විදිහට ඉස්කෝලෙට ඕන ගොඩක් දේවල් ගෙනත් තිබුණා. කුමුදු, ඒ ළමයි එක්ක එකතු වෙලා, ලකීෂාට ඒ දේවල් ඔක්කොම දුන්නා. ඇය එකපාරට ම කුමුදුව බදා ගෙන ඇඬුවා. කුමුදුටත් ගොඩක් ම දුක යි. ඊට පස්සේ කුමුදු ඉස්කෝලෙ දී ම ලකීෂාගේ පෙළ පොත්වලට කවර දාලා දුන්නා. ඒක දැකලා තව යහළුවෝ කිහිප දෙනෙක් ඇවිත් පොත්වලට කවර දාලා දෙන්න උදව් කළා.

ලකීෂාට අවශ්‍ය වන පොත්වලට වඩා වැඩියෙන් පොත් හම්බ වුණ නිසා ඉතිරි පොත් ලකීෂාගේ නංගිට දුන්නා. කුමුදුලා හැමදා ම පුරුදු වුණා ඔවුන්ගේ කෑම එකෙන් කොටසක් ඇයට දෙන්න. ළමයි මුලින් ම ලකීෂා ප්‍රතික්ෂේප කරන්න තව හේතුවක් වුණේ ඇගේ අපිරිසිදු පෙනුම. කුමුදු ඇයට ළඟ ම මිතුරිය වුණ නිසා ම කුමුදු පසු පෙළ තනි ව ම සිටි ඇය කුමුදුගේ පේළියට ගත්තා. ඒ වගේ ම හැමදා ම පාසල් ඇරී ගෙදර ගියා ම සුදු ගවුම සෝදා ගන්නත් දවසට දෙ වරක් දත් මැදීමටත් උපදෙස් දුන්නා.

ඒ අනුව ඇය කුමුදු කියන දේ අහලා ඒ විදිහට හැසිරෙන්න පුරුදු වුණා. කුමුදු නිතර ඇයගේ පාසල් වැඩවලට උදව් කළා. පාසල් වාර විභාගවල දී මුල් ස්ථාන තුන අතර රැඳී සිටීමට ඇයට හැකි වුණා. ඔවුන් දෙන්නා හොඳ යාළුවෝ වුණා. කාලෙ ගෙවී ගිහින් අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගයෙන් කුමුදුට වගේ ම ලකීෂාටත් හොඳ ප්‍රතිඵල ලැබුණා.



ඔවුන් අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ සඳහා ගියේත් එක ම පාසලට. කුමුදු විශ්වවිද්‍යාලයට තේරී පත් වුණා. ලකීෂා අද පෞද්ගලික ඇඟලුම් කර්මාන්තශාලාවක රැකියාවක් කරමින් පවුලේ සුභසිද්ධියට වෙහෙසෙනවා. කුමුදු රජයේ රැකියාවක් කරමින් ඇගේ පවුලේ සුභසිද්ධියට වෙහෙසනවා. එදත් අදත් ඔවුන් දෙන්නා හොඳ ම යහළුවෝ.

## ● මෙම කතාවෙන් ඉස්මතු වන කුසලතා

- අභිප්‍රේරණය (පෙලඹී වීම) හා උද්යෝගය (Motivation and Enthusiasm)
- කණ්ඩායම් වැඩ (Team work)
- සහකම්පනය (Empathy)
- සාකච්ඡා කිරීම (Negotiation)

## ● ක්‍රියාකාරකම්

1. මේ කතාව පිළිබඳව පවුලේ අයට කියන්න. කුමුදුගේ ක්‍රියාව ගැන ඔවුන්ගේ අදහස් විමසන්න.
2. ඔබ ඔබේ මිතුරෙකුට කළ උදව්වක් සිහිපත් කරන්න. එය පන්තියට ඉදිරිපත් කරන්න.
3. ලකීෂාට මෙන් උදව් අවශ්‍ය මිතුරන් හෝ මිතුරියන් හෝ ඔබේ පන්තියේ සිටින්නේ දැයි සොයා බලන්න.
4. එසේ සිටින්නේ නම් මිතුරන් හා එක් ව සාකච්ඡා කර ඔබට හැකි ආකාරයෙන් උදව් කරන්න.

## දිවිය දිනන කතා
### ඇගයීම් පත්‍රිකා ආකෘතිය

කතාවේ නම.................................................. දිනය..........................

| අනු අංකය | ඇගයීම් නිර්ණායක / නම | නිවැරදි උච්චාරණයෙන් යුතු ව කියවයි. | කතාව ආශ්‍රයෙන් අසන ප්‍රශ්නවලට පිළිතුරු සපයයි. | හුවමාරු කුසලතා හඳුනා ගෙන ප්‍රකාශ කරයි. | මනා නිමාවකින් යුතු ව නියමිත වේලාවට ක්‍රියාකාරකම් සිදු කර ඉදිරිපත් කරයි. | හුවමාරු කුසලතා ජීවිතයට බද්ධ කර ගනිමින් කටයුතු කරන බව ප්‍රදර්ශනය කරයි. | මුළු ලකුණු |
|---|---|---|---|---|---|---|---|
| | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |

### ලකුණු දීමේ නිර්ණායක සඳහා ප්‍රමිති

| ඇගයීම් නිර්ණායක | ලකුණු 20යි (ඉතා හොඳයි) | ලකුණු 15යි (හොඳයි) | ලකුණු 10යි (සතුටුදායකයි) | ලකුණු 05යි (සාමාන්‍යයි) | ලකුණු 03යි (සංවර්ධනය විය යුතුයි) |
|---|---|---|---|---|---|
| නිවැරදි උච්චාරණයෙන් යුතු ව කියවයි. | වැරදීමට හැකි උපරිම වචන සංඛ්‍යාව 5කි. | වැරදීමට හැකි උපරිම වචන සංඛ්‍යාව 10කි. | වැරදීමට හැකි උපරිම වචන සංඛ්‍යාව 15කි. | වැරදීමට හැකි උපරිම වචන සංඛ්‍යාව 20කි. | වැරදීමට හැකි උපරිම වචන සංඛ්‍යාව 25ට වැඩි නම් |
| කතාව ආශ්‍රයෙන් අසන ප්‍රශ්නවලට පිළිතුරු සපයයි. | අසන ලද ප්‍රශ්න පහට ම නිවැරදි පිළිතුරු සපයයි. | අසන ලද ප්‍රශ්න පහෙන් හතරකට නිවැරදි පිළිතුරු සපයයි. | අසන ලද ප්‍රශ්න පහෙන් තුනකට නිවැරදි පිළිතුරු සපයයි. | අසන ලද ප්‍රශ්න පහෙන් දෙකකට නිවැරදි පිළිතුරු සපයයි. | අසන ලද ප්‍රශ්න පහෙන් එකකට නිවැරදි පිළිතුරු සපයයි. |
| හුවමාරු කුසලතා හඳුනා ගෙන ප්‍රකාශ කරයි. | කතාව ඇසුරෙන් හුවමාරු කුසලතා පහක් ප්‍රකාශ කරයි. | කතාව ඇසුරෙන් හුවමාරු කුසලතා හතරක් ප්‍රකාශ කරයි. | කතාව ඇසුරෙන් හුවමාරු කුසලතා තුනක් ප්‍රකාශ කරයි. | කතාව ඇසුරෙන් හුවමාරු කුසලතා දෙකක් ප්‍රකාශ කරයි. | කතාව ඇසුරෙන් හුවමාරු කුසලතා එකක් ප්‍රකාශ කරයි. |
| මනා නිමාවකින් යුතු ව නියමිත වේලාවට ක්‍රියාකාරකම් සිදු කර ඉදිරිපත් කරයි. | ක්‍රියාකාරකම් පහක් සම්පූර්ණ කරයි. | ක්‍රියාකාරකම් හතරක් සම්පූර්ණ කරයි. | ක්‍රියාකාරකම් තුනක් සම්පූර්ණ කරයි. | ක්‍රියාකාරකම් දෙකක් සම්පූර්ණ කරයි. | ක්‍රියාකාරකම් එකක් සම්පූර්ණ කරයි. |
| හුවමාරු කුසලතා ජීවිතයට බද්ධ කර ගනිමින් කටයුතු කරන බව ප්‍රදර්ශනය කරයි. | හුවමාරු කුසලතා පහකට වැඩි ප්‍රමාණයක් හැසිරීමේ දී ප්‍රදර්ශනය කරයි. | හුවමාරු කුසලතා හතරකට වැඩි ප්‍රමාණයක් හැසිරීමේ දී ප්‍රදර්ශනය කරයි. | හුවමාරු කුසලතා තුනකට වැඩි ප්‍රමාණයක් හැසිරීමේ දී ප්‍රදර්ශනය කරයි. | හුවමාරු කුසලතා දෙකකට වැඩි ප්‍රමාණයක් හැසිරීමේ දී ප්‍රදර්ශනය කරයි. | හුවමාරු කුසලතා එකකට වැඩි ප්‍රමාණයක් හැසිරීමේ දී ප්‍රදර්ශනය කරයි. |

- ශිෂ්‍යයා වඩාත් කැමැති නිර්මාණයක් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
  කතාවක් නිර්මාණය කිරීම/නාට්‍ය පිටපතක් නිර්මාණය කිරීම/නාට්‍යයක් රඟ දැක්වීම/වීඩියෝ පටයක් නිර්මාණය කිරීම/පුවත්පතකට ලිපියක් සකස් කර පළ කිරීම/ගීතයක් නිර්මාණය කිරීම/ කවි පන්තියක් නිර්මාණය කිරීම

  ලකුණු 100යි.



# 6 දිනූ ජීවිතයක්

ඇගේ නම අප්සරා. ඇගේ පවුලේ අම්මයි තාත්තයි අයියයි නංගියි ඉන්නේ. ඇය පොඩි කාලයේ ඉඳන් ම ඇගේ අම්මා විදේශයක සේවය කළා. තාත්තා අසනීපයෙන් නිසා රැකියාවක් කළේ නැහැ. අයියා පාසල් ගියෙත් ගමේ ඉස්කෝලෙට. ඒ තුන් දෙනා ම හැමදා ම ඉස්කෝලේ ගියා. නංගිට පුංචි කාලේ ඉඳන් ම නටන්න සින්දු කියන්න පුදුම හැකියාවක් තිබුණා. අයියා තමයි ඒ පාසලේ එදා මෙදා තුර බිහි වුණු දක්ෂතම පිරිමි ළමයා. ඇත්තට ම ඔහුට ඉගෙන ගන්න පුදුම හැකියාවක් තිබුණා. ඒත් ඔහු ඉතා සංවේදී අහිංසක චරිතයක්. ඒ නිසා ම පාසලේ දඩබ්බර නපුරු ළමයින්ගේ තාඩන පීඩනවලට නිතර ලක් වුණා.

අප්සරා පාසලේ හැම දේකට ම දක්ෂ ළමයෙක් වුණා. විශේෂයෙන් ම ඇය ගුරුවරුන් අතර ජනප්‍රිය චරිතයක් වුණා. මන්ද, ඇය පොඩි කාලේ ඉඳල ම උදේ හතරට නැගිටලා කෑම උයලා අනික් වැඩ ඔක්කෝමත් කරලා අයියගෙයි නංගිගෙයි වැඩ සියල්ලමත් කරලා තම යි පාසලට ගියේ. ඒ ගිය වෙලාවේ ඉඳල ම පාසලේ වැඩත් ඇය එක සේ උනන්දුවෙන් කළා. ඇය දැනටත් පුදුම වෙන දෙයක් තමයි පොඩි කාලේ ඉඳන් ම ඒ හැම දේම ඇය කොහොම ද කළේ කියලා. ඉස්කෝලේ ඇරිලා ගෙදර ආවම කාලා ගෙදර මිදුල් දොරවල් පිහදාලා අස්කරනවා. ඊට පස්සේ ළිඳට ගිහින් ඔවුන් හැමෝගෙ ම රෙදි හෝදනවා. නංගිව සෝදනවා. ඇවිත් රෑට උයනවා. පාසලෙන් දුන් ගෙදර වැඩ කරනවා. ඊට පස්සේ රෑට කෑම කාලා නිදා ගෙන ආයෙත් පාන්දර හතරට නැගිටලා සුපුරුදු වැඩ ටික කරලා පාසල් යනවා.

ඔවුන් ඉස්කෝලෙට ආවේ ගියේ පයින්. ඔවුන්ට වාහන තිබුණේ නැහැ. දුෂ්කර ගමක නිසා ඒ පහසුකම් කිසිවක් හිමි වුණේ නැහැ. ඒත් ගමේ දරුවන්ගේ වාසනාවට ඔවුන්ගේ පාසලට ලැබුණේ ඉතා මත් දක්ෂ හොඳ ගුරුවරු පිරිසක්. ඒ නිසා ම ඔවුන් ළමයින්ට හැම වෙලාවෙ ම ජීවිතයේ දිනන පාර පෙන්නුවා. සෑම වසරක ම පවත්වන සිංහල භාෂා තරගවලින් දෙසීයට අඩු පාසල්වලින් ඔවුන්ගේ කලාපයේ ප්‍රථම ස්ථානය ලබා ගැනීමට ඔවුන්ගේ පාසලට හැකි වුණා. ඇය හය වසරේ සිට එකොළහ වසර දක්වා ම සෑම වර්ෂයක ම කථික, පද්‍ය ගායනා හා ගද්‍ය රචනා තරග ත්‍රිත්වයේ ප්‍රථම ස්ථානය දිනා ගැනීමට සමත් වුණා. ඒ වගේ ම දිස්ත්‍රික්ක තරග ජයග්‍රහණ මෙන් ම කථික තරගවලින් සමස්ත ලංකා ජයග්‍රහණ ලබා ගැනීමට ද ඇයට හැකි වුණා. එහි දී ඇයගේ සිංහල ගුරුවරයා ඉතා මත් ගෞරවයෙන් ඇය සිහි පත් කරන්නේ එතුමාට ඔවුන් ගැන තිබුණු උනන්දුව හරි පුදුම සහගත වූ බැවින්. ඒ තරම් ම ඔහු ඔවුන් දිරිමත් කළා.

වරක් හය වන ශ්‍රේණියේ දී මුලින් ම අප්සරා කථික තරගයකට සහභාගි වූ අවස්ථාවේ දී ඇය ඉතා ම තිගැස්මෙන් යුතු වුණා. ඇත්තට ම ඇයට කතා කරන්න වචන නැතුව ගියා. ඇයට ලැබුණෙත් ඉතා ම ලෙහෙසි මාතෘකාවක්. මගෙ රට කියන මාතෘකාවට වත් ඇයට කතා කරගන්න බැරි වුණා. ඒත් ඇයට තව අවස්ථාවක් හිමි වුණා. ඒ අවස්ථාවෙන් උපරිම ප්‍රයෝජන ගත් ඇය ලද අවස්ථාවේ ඇයගේ බය යටපත් කර ගෙන හොඳින් දන්න කරුණු ඉදිරිපත් කළා. ඇය සාර්ථකයි කියලා ඇයට දැනුණේ විනිසුරුවන් තිදෙනා ම දැක්වූ අදහස්වලින්. ඇය කොහොමත් පුරුදු වෙලා හිටියා, හැම දේකට ම ඇයට පුළුවන් උපරිමයෙන් ම ඒ දේවල්වලට මුහුණ දෙන්න.





ඒ වගේ ම විද්‍යා දැනුම මිනුම, ගණිතය, ඉංග්‍රීසි, නැටුම් තරඟවලට මෙන් ම ඉංග්‍රීසි ගීත ගායන තරගවලට ද සෑම අවුරුද්දක ම ඇය සහභාගි වෙලා ජයග්‍රහණ ලැබුවා. සිංහල භාෂා තරඟ මෙන් ම සමාජ විද්‍යා තරගවලිනුත් සෑම වසරක ම ඇය පළමුවෙනියා වුණා. ඊට අමතර ව ඇය ක්‍රීඩාවලටත් බොහොම ආස යි.

පාසලේ වාර්ෂික ව පවත්වන ක්‍රීඩා උත්සවය එනකම් ඔවුන් හැමෝ ම ඇඟිලි ගනිමින් බලන් ඉන්නවා. ඇය දිග දුර ධාවනයට දක්ෂයි. ඇයගේ තරග ඉසවු වන්නේ 400m, 800m, 1500m යන තරග යි. ඊට අමතර ව මැරතන් ධාවන ශූරිය වීමටත් කිහිප අවස්ථාවක ම ඇයට හැකි වුණා. ක්‍රිකට්, එල්ලේ, වොලිබෝල් වැනි කණ්ඩායම් ක්‍රීඩාත් ඇය කළා.

මේ ආකාරයෙන් ගමේ ඉස්කෝලේ දී පළමුවන ශ්‍රේණියේ සිට එකොළොස්වන ශ්‍රේණිය දක්වා ඇය ලද ජයග්‍රහණ ඉතා විශාල යි. ඊට අමතර ව ජීවත් වෙන්න ඕන විදිය, සමාජයේ හැසිරෙන විදිය වගේ ම අභියෝග ජයගන්නත් ඇය පන්නරය ලැබුවේ ඇයගේ පාසලෙන්. හත්වන ශ්‍රේණියේ සිට දහවන ශ්‍රේණිය දක්වා පාසලේ ශිෂ්‍ය නායිකාවක වශයෙන් ද එකොළොස්වන ශ්‍රේණියේ දී පාසලේ ප්‍රධාන ශිෂ්‍ය නායිකාව වශයෙන් ද ඇයට ඇයගේ නංගිලා මල්ලිලාට, පාසලට, ඒ වගේ ම ගුරුවරුන්ට සේවයක් කිරීමට හැකි වුණා. ඇය පොත් කියවන්නට පුරුදු වුණේ හයවන ශ්‍රේණියේ දී ය. ලද සෑම අවස්ථාවක ම පොතක් කියවීමට ඇය අමතක නො කළා ය. ඒ පුරුද්ද අදට ද ඇය තුළ පවතින අතර එයින් ඇය ලද ජයග්‍රහණ බොහෝ ය.





නිවසෙහි සෑම වැඩක් ම කර ගෙන ගුරුවරුන්ගේ මග පෙන්වීම යටතේ ඇය එම වර්ෂයේ හොඳ ම සාමාන්‍ය පෙළ ප්‍රතිඵල ගෙන විභාගය ඉහළින් ම සමත් වූවා ය. එමෙන් ම ගමේ පාසලේ උසස් පෙළ පන්ති නො තිබූ බැවින් ඇයට වෙනත් පාසලකට යාමට සිදු විය. ඒත්, ගමේ පාසලෙන් ඇය ලද දේ බොහෝ ය. නගරයේ පවතින උසස් ම පාසලට යාමට ඇයට හැකියාව ලැබුණත් ඇය එය අත් හැරියේ ගෙදර වැඩ කර උදේට ඒ පාසලට යාමට පහසුකම් නො තිබූ නිසා ය. ඇය උසස් පෙළ සඳහා ගිය පාසල ඇයගේ ජීවිතයට නැවුම් බලාපොරොත්තුවක් එක් කළේ ය. එහි ගුරුවරු ඉතා කෙටි කාලයකින් ඇයගේ හැකියාවන් හඳුනා ගත්තා. ඔවුන් හැම දිනක ම ඇයට කියා සිටියේ විශ්වවිද්‍යාලයට යාමට උනන්දු වෙන ලෙස. ඒ වගේ ම එම විද්‍යාලයේ පාසල් විවාද කණ්ඩායමට ඇතුළත් වීමටත් නො බෝ දිනකින් එහි නායිකාව වීමටත් ඇයට හැකියාව ලැබුණා. එයින් ඇය ලද පන්නරය  ජීවිතයට ඉතා මත් ම වැදගත් වුණා. ඉවසීම, දරා ගැනීම, අභියෝගවලට මුහුණ දීමේ හැකියාව, ජය පැරදුම සමසේ විඳ ගැනීමට ඇය වඩාත් ම පුරුදු වුණා. මේ අතරතුර ඇය ඉගෙනීමට ද උනන්දු වූ අතර සියලු දේ සම සේ කර ගෙන යාම සිදු කළා. ඇයට විවේකයක් කියලා ලැබුණේ නිදා ගත්ත පැය කිහිපය පමණ යි.

කෙසේ හෝ එම වසර දෙක අවසානයේ ඇය උසස් පෙළ විභාගයට මුහුණ දුන්නා. ඇයගේ හිතේ ලොකු බලාපොරොත්තුවක් තිබුණා ඇය විශ්වවිද්‍යාලයට යාමට සමත් වේවි කියලා. ඇයට උසස් පෙළ විභාගයෙන් පසු ව ඇය කළ යුතු දේ පිළිබඳව අරමුණු තුනක් තිබුණා. මේ තුනෙන් එකකට කෙසේ හෝ යාමට ඇය අදිටන් කර ගත්තා. ප්‍රථමයෙන් ම විශ්වවිද්‍යාලයට යාම, විද්‍යාපීඨ ගොස් ගුරුවරියක වීම, එසේ නො වුණ හොත් පොලිස් නිලධාරිනියක වීම. කෙසේ හෝ ප්‍රතිඵල පැමිණෙන විට ඇය හොඳින් විභාගය සමත් වී විශ්වවිද්‍යාලය වරම් ලබා තිබුණා. ඇයට අවශ්‍ය වුණේ ගෙදරට බරක් නො වී රැකියාවක නිරත වීමට. එහෙත් ඇයගේ අම්මාගේ සහ අයියාගේ බලවත් අකමැත්ත නිසා ඇයට රැකියාවක් කිරීමට හැකියාවක් තිබුණේ නැහැ.

ඒ  නිසා ම ඇය විශ්වවිද්‍යාලයට යාමට තීරණය කළා. එහෙත් එහි දී ඇයට බොහෝ ගැටලු මතු වුණා. නංගි පොඩි නිසා ඇය ගෙදර දමා යන්නට ගොඩක් ම දුක යි. ඒ වගේ ම ගෙදර වැඩ කොහොම ද කරන්නෙ කියල ප්‍රශ්න ආවා. කෙසේ හෝ ඒ හැමදේ ම ගැන නො සිතා  විශ්වවිද්‍යාලයට යාමට සූදානම් වන ලෙස අම්මත් අයියාත් නිතර කියා සිටියා.

ඒ අනුව නංගි බලා ගැනීමට අයියා පොරොන්දු වීම ඇයට මහත් අස්වැසිල්ලක් විය. ඒත් අයියාගේ  අධ්‍යාපන කටයුතුවලට එය යම් තාක් දුරට බාධාවක් වුණා. ඇය විශ්වවිද්‍යාලයට

ගියේ ඇයගේ අයියා එක්ක. එදා ඇයට ගොඩක් ම දුක හිතුණ දවසක් වුණා. අනිත් සියලු ළමයි අම්මා තාත්තා එක්ක පැමිණීම හා නංගි දමා ඒමට සිදු වීම ඇයට තව තවත් දුක හිතෙන සිදුවීම් වුණා. ඒත් අපි ඇත්තට මුහුණ දිය යුතු යි කියා ඇය කෙසේ හෝ හිත හදා ගැනීමට උත්සාහ කළා.

අනතුරු ව ඇය විශ්වවිද්‍යාලයේ අධ්‍යාපනයට, නේවාසිකාගාර ජීවිතයට හුරු වුණා. ඉතා විශාල සිසුන් සංඛ්‍යාවක් අතුරෙන් සරසවි ශිෂ්‍යයාවක වීමේ වරම් ලැබීම ගැන සිතූ ඇයට මුල් දින සිට ම අධ්‍යාපනයට සිත යොමු කිරීමට හැකි විය. ඒ වගේ ම කියවීම පුරුද්දක් කර ගෙන සිටි ඇයට විශ්වවිද්‍යාලයේ පුස්තකාලය මහත් ප්‍රයෝජනයක් වුණි. තව ද කෙටි කලකින් ම විශ්වවිද්‍යාල විවාද කණ්ඩායමට තේරී පත් වීමට ඇය හට හැකියාව ලැබුණි. ඒ වගේ ම විශ්වවිද්‍යාල නර්තන කණ්ඩායමට එක් වීමට හැකි වීම ද ඇය ලද භාග්‍යයක් විය. විෂය සමගාමී ක්‍රියා, විෂය බාහිර ක්‍රියාකාරකම් මෙන් ම පොදු වැඩ, සාහිත්‍ය, කලාව, වීදි නාට්‍ය කණ්ඩායම ආදිය සමග ඇයගේ විශ්වවිද්‍යාල ජීවිතය ගෙවී ගියා. ඇය සෑම වසරක ම ඔවුන්ගේ අධ්‍යයන අංශයේ හොඳ ම ප්‍රතිඵලයට හිමිකම් කීවා.

මේ අතරතුර, එනම්ඃ ඇයගේ විශ්වවිද්‍යාල ජීවිතයේ අවසන් වසරේ දී අම්මා ලංකාවට ආවා. එය ඇය ලද මහත් ම අස්වැසිල්ලක් වුණා. ඒ වන තෙක් ඇය වෙත පැවරී තිබූ ගෙදර සියලු වගකීම්වලින් ඇයගේ සිතට මහත් සහනයක් ලැබුණේ දැන් අම්මා ඉන්නවානේ කියන සිතුවිල්ලත් සමග යි. ඒත් එකී සතුට දුකක් බවට පත් වීමට ගත වූයේ දින කීපයක් පමණ යි. ඇයගේ තාත්තාට සුසුම්නාවේ ඇති වූ රෝගයක් නිසා ඔහු සදාකාලික රෝගියෙකු වී ඇඳට වැටුණි. ඔහුගේ බෙහෙත්වලට අධික වියදමක් දැරීමට සිදු විය. ඒ වන විට ඇයගේ අයියා නවකයකු වශයෙන් පෞද්ගලික ආයතනයක රැකියාවකට ගොස් මාසයක් පමණි. ඔහුගේ වැටුප කිසිසේත් ම ප්‍රමාණවත් නො වුණේ බෙහෙත් සඳහා අධික වියදමක් වැය වූ නිසා ය. ඒ අනුව ඇය පෙර සිට ම විශ්වවිද්‍යාලය තුළ දී දේශන නොමැති දිනවල අමතර රැකියා කරමින් ඇයගේ වියදම සොයා ගෙන ගෙදරට බරක් නො වී ඇයගේ වියදම් සිදු කර ගත්තා ය.


එහි දී ඇයට ගෙදර වියදම්වලට දායක වීමටත් මෙකී රැකියා විශාල රුකුලක් වුණා. ඒ කෙසේ වෙතත් ඇයගේ අධ්‍යාපන කටයුතුවලට ඇය ඒ සියල්ල බාධාවක් කර ගත්තේ නැහැ. යහළුවන්ගෙන් විවිධ අවස්ථාවල සිත් තැවුල් ඇති වුවත් ඇය ඒවාට පුරුදු වුණා. කාලය ගෙවී ගිහින් වසර එක හමාරක් ඇඳේ සිටි ඇයගේ තාත්තා සදහට ම ඔවුන් අතහැර ගියා.

විවිධ දුක් කම්කටොලු කරදර බාධක ඇයගේ ජීවිතයට හැමදා ම ලැබුණු දේවල්. තාත්තාගේ මරණය වන විට විශ්වවිද්‍යාලයෙන් සමු ගැනීමට ඇයට තිබුණේ මාස දෙකක්

වැනි ඉතා කෙටි කලක් පමණි. සියල්ල ඉවසීමෙන් විඳ දරා ගත් ඇය තාත්තගේ අවසන් කටයුතුවලින් පසු ව ගෙදර සිට දිනපතා විශ්වවිද්‍යාලයට යාමට හුරු වුණා. එය ඉතා දුෂ්කර වුවත් අම්මා සහ නංගි ගෙදර දමා යාම කළ නො හැකි දෙයක් වුණා.

මේ අනුව අවසාන විභාගයටත් ඇය හොඳින් සූදානම් වුණා. මොකද දුප්පත් ඔවුන්ට තියෙන එක ම අවිය හොඳින් ඉගෙන ගැනීම වූ නිසා. ඒ අනුව ඇය වසර හතරක විශ්වවිද්‍යාල ජීවිතයෙන් සමු ගත්තේ ප්‍රථම පන්තියේ ගෞරව උපාධියක් සමග දක්ෂතම ශිෂ්‍යාව වශයෙනි. එය ඇයගේ ජීවිතයේ ඇය ලද වටිනාම භාග්‍යය විය. එසේ ම ඇයගේ මියගිය තාත්තාට හා අම්මටත් අයියාටත් දිය හැකි එක ම උපහාරය එය බව ඇය විශ්වාස කළා. අම්මාත් අයියාත් ඇය නිසා අප්‍රමාණ ව සතුටු වූ දවස එය බවත් ඇය දනී.

කෙසේ වුවත් ඇයගේ ජීවිතය දිහා ආපසු හැරී බලන විට අප්‍රමාණ සතුටක් දැනෙයි. ඒ මන්ද ඇය විඳි දුක් කරදර බාධක සියල්ලට ම මැදිහත් ව මුහුණ දී අද වන විට ජීවිතය දිනා සිටින නිසා ය. ඇය විශ්වවිද්‍යාලයෙන් සමු ගෙන නො බෝ දිනකින් ඇයගේ විශ්වවිද්‍යාලයේ ම සහකාර කථිකාචාර්යවරියක ලෙස සේවයට පත් වූවා ය. එය ඇයගේ දක්ෂතාවට ඇයට ලැබුණු රැකියාවක් වීම ද ඇයට සතුටට කරුණකි. ඇයට දැන් ඇයගේ නංගිට උගන්වන්න, අම්මාට සලකන්න, ඒ වගේ ම තාත්තට පින් අනුමෝදන් කරන්න පුළුවන්. ඇත්තට ම ඇය ජීවිතේ දිනුවා. ඉතින් මේක තමයි, අප්සරාගේ ජීවිතේ.



## ● මෙම කතාවෙන් ඉස්මතු වන කුසලතා

- අභිප්‍රේරණය (පෙලඹ වීම) හා උද්‍යෝගය (Motivation and Enthusiasm)
- ස්වයංදැනුවත්භාවය (Self Awareness)
- තීරණ ගැනීම (Decisiveness)
- ඉවසීම (Patience)
- පුද්ගල සංවර්ධනය (Personal Development)

## ● ක්‍රියාකාරකම්

1. මෙම කතාවේ කියවෙන ආකාරයට අප්සරාට තිබුණු ගැටලු මොනවා දැයි එක් තීරුවක ලියන්න. අප්සරා ඒවා විසඳා ගත් ආකාරය ඊට ඉදිරියෙන් ලියන්න.
2. අප්සරාගේ සාර්ථකත්වයට හේතු වූ කරුණු පන්තියේ මිතුරන් සමග සාකච්ඡා කරන්න.
3. ඉතා දුප්පත් ව ඉපිද වෙහෙස මහන්සි වී ජීවිතය ජය ගත් මිනිසුන්ගේ කතා වැඩිහිටියන්ගෙන් අසා ගෙන හෝ සන්නිවේදන මාධ්‍යයන්ගෙන් සොයා දැන ගන්න. ඒවා පන්තියට ඉදිරිපත් කරන්න.
4. වර්තමානයේ ඔබට ඇති ගැටලු 10ක් ලියන්න. ඒවා ධනාත්මක ව විසඳා ගන්නා ආකාරය ඉදිරියෙන් ලියන්න.
5. 'අභියෝග හමුවේ නො සැලී ඉදිරියට යමු' යන මාතෘකාවෙන් රචනාවක් ලියන්න.

## දිවිය දිනන කතා
### ඇගයීම් පත්‍රිකා ආකෘතිය

කතාවේ නම.................................................. දිනය..........................

| අනු අංකය | ඇගයීම් නිර්ණායක / නම | නිවැරදි උච්චාරණයෙන් යුතු ව කියවයි. | කතාව ආශ්‍රයෙන් අසන ප්‍රශ්නවලට පිළිතුරු සපයයි. | හුවමාරු කුසලතා හඳුනා ගෙන ප්‍රකාශ කරයි. | මනා නිමාවකින් යුතු ව නියමිත වේලාවට ක්‍රියාකාරකම් සිදු කර ඉදිරිපත් කරයි. | හුවමාරු කුසලතා ජීවිතයට බද්ධ කර ගනිමින් කටයුතු කරන බව ප්‍රදර්ශනය කරයි. | මුළු ලකුණු |
|---|---|---|---|---|---|---|---|
| | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |

### ලකුණු දීමේ නිර්ණායක සඳහා ප්‍රමිති

| ඇගයීම් නිර්ණායක | ලකුණු 20යි (ඉතා හොඳයි) | ලකුණු 15යි (හොඳයි) | ලකුණු 10යි (සතුටුදායකයි) | ලකුණු 05යි (සාමාන්‍යයි) | ලකුණු 03යි (සංවර්ධනය විය යුතුයි) |
|---|---|---|---|---|---|
| නිවැරදි උච්චාරණයෙන් යුතු ව කියවයි. | වැරදීමට හැකි උපරිම වචන සංඛ්‍යාව 5කි. | වැරදීමට හැකි උපරිම වචන සංඛ්‍යාව 10කි. | වැරදීමට හැකි උපරිම වචන සංඛ්‍යාව 15කි. | වැරදීමට හැකි උපරිම වචන සංඛ්‍යාව 20කි. | වැරදීමට හැකි උපරිම වචන සංඛ්‍යාව 25ට වැඩි නම් |
| කතාව ආශ්‍රයෙන් අසන ප්‍රශ්නවලට පිළිතුරු සපයයි. | අසන ලද ප්‍රශ්න පහට ම නිවැරදි පිළිතුරු සපයයි. | අසන ලද ප්‍රශ්න පහෙන් හතරකට නිවැරදි පිළිතුරු සපයයි. | අසන ලද ප්‍රශ්න පහෙන් තුනකට නිවැරදි පිළිතුරු සපයයි. | අසන ලද ප්‍රශ්න පහෙන් දෙකකට නිවැරදි පිළිතුරු සපයයි. | අසන ලද ප්‍රශ්න පහෙන් එකකට නිවැරදි පිළිතුරු සපයයි. |
| හුවමාරු කුසලතා හඳුනා ගෙන ප්‍රකාශ කරයි. | කතාව ඇසුරෙන් හුවමාරු කුසලතා පහක් ප්‍රකාශ කරයි. | කතාව ඇසුරෙන් හුවමාරු කුසලතා හතරක් ප්‍රකාශ කරයි. | කතාව ඇසුරෙන් හුවමාරු කුසලතා තුනක් ප්‍රකාශ කරයි. | කතාව ඇසුරෙන් හුවමාරු කුසලතා දෙකක් ප්‍රකාශ කරයි. | කතාව ඇසුරෙන් හුවමාරු කුසලතා එකක් ප්‍රකාශ කරයි. |
| මනා නිමාවකින් යුතු ව නියමිත වේලාවට ක්‍රියාකාරකම් සිදු කර ඉදිරිපත් කරයි. | ක්‍රියාකාරකම් පහක් සම්පූර්ණ කරයි. | ක්‍රියාකාරකම් හතරක් සම්පූර්ණ කරයි. | ක්‍රියාකාරකම් තුනක් සම්පූර්ණ කරයි. | ක්‍රියාකාරකම් දෙකක් සම්පූර්ණ කරයි. | ක්‍රියාකාරකම් එකක් සම්පූර්ණ කරයි. |
| හුවමාරු කුසලතා ජීවිතයට බද්ධ කර ගනිමින් කටයුතු කරන බව ප්‍රදර්ශනය කරයි. | හුවමාරු කුසලතා පහකට වැඩි ප්‍රමාණයක් හැසිරීමේ දී ප්‍රදර්ශනය කරයි. | හුවමාරු කුසලතා හතරකට වැඩි ප්‍රමාණයක් හැසිරීමේ දී ප්‍රදර්ශනය කරයි. | හුවමාරු කුසලතා තුනකට වැඩි ප්‍රමාණයක් හැසිරීමේ දී ප්‍රදර්ශනය කරයි. | හුවමාරු කුසලතා දෙකකට වැඩි ප්‍රමාණයක් හැසිරීමේ දී ප්‍රදර්ශනය කරයි. | හුවමාරු කුසලතා එකකට වැඩි ප්‍රමාණයක් හැසිරීමේ දී ප්‍රදර්ශනය කරයි. |

- ශිෂ්‍යයා වඩාත් කැමැති නිර්මාණයක් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
  කතාවක් නිර්මාණය කිරීම/නාට්‍ය පිටපතක් නිර්මාණය කිරීම/නාට්‍යයක් රඟ දැක්වීම/වීඩියෝ පටයක් නිර්මාණය කිරීම/පුවත්පතකට ලිපියක් සකස් කර පළ කිරීම/ගීතයක් නිර්මාණය කිරීම/ කවි පන්තියක් නිර්මාණය කිරීම
  ලකුණු 100යි.



# 7 මනුස්සකම

හසිඳු, චාරුක, ඉඳුවර, හිරුෂ යන යාළුවන් පාසල් අධ්‍යාපනය ලැබුවේ සිරිපුර මධ්‍ය මහා විද්‍යාලයේ ය. චාරුකගේ නායකත්වයෙන් විදුහලේ දී එකතු වන කණ්ඩායම ඉතා හොඳ වැඩ කරමින් සමාජයේ වැඩිහිටි සියලු දෙනාගේත් විදුහල්පතිතුමියගේ හා ගුරු මවුපියවරුන්ගේත් ආදරය දිනා ගන්නට සමත් වුණා.

ඔවුන්ගේ දෙමවුපියන් මේ කරන වැඩවලට බාධා කරන්න ගියේ නැහැ. ඒ ඇයි ද කියනවා නම් මේ පුංචි වීරයන්ගේ අම්මලා තාත්තාලා දැන ගෙන හිටියා, මෙයාලා නරක දඟවැඩ හෝ අනුන්ට හිංසාවක් වන දේවල් කරන්නේ නැහැ කියලා. නිතර ම සමගියෙන් යහළුවන් එක්ක අනුන්ට යහපතක් වන දේවල් ම තමයි, මේ යාළුවන් කළේ.

විදුහලේ විදුහල්පතිතුමිය ගුරුවරු වගේ ම ගමේ සියලු දෙනාගේ ම වැඩි අවධානය හා ආදරය දිනා ගෙන හිටි මේ වීරයෝ ගමේ අසරණ වෙලා ඉන්න ආච්චිලා සීයලාට බොහො ම උපකාර කරනවා. ඒ අයට කරුණාවෙන් ආදරෙන් කතා කළා ම කන්න බොන්න නැති වුණත් ඒ කුසගින්න වේදනාව දුරු වුණේ මේ යාළුවන්ගේ ආදරණීය වචන ටික එයාලගේ කනට වැටුණා ම යි.


හැමදා ම ගුණෝරිස් සීයා මග බලා ගෙන ඉන්නවා, මේ යාළුවෝ පාසල් ඇරිලා සීයා බලන්න එනකම්. යාළුවො ඇවිත් සීයා නාවලා තේ හදලා පොවලා ලස්සන ම ලස්සන කතාවකුත් අහලා තමයි ගෙදවල්වලට යන්නේ. යාළුවෝ පාසල් ඇරිලා ගෙදර පරක්කු වෙලා එන කාරණය මොවුන්ගේ දෙමව්පියන් දැන ගෙන හිටියා. ඒ නිසා ම ඔවුන්ට බනින්න දඬුවම් කරන්න ගියේ නැහැ.

ඉතින් යාළුවනේ, මෙන්න මේ වගේ බොහොම වටින ආදර්ශවත් දේවල් කරන නිසා තමයි ගමේ හුඟක් අය මේ පුංචි යාළුවන්ට ආදරේ වුණේ. ඔන්න දවසක් සුදු අප්පො මාමා විලාප දිදී අඬනවා ඇහුණා මහා හයියෙන්. චාරුකගේ අම්මා, ගීතා නැන්දා සුදු අප්පො මාමාගේ පැලට ගිහින් මේ ගැන අහලා තිබුණා. චාරුගේ අම්මා නම් කීවේ සුදු අප්පෝ මාමා බොහොම මහන්සිවෙලා සිරිදෝරිස් මාමාගෙන් ණයට ඉල්ලා ගත්ත සල්ලි ටික වියදම් කරලා හදාගත්ත පුංචි ගොවිපලේ හැදිලා තිබුණ, හුළං පුම්බපු බැලුම් වගේ තිබුණු කැකිරි ගෙඩි ටිකත් චූටි නැන්දගේ දිග කොණ්ඩෙ වගේ තිබුණු මැකරල් ටික ඔක්කොම හොරු කඩා ගෙන ගිහින් කියලා.

අසරණ සුදු අප්පො මාමා හරි ම වේදනාවෙන් ඇඬුවා.

"ඇත්තට ම කවුද මේ වැඩේ කරන්න ඇත්තේ"

හසිඳු දුක්මුසු ස්වරයෙන් හා කල්පනා කරමින් කිව්වා.



"හරි අපි අද ඉඳලා අවදානෙන් ඉමු, අපේ ගමේමේ වගේ දේවල් කරන්නේ කවුද කියලා?" චාරුක කිව්වා. යාළුවෝ හැමදා ම එකතු වෙලාමේ ගැන කතා කර ගෙන සොයා බලන්න හිතුවා.

හැන්දෑවේ ඉඳුවර, ලොකු නැන්දලාගේ ගෙදර යද්දී කන්දේගෙදර වත්ත ළඟින් යන විට, මොනව දෝ හාරනවා වගේ හඬක් ඇහිලා හෙමිහිට ළං වෙලා ලොකු මී අඹ ගහට මුවා වෙලා බලා ගෙන හිටියා.

"අනේ අපොයි! මේ අන්දිරිස් මාමා නේද කන්දේගෙදර වත්තේ සීයගෙ මඤ්ඤොක්කා පඳුරු ටික හොරෙන් හාරන්නේ."

අන්දිරිස්ට ඇහෙන්න ම සිංදුවකුත් කියා ගෙන ඉඳුවර ගෙදර ගියා.

එදා ඉඳුවරට නින්ද ගියේ නැහැ. ඔහු මෙහෙම හිතුවා.

''අන්දිරිස් මාමා මහන්සි වෙලා මොකුත් කරන්නෙත් නෑ. රස්සාවක් කරන්නෙත් නැහැ. අතන මෙතන රස්තියාදුවේ ගිහින් සුරුට්ටුවක් බිබී කඩපිළට වෙලා තමයි වැඩි පුරම ඉන්නෙ, කාලය නාස්ති කරන්නේ.''

'' එතකොට අර සඳලි නංගි ඉස්කෝලේ එන්නේ නැත්තේ එයාලට පොත් ටික අරන් දෙන්න අන්දිරිස් මාමට සල්ලි නැති නිසා ද?''

'' එදා සුදු අප්පො මාමගේ කොටුවෙ එළවළු හොරෙන් කඩන්න ඇත්තේ අන්දිරිස් මාමා වෙන්න බැරි ද? ''

'' අපි මේකට මොකද කරන්නේ.''

පහුව දා උදේ ම යාළුවො හම්බ වෙලා මේ ගැන කතා කරනකන් ඉඳුවරට ඉවසිල්ලක් නැහැ. හරියට නින්ද ගියෙත් නැහැ.

කුරුලු රංචු කිචි බිචි ගාමින් පියාඹනවා. කුකුල් රාළ නාද කරනවා. ලස්සන ම ලස්සන උදෑසනක් ඇවිල්ලා. අම්මා ඉඳුවරට කතා කළා.

'' සුදු පුතේ, ඉස්කෝලේ යන්න තියෙනවා නැගිටින්න, මගේ හොඳ පුතා වගේ.''

අම්මා ඉඳුවර ළඟට ඇවිත් ඔළුව අතගාලා කතා කළා.

ඉඳුවර ඉක්මනට ඇඳෙන් නැගිටලා මූණ කට සෝදා ගෙන තේ ටික බීලා කෑම කාලා ඉස්කෝලේ යන්න පිටත් වුණා.

'' අපි එකතු වෙලා අන්දිරිස් මාමා හොඳ කෙනෙක් කරනවා. සඳලි නංගිට ඉස්කෝලේ යන්න ඕන හැමදේ ම අපි එකතු වෙලා අරන් දෙනවා. එතකොට සඳලි නංගි හුඟක් ආසාවෙන් ඉස්කෝලෙ ගිහින් හොඳට ඉගෙන ගනීවි.'' ඉඳුවර හිතුවා.

ඉඳුවර මෙහෙම කිව්වා. ''චාරුක මම ඊයේ විශේෂ දෙයක් දැක්කා අපිට මේකට මොකක් හරි දෙයක් කල්පනා කරලා කරන්න වෙනවා. අපේ විවේකයේ දී මේ ගැන කතා කරමු.''

හැමෝ ම විදුහලට ඇතුළු වුණා. ටිලිං ටිලිං ටිලිං විවේක කාලය ආවා. යාළුවෝ ටික එකතු වුණා. ඔන්න ඉඳුවර ඊයේ සවස දැක්ක දේ යාළුවන්ට කියන්න පටන් ගත්තා.

'' ඊයෙ ලොකු නැන්දලාගේ ගෙදර ගිහිල්ලා එන කොට කන්දේ ගෙදර වත්තේ සීයගෙ මඤ්ඤොක්කා පඳුරු අන්දිරිස් මාමා හොරෙන් උදුරනවා මං බලා ගෙන ඉඳලා සිංදුවකුත් කියා ගෙන එතැනින් ආවා. අන්දිරිස් මාමා දැන ගන්න ඇති මං දැක්කා කියලා.''

''එහෙම ද එතකොට සුදු අප්පෝ මාමගෙ කොටුවෙ එළවළු හොරෙන් කැඩුවෙ අන්දිරිස් මාමා වෙන්න බැරි ද?'' චාරුක ඇහුවා.

''ඔව්, සමහර විට, සඳලි නංගි පාසල් යන්නෙත් නැහැ නේ ද?''

''ඔව් එයාට ඉස්කෝලේ යන්න පොත් පත් නැති නිසාලු නො යන්නේ කියලා සඳලිගේ යාළුවෝ විහංගිට කියලා තිබුණා.''

''ඉතින් අපිට මේකට කරන්න පුළුවන් මොකක් ද? '' හසිඳු ඇහුවා.

''අපි මේ අන්දිරිස් මාමාගේ නරක පුරුදු නැති කරලා හොඳ මාමා කෙනෙක් කර ගනිමු. එතකොට සඳලි නංගිගේ ගෙදර සතුටෙන් පිරෙයි. එයාට ඉස්කෝලේ යන්නත් පුළුවන් වේවි.''

ටිලිං ටිලිං ටිලිං විවේක කාලය ඉවර වුණා.

''අපි හවසට කතා කරමු. දැන් පන්තිවලට යමු.''

යාළුවො පන්තිවලට දුව ගෙන ගියා. ඉස්කෝලේ ඇරිලා ගුණෝරිස් සීයත් බලලා ගෙවල්වලට යන අතරමග දී යාළුවෝ මෙහෙම කතා වුණා.

''සුනීර අයියා කියන්නේ ගමේ බොහොම හොඳ, හැමෝ ම ආදරේ කරන විශ්වවිද්‍යාලයේ ඉගෙනුම ලැබූ හොඳ අයියා කෙනෙක්. ඉතින් අපි සුනීර අයියගෙනුත් මේ වැඩේට අවවාද ලබා ගනිමු.''

''ඒක නම් හොඳ අදහසක්. එහෙනම් අද හවස අපි හැමෝ ම සුනීර අයියගේ ගෙදර යමු නේ ද?''

''ඔව් අපි යමු, යමු.'' යහළුවෝ එකඟ වුණා.

''කමලා නැන්දේ, කමලා නැන්දේ සුනීර අයියා ඉන්නවා ද?''

''ආ... මේ චාරු පුතාලා නේ. එන්න, එන්න.''

''සුනීර පුතා ඉන්නවා. වාඩිවෙන්න පුතාලා, ඉන්න, මම චූටි පුතාට කතා කරන්නම්.''

''ආ... චාරු මල්ලිලා නේ? මොකද ඉතින් මේ පැත්තේ?''

''සුනීර අයියේ අපි ආවේ අයියගෙන් ලොකු උපදේශයක් බලාපොරොත්තුවෙන්.''

''හොඳයි කියන්නකො බලන්න.''

චාරු සිදු වුණු සියලු දේ සුනීරට කීවා.

''අයියේ අපි කොහොම හරි අන්දිරිස් මාමාට උදව් කරලා එයාව හොඳ කෙනෙක් කරමු.''

''ඒක නම් හොඳ වැඩක්. එතකොට ගමේ වෙලා තියෙන හොරකම්වලට අන්දිරිස් මාමා ද වගකියන්න ඕනේ? මල්ලි ගමේ ගොඩක් අය කතා වෙනවා මේ ගැන. ඔය අන්දිරිස් මාමට ඉස්සර තිබුණ ලූ හේනක්. ඉතිං ඒක විකුණලා සුමනා නැන්දගේ අසනීපවලට බෙහෙත් කළා ලූ. දැන් ඉතින් මුකුත් කර කියාගන්න බැරි ව තමයි ඔය හොරකම් කරන්නේ. මල්ලිලා අපි කොහොම ද මේ මාමට උදව් කරන්නේ?''

''අයියේ අපේ ප්‍රජාශාලාවට එහා පැත්තේ තියෙන ඉඩම කාටවත් අයිති නැති එකක් නේ ද? අපි ඒක ග්‍රාමනිලධාරීතුමා එක්ක කතා කරලා අන්දිරිස් මාමාට අරන් දෙමු. එතකොට එයා ඒකේ හොඳට වගා කරලා එළවළු විකුණලා සල්ලි හම්බ කර ගනීවි. එතකොට එයාගේ ප්‍රශ්න විසඳෙයි.''චාරුක කිව්වේ ය.

''ඒක නම් හොඳ අදහසක් එතකොට සඳලි නංගි සතුටින් ඉස්කෝලෙ ගිහින් හොඳට ඉගෙන ගනීවි.'' ඉඳුවර කීවේ ය.

''අයියේ ඔය ඉඩම ගැන අපි ප්‍රාදේශීය ලේකම්තුමා එක්ක කතා කරන්න ඕන නේ ද?''

''ඔව් මං අපේ ග්‍රාම නිලධාරීතුමා එක්ක මේ ගැන කතා කරලා හොඳ විදිහක් බලන්නම්. මල්ලිලා දෙන්නෙක් අපිත් එක්ක යමු.''

''හොඳයි අයියේ, අපි ගමේ ගෙවල්වලට ගිහින් මේ ගැන ගමේ අය දැනුවත් කරලා එයාලගේ කැමැත්ත ගමු.''

''හොඳයි අපි එහෙම කරමු.'' හැමෝ ම එකඟ වුණා.

පසුව දා උදෑසන සුනීර අයියා ග්‍රාම නිලධාරීතුමා හමු වෙලා තිබුණා. එතුමා කියලා තිබුණා ගමේ හැමෝ ම කැමති නම් ප්‍රාදේශීය ලේකම්තුමාගේ අවසරය මත ඒ ඉඩම් කෑල්ල අන්දිරිස් මාමාට දෙන්න පුළුවන් කියලා.

යාළුවෝ හැමෝ ම ගමේ ගෙවල්වලට ගිහින් විස්තර කරලා කාගේත් කැමැත්ත ගත්තා. පස්සේ සුනීර අයියා, ග්‍රාම නිලධාරීතුමා සහ යාළුවෝ අන්දිරිස් මාමාගේ ගෙදර ගියා.

''සුමනා, සුමනා, අර අර ග්‍රාම නිලධාරීතුමා ළමයි ටිකත් එක්ක මේ පැත්තට එනවා. මං ගෙදර නෑ කියපන්. පලයන් එසේ කියා ඔළුව කසමින් ගෙට රිංගා ගත්තා.''

අන්දිරිස්, පැදුරු මුල්ලේ හැංගුණා.

''සුමනා නැන්දේ, සඳලි නංගි,'' යාළුවෝ කතා කළා.

''ආ... මේ හසිඳු අයියලා නේ. එන්න, එන්න වාඩි වෙන්න.''

''නංගි, කෝ අප්පච්චි ඉන්නවා ද?''

''අම්මේ, අප්පච්චි''

''ආ... මේ අපේ ග්‍රාම නිලධාරීතුමා නේ, එන්න මහත්තයෝ,''

''එන්න පුතාලා, කෝ සුමනාවතී අන්දිරිස්, ඉන්නවා ද?.''

''මහත්තයෝ,'' අන්දිරිස්ට කර ගන්න දෙයක් නැති ව මේ අය ළඟට එන්න වුණා.

''ආ... මහත්තයෝ''

''ඔව් අන්දිරිස් අපි ආවේ අන්දිරිස් ව මුණ ගැහෙන්න. මේ ළමයි ටික තමයි මෙහෙම දෙයක් කරන්න යෝජනා කළේ.''

''අන්දිරිස්ගේ පපුව ගැහෙන්න ගත්තා ලබ් ඩබ් ලබ් ඩබ් අනේ මහත්තයෝ මං මුකුත් කළේ නැහැ නොවැ.''

''අන්දිරිස් මේ ගමේ හොරකම් කිහිපයක් ම වෙලා තියෙනවා. ගම්මුන් කියන්නේ නම් අන්දිරිස් උන්නැහේ කළා කියලා තම යි. ගමේ කීප දෙනෙක් ම දැකලා තියෙනවා. එතකොට මේ දුව ඉස්කෝලෙ යවන්නෙත් නැති ලු නේ ද?''

''අනේ, මේ මං,''

''මං, මං නෙවෙයි අන්දිරිස් මාමේ අපිට ඕන මාමා ගමේ හොඳ කෙනෙක් වෙනවා දකින්න. සඳලි නංගි පව් ඉස්කෝලේ යන්න, හොඳට ඉගෙන ගන්න, හරි ආස යි.''

''ඇයි මාමා මෙහෙම නරක වැඩ කරන්නේ?'' තරුෂ ඇහුවා.

''ඔව් අන්දිරිස් ඇයි මෙහෙම කරන්නේ?''

''අනේ අපේ මහත්තයෝ මගේ අතේ සතේ නෑ. බඩගින්නෙ වේලෙනවා. වතුර ටිකක් විතරයි සමහර වෙලාවට බඩගින්න නිවා ගන්න බොන්න තියෙන්නේ. මොකද ගොවිතැනක් කර ගන්න වත් හේනක් පැලක් නෑනෙ. මං කියලා මොනවා කරන්න ද? මහත්තයෝ, මේ පුතාලා ඉස්කෝලේ යනවා දකින කොට මගේ පපුව දාලා යනවා. මගේ පොඩි එකී ගෙදරට වෙලා ඉන්නවා''

''සුබ ආරංචියක් අරගෙන මේ පුංචි වීරයෝ ටික ආවේ.''

''මොකද කියනව නම් මේ දරුවෝ හරි ම වීර්යවන්ත යි. බොහො ම වෙහෙස වෙලා වීර ක්‍රියාවක් කළා. ඒ තමයි, අන්දිරිස්ට අද ඉඳලා ගමේ ප්‍රජාශාලාවට එහා පැත්තේ තියෙන ඉඩමේ වගා කරන්න පුළුවන්. බීජවලට ඕන කරන දේවල් මං අරගෙන දෙන්නම්. මේක සංවර්ධනය කර ගෙන පවුල ගොඩ නගා ගන්න මහන්සි වෙන්න.''

''ඔව් මාමේ මේ පුංචි වීරයෝ තමයි මේ යෝජනාව කරලා අපෙන් උපදේශ අරගෙන මේ සත්ක්‍රියාව කළේ, මේ ළමයින්ට තමයි ස්තුති කරන්න ඕනෑ.''

''ආ... සඳලි නංගි, ඔයාට ඉස්කෝලේ යන්න ඕන කරන හැමදේ ම මෙතන තියෙනවා. ඔයා සඳුදා ඉඳලා ඉස්කෝලෙ ගිහින් හොඳට ඉගෙන ගන්න. හොඳ තැනකට එන්න මහන්සි වෙන්න.'' චාරුක කීවේ ය.

''අනේ මගේ පුතාලාට කොහොම ස්තුති කරන්න ද මන්දා. මං පුතාලට ණයගැති යි. අද ඉඳලා ගොඩක් මහන්සි වෙලා මං වැඩ කරනවා. ගමේ හොඳ මිනිහෙක් වෙලා ජීවත් වෙනවා කියලා පුතාලට මං පොරොන්දු වෙනවා. ඇත්තම යි.''

''හොඳයි. මාමේ අපි යන්නම්.''

''මගේ පුතාලට යහපතක් ම වේවා.''

අන්දිරිස් එදා ඉඳලා සුමනා එක්ක මහන්සි වෙලා වැඩ කරලා ලස්සන එළවළු කොටුවක් දැම්මා.

මෑ කරල්, කැකිරි ගෙඩි, මඤ්ඤොක්කා, කුරහන්, තල, බඩඉරිඟු මේ කොටුවෙ පිරිලා තිබුණා. තමන්ට මෙහෙම දියුණු වෙන්න උදවු කළ පුංචි වීරයෝ ග්‍රාමසේවකතුමා අන්දිරිස් අමතක කළේ නැහැ. ඒ අයට හොඳ එළවළු මලු අරගෙන සුමනා හා සඳලි එක්ක බලන්න ගියා.

පුංචි වීරයන්ට කියා ගන්න බැරි තරම් සතුටු යි.

ගමේ ආයෙ හොරකම් වුණෙත් නැහැ. සඳලි ඉස්කෝලේ ගිහින් තම කුසලතා දියුණු කර ගත්තා.

සිරිපුර විදුහලේ විදුහල්පතිතුමා ගුරු දෙගුරු රැස්වීමේ දී චාරුක ඇතුළු යාළුවන්ගේ මේ වීර ක්‍රියාව ගැන කතා කළා. හැමෝ ම මේ පුංචි වීරයන්ට ප්‍රශංසා කළා. ගමේ හැමෝගෙ ම කතා බහට ලක් වුණේ මේ පුංචි වීරයන්ගේ හපන්කම් ගැන යි.

## ● මෙම කතාවෙන් ඉස්මතු වන කුසලතා

- කණ්ඩායම් වැඩ (Team work)
- නායකත්ව කුසලතා (Leadership Skills)
- ගැටලු විසඳීම (Problem Solving)
- කරුණාව (Kindness)
- සහයෝගිතාව (Collaboration)
- වෙහෙස මහන්සි වී වැඩ කිරීමට කැමැති වීම (Willingness to Work Hard)
- අනුවර්තනය වීමේ හැකියාව (Adaptability)
- පුද්ගල සම්බන්ධතා (Human Relations)
- අන්‍යයන්ට උපකාර කිරීම (Helping Others)

## ● ක්‍රියාකාරකම්

1. මෙම කතාවේ අන්දිරිස් මාමා පිළිබඳව ඔබට දැනෙන අදහස් ලියා දක්වන්න.
2. ඔබත් පුංචි වීරයෙක් නම් ඔබ අන්දිරිස් මාමා යහමගට ගැනීමට යෝජනා කරන්නේ කුමක් ද?
3. ඔබ යහළුවන් සමග එක් වී කරන්නට කැමති යහපත් ක්‍රියාවක් සැලසුම් කර එය පන්තියට ඉදිරිපත් කරන්න.
4. ඔබ සිදු කළ යහපත් උපකාරයක් පිළිබඳව පන්තිය ඉදිරියේ කතාවක් කරන්න.
5. ඔබ දෙමාපියන් සමග එක් ව සිදු කළ යහපත් ක්‍රියාවක් පිළිබඳව උදෑසන රැස්වීමේ දී කතාවක් ඉදිරිපත් කරන්න.

## දිවිය දිනන කතා
### ඇගයීම් පත්‍රිකා ආකෘතිය

කතාවේ නම............................................... දිනය.........................

| අනු අංකය | ඇගයීම් නිර්ණායක / නම | නිවැරදි උච්චාරණයෙන් යුතු ව කියවයි. | කතාව ආශ්‍රයෙන් අසන ප්‍රශ්නවලට පිළිතුරු සපයයි. | හුවමාරු කුසලතා හඳුනා ගෙන ප්‍රකාශ කරයි. | මනා නිමාවකින් යුතු ව නියමිත වේලාවට ක්‍රියාකාරකම් සිදු කර ඉදිරිපත් කරයි. | හුවමාරු කුසලතා ජීවිතයට බද්ධ කර ගනිමින් කටයුතු කරන බව ප්‍රදර්ශනය කරයි. | මුළු ලකුණු |
|---|---|---|---|---|---|---|---|
| | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |

### ලකුණු දීමේ නිර්ණායක සඳහා ප්‍රමිති

| ඇගයීම් නිර්ණායක | ලකුණු 20යි (ඉතා හොඳයි) | ලකුණු 15යි (හොඳයි) | ලකුණු 10යි (සතුටුදායකයි) | ලකුණු 05යි (සාමාන්‍යයයි) | ලකුණු 03යි (සංවර්ධනය විය යුතුයි) |
|---|---|---|---|---|---|
| නිවැරදි උච්චාරණයෙන් යුතු ව කියවයි. | වැරදීමට හැකි උපරිම වචන සංඛ්‍යාව 5කි. | වැරදීමට හැකි උපරිම වචන සංඛ්‍යාව 10කි. | වැරදීමට හැකි උපරිම වචන සංඛ්‍යාව 15කි. | වැරදීමට හැකි උපරිම වචන සංඛ්‍යාව 20කි. | වැරදීමට හැකි උපරිම වචන සංඛ්‍යාව 25ට වැඩි නම් |
| කතාව ආශ්‍රයෙන් අසන ප්‍රශ්නවලට පිළිතුරු සපයයි. | අසන ලද ප්‍රශ්න පහට ම නිවැරදි පිළිතුරු සපයයි. | අසන ලද ප්‍රශ්න පහෙන් හතරකට නිවැරදි පිළිතුරු සපයයි. | අසන ලද ප්‍රශ්න පහෙන් තුනකට නිවැරදි පිළිතුරු සපයයි. | අසන ලද ප්‍රශ්න පහෙන් දෙකකට නිවැරදි පිළිතුරු සපයයි. | අසන ලද ප්‍රශ්න පහෙන් එකකට නිවැරදි පිළිතුරු සපයයි. |
| හුවමාරු කුසලතා හඳුනා ගෙන ප්‍රකාශ කරයි. | කතාව ඇසුරෙන් හුවමාරු කුසලතා පහක් ප්‍රකාශ කරයි. | කතාව ඇසුරෙන් හුවමාරු කුසලතා හතරක් ප්‍රකාශ කරයි. | කතාව ඇසුරෙන් හුවමාරු කුසලතා තුනක් ප්‍රකාශ කරයි. | කතාව ඇසුරෙන් හුවමාරු කුසලතා දෙකක් ප්‍රකාශ කරයි. | කතාව ඇසුරෙන් හුවමාරු කුසලතා එකක් ප්‍රකාශ කරයි. |
| මනා නිමාවකින් යුතු ව නියමිත වේලාවට ක්‍රියාකාරකම් සිදු කර ඉදිරිපත් කරයි. | ක්‍රියාකාරකම් පහක් සම්පූර්ණ කරයි. | ක්‍රියාකාරකම් හතරක් සම්පූර්ණ කරයි. | ක්‍රියාකාරකම් තුනක් සම්පූර්ණ කරයි. | ක්‍රියාකාරකම් දෙකක් සම්පූර්ණ කරයි. | ක්‍රියාකාරකම් එකක් සම්පූර්ණ කරයි. |
| හුවමාරු කුසලතා ජීවිතයට බද්ධ කර ගනිමින් කටයුතු කරන බව ප්‍රදර්ශනය කරයි. | හුවමාරු කුසලතා පහකට වැඩි ප්‍රමාණයක් හැසිරීමේ දී ප්‍රදර්ශනය කරයි. | හුවමාරු කුසලතා හතරකට වැඩි ප්‍රමාණයක් හැසිරීමේ දී ප්‍රදර්ශනය කරයි. | හුවමාරු කුසලතා තුනකට වැඩි ප්‍රමාණයක් හැසිරීමේ දී ප්‍රදර්ශනය කරයි. | හුවමාරු කුසලතා දෙකකට වැඩි ප්‍රමාණයක් හැසිරීමේ දී ප්‍රදර්ශනය කරයි. | හුවමාරු කුසලතා එකකට වැඩි ප්‍රමාණයක් හැසිරීමේ දී ප්‍රදර්ශනය කරයි. |

- ශිෂ්‍යයා වඩාත් කැමැති නිර්මාණයක් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
  කතාවක් නිර්මාණය කිරීම/නාට්‍ය පිටපතක් නිර්මාණය කිරීම/නාට්‍යයක් රඟ දැක්වීම/වීඩියෝ පටයක් නිර්මාණය කිරීම/පුවත්පතකට ලිපියක් සකස් කර පළ කිරීම/ගීතයක් නිර්මාණය කිරීම/ කවි පන්තියක් නිර්මාණය කිරීම
  ලකුණු 100යි.



# 8 මිනිස්සු

විකුම් සෙනෙවිරත්න සුප්‍රකට චිත්‍රපට අධ්‍යක්ෂවරයෙකි. ඔහුට තම නවතම සිනමා නිර්මාණය සඳහා ගැමි පරිසරයක පිහිටි වඩුමඩුවක් අවශ්‍ය විය. සෙනෙවිරත්න මහතා තම මිතුරකු ද කැටුව තම සිනමා පටයට ගැළපෙන ආකාරයේ වඩුමඩුවක් සොයා ඈත ගම්බද ප්‍රදේශවල සංචාරය කළේ ය. අවසානයේ කුරුණෑගල ප්‍රදේශයේ දී තම සිතෙහි ඇඳි වඩුමඩුව හමු විය. වෙල් යායකින් එගොඩ පිහිටි සුන්දර පරිසරයක ඒ වඩුමඩුව පිහිටියේ ය. සෙනෙවිරත්න මහතා තම මිතුරා ද කැටුව වඩුමඩුවට යන විට සරමක් හැඳි තරුණයෙක් ලීයක් යතු ගාමින් සිටියේ ය. ගමට ම ඔබින බසකින් කතා කිරීමට සිතූ සෙනෙවිරත්න මහතා තරුණයා ඇමතුවේ ය.

සෙනෙවිරත්න මහතා - මලේ අපි ආවේ කොළඹ ඉඳන්. මම චිත්‍රපට අධ්‍යක්ෂවරයෙක්. අපි අලුත් චිත්‍රපටයක් හදනවා. ඒකට මේ වගේ වඩුමඩුවක් හොයනවා. දෙන්න බැරි ද මේ වඩුමඩුව දවස් දෙකකට විතර.

තරුණයා - අනේ! මහත්තයො, ඒක ලොකු වැඩක් යැ. ගන්න පුළුවන්. ඒත් මේ වඩුමඩුව අපේ තාත්තාගෙ. තාත්තා ගෙදරට ගිහින් එන්න ගියා. දැන් එයි. ආවා ම අපි කතා කරමුකො.

මිනිත්තු කිහිපයක් ගත වන විට තරුණයාගේ පියා පැමිණියේ ය. තරුණයා විසින් ආගන්තුකයන් පැමිණි කාරණය තම පියාට විස්තර කරන ලදි. පියාගේ ප්‍රතිචාරය ද සුබවාදී විය.

තරුණයාගේ පියා - අනේ! ඒක මොකක් ද මහත්තයා. ඕන දවසක් පාවිච්චි කරන්න. පුතේ මේ මහත්තුරු ගෙදරට එක්ක ගෙන ගිහින් තේ ටිකක් හදලා දෙන්නකො අම්මට කියලා.

තේ පානයට කළ ආරාධනය පිළිගත් සෙනෙවිරත්න මහතා ද මිතුරා ද තරුණයා කැටුව වඩුමඩුවට මඳක් ඈතින් පිහිටි නිවස වෙත ගියහ. පැරණි පන්නයේ අලංකාර නිවස ඉදිරියේ ගස් සෙවණක තිබූ බංකුවක සෙනෙවිරත්න මහතා සහ මිතුරා වාඩි වූයේ එහි වූ සිසිලස නිසා ම ය. ගෙවත්ත එළවළු, පලතුරු හා මල් වර්ගවලින් පිරී තිබිණ. තරුණයාගේ සහෝදරයකු යයි සිතිය හැකි තරුණයකු ඈත එළවළු පාත්තියක යම් කාර්යයක නිරත ව සිටිනු පෙනිණ. තේ පැන් සංග්‍රහය සූදානම් වන තුරු සෙනෙවිරත්න මහතා තරුණයා සමග කතාවට වැටුණේ ය.

සෙනෙවිරත්න මහතා - තාත්තගෙ ද මල්ලි, එතකොට මේ වඩුමඩුව?

තරුණයා - ඔව් මහත්තයා මමයි මල්ලියි නිවාඩු දවස්වලට ඇවිත් තාත්තට උදව් කරනවා.

සෙනෙවිරත්න මහතා - එතකොට මල්ලි වෙන රස්සාවක් කරනව ද?

තරුණයා - ඔව් මහත්තයා මම මෙහෙ ඉස්පිරිතාලෙ වැඩ කරන්නෙ.



සෙනෙවිරත්න මහතා - ඉස්පිරිතාලෙ මොකද කරන්නෙ?

තරුණයා - මම ඒ ඉස්පිරිතාලෙ ප්‍රධාන වෛද්‍ය නිලධාරියා. ඉස්පිරිතාලෙ වැඩ ඉවර වෙලා ඇවිත් තමයි මේ වැඩ කරන්නෙ. මල්ලි මෙහෙ ප්‍රාදේශීය ලේකම්. එයාටත් අද නිවාඩු. මල්ලි තමයි අර එළවළු පාත්තියෙ ඉන්නෙ.

සෙනෙවිරත්න මහතා මිතුරාගේ මුහුණ දෙසත් මිතුරා සෙනෙවිරත්න මහතාගේ මුහුණ දෙසත් බැලුවේ විස්මයානුකූල දෙනෙතිනි.

## ● මෙම කතාවෙන් ඉස්මතු වන කුසලතා

- සහයෝගිතාව (Co-operation)
- සහකම්පනය (Empathy)
- පුද්ගල සම්බන්ධතා (Human Relations)
- ඔබේ තත්ත්වය අධිතක්සේරු කිරීමට වඩා අනුවර්තනය වීම (Adapt to your circumstances rather than over estimating them)
- ඔබ ඔබගේ කාලය අපතේ නො හරින්න (Ensure that you utilize your time wisely)
- අන්‍යයන්ට උපකාර කිරීම (Helping others)

## ● ක්‍රියාකාරකම්

1. ''මිනිස්සු'' කතාව ඔබේ පවුලේ අය ඉදිරියේ පවසන්න.

- ඔබේ සහෝදරයන්ගේ ප්‍රතිචාර සටහන් කර ගන්න.
- ඔබේ දෙමව්පියන්ගේ ප්‍රතිචාර සටහන් කර ගන්න.
- එම ප්‍රතිචාර පන්තිය ඉදිරියේ ඉදිරිපත් කරන්න.

2. ''මිනිස්සු'' කතාව පන්තියේ ඔබේ මිතුරන් හා එක් ව භූමිකා රංගනයක් ආකාරයෙන් පන්තියට ඉදිරිපත් කරන්න.
3. මේ කතාව කියවා ඔබ උගත් දේ (ආදර්ශ) පන්තියට ඉදිරිපත් කරන්න.
4. ඔබේ මිතුරන්, පවුලේ සාමාජිකයන් මුහුණ දුන් මෙබඳු අද්දැකීම් අසා දැන ගන්න. එම සිදුවීම් පන්තියට ඉදිරිපත් කරන්න.

## දිවිය දිනන කතා
## ඇගයීම් පත්‍රිකා ආකෘතිය

කතාවේ නම................................................. දිනය..........................

| අනු අංකය | ඇගයීම් නිර්ණායක / නම | නිවැරදි උච්චාරණයෙන් යුතු ව කියවයි. | කතාව ආශ්‍රයෙන් අසන ප්‍රශ්නවලට පිළිතුරු සපයයි. | හුවමාරු කුසලතා හඳුනා ගෙන ප්‍රකාශ කරයි. | මනා නිමාවකින් යුතු ව නියමිත වේලාවට ක්‍රියාකාරකම් සිදු කර ඉදිරිපත් කරයි. | හුවමාරු කුසලතා ජීවිතයට බද්ධ කර ගනිමින් කටයුතු කරන බව ප්‍රදර්ශනය කරයි. | මුළු ලකුණු |
|---|---|---|---|---|---|---|---|
| | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |

### ලකුණු දීමේ නිර්ණායක සඳහා ප්‍රමිති

| ඇගයීම් නිර්ණායක | ලකුණු 20යි (ඉතා හොඳයි) | ලකුණු 15යි (හොඳයි) | ලකුණු 10යි (සතුටුදායකයි) | ලකුණු 05යි (සාමාන්‍යයයි) | ලකුණු 03යි (සංවර්ධනය විය යුතුයි) |
|---|---|---|---|---|---|
| නිවැරදි උච්චාරණයෙන් යුතු ව කියවයි. | වැරදීමට හැකි උපරිම වචන සංඛ්‍යාව 5කි. | වැරදීමට හැකි උපරිම වචන සංඛ්‍යාව 10කි. | වැරදීමට හැකි උපරිම වචන සංඛ්‍යාව 15කි. | වැරදීමට හැකි උපරිම වචන සංඛ්‍යාව 20කි. | වැරදීමට හැකි උපරිම වචන සංඛ්‍යාව 25ට වැඩි නම් |
| කතාව ආශ්‍රයෙන් අසන ප්‍රශ්නවලට පිළිතුරු සපයයි. | අසන ලද ප්‍රශ්න පහට ම නිවැරදි පිළිතුරු සපයයි. | අසන ලද ප්‍රශ්න පහෙන් හතරකට නිවැරදි පිළිතුරු සපයයි. | අසන ලද ප්‍රශ්න පහෙන් තුනකට නිවැරදි පිළිතුරු සපයයි. | අසන ලද ප්‍රශ්න පහෙන් දෙකකට නිවැරදි පිළිතුරු සපයයි. | අසන ලද ප්‍රශ්න පහෙන් එකකට නිවැරදි පිළිතුරු සපයයි. |
| හුවමාරු කුසලතා හඳුනා ගෙන ප්‍රකාශ කරයි. | කතාව ඇසුරෙන් හුවමාරු කුසලතා පහක් ප්‍රකාශ කරයි. | කතාව ඇසුරෙන් හුවමාරු කුසලතා හතරක් ප්‍රකාශ කරයි. | කතාව ඇසුරෙන් හුවමාරු කුසලතා තුනක් ප්‍රකාශ කරයි. | කතාව ඇසුරෙන් හුවමාරු කුසලතා දෙකක් ප්‍රකාශ කරයි. | කතාව ඇසුරෙන් හුවමාරු කුසලතා එකක් ප්‍රකාශ කරයි. |
| මනා නිමාවකින් යුතු ව නියමිත වේලාවට ක්‍රියාකාරකම් සිදු කර ඉදිරිපත් කරයි. | ක්‍රියාකාරකම් පහක් සම්පූර්ණ කරයි. | ක්‍රියාකාරකම් හතරක් සම්පූර්ණ කරයි. | ක්‍රියාකාරකම් තුනක් සම්පූර්ණ කරයි. | ක්‍රියාකාරකම් දෙකක් සම්පූර්ණ කරයි. | ක්‍රියාකාරකම් එකක් සම්පූර්ණ කරයි. |
| හුවමාරු කුසලතා ජීවිතයට බද්ධ කර ගනිමින් කටයුතු කරන බව ප්‍රදර්ශනය කරයි. | හුවමාරු කුසලතා පහකට වැඩි ප්‍රමාණයක් හැසිරීමේ දී ප්‍රදර්ශනය කරයි. | හුවමාරු කුසලතා හතරකට වැඩි ප්‍රමාණයක් හැසිරීමේ දී ප්‍රදර්ශනය කරයි. | හුවමාරු කුසලතා තුනකට වැඩි ප්‍රමාණයක් හැසිරීමේ දී ප්‍රදර්ශනය කරයි. | හුවමාරු කුසලතා දෙකකට වැඩි ප්‍රමාණයක් හැසිරීමේ දී ප්‍රදර්ශනය කරයි. | හුවමාරු කුසලතා එකකට වැඩි ප්‍රමාණයක් හැසිරීමේ දී ප්‍රදර්ශනය කරයි. |

- ශිෂ්‍යයා වඩාත් කැමැති නිර්මාණයක් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
  කතාවක් නිර්මාණය කිරීම/නාට්‍ය පිටපතක් නිර්මාණය කිරීම/නාට්‍යයක් රඟ දැක්වීම/වීඩියෝ පටයක් නිර්මාණය කිරීම/පුවත්පතකට ලිපියක් සකස් කර පළ කිරීම/ගීතයක් නිර්මාණය කිරීම/ කවි පන්තියක් නිර්මාණය කිරීම
  ලකුණු 100යි.



# 9 අපෙන් අකුරු උදුරගන්න 'කොරෝනා'ට බැරි වුණා


කවුරුවත් හිතපු නැති විදියට 'කොරෝනා' වසංගතය ලංකාවේ පැතිරෙන විට හසිත හිටියේ හයේ පන්තියේ. හසිතයි අම්මයි තාත්තයි නංගියි මල්ලිලා දෙන්නයි ජීවත් වුණේ දෙමටගොඩ දුම්රිය මාර්ගය දෙපස තියෙන කුඩා නිවාසවලින් එකක. හසිතගේ අම්මා වැඩ කළේ නගර සභාවෙ පිරිසිදු කරන්නියක් ලෙස. තාත්තා දෙමටගොඩ දුම්රිය පොළේ පුංචි වඩේ කඩයක් දාගෙන හිටියා.

ඉතින් ඔන්න 'කොරෝනා' ආවා. පාසල් වැසී ගියා. හසිතලාට පාසල් යන්න විදියක් නැතිව ගියා. අම්මලා තාත්තලාගේ ආදායම් මාර්ග අවහිර වුණා. පාසල් වැසිලා ටික කාලයකින් හසිතලගේ පුංචි පාසලේ ගුරුතුමී අන්තර්ජාලය මාර්ගයෙන් උගන්වන බව ආරංචි වුණා. හයේ පන්තියේ ළමයි හැමෝ ම පරිගණකයෙන් හෝ ජංගම දුරකතනයෙන් අන්තර්ජාලයට සම්බන්ධ වෙලා ගුරුතුමී දෙන අභ්‍යාස කළ යුතු ලු.

හසිතගේ තාත්තා ළඟ පුංචි සුහුරු ජංගම දුරකතනයක් තිබුණා. ඒකෙන් අන්තර්ජාලයට සම්බන්ධ වෙන්න හැකියාව තිබුණා. හසිතගෙ නිවස අවට කුඩා නිවාසවල හසිතගෙ පන්තියෙ යාළුවො හය දෙනෙක් හිටියා. ඒත් ඒ කාටවත් සුහුරු ජංගම දුරකතන තිබුණෙ නෑ.

හසිතගේ තාත්තාගේ දුරකතනයටත් කාඩ් දමාගන්න තාත්තා ළඟ මුදල් තිබුණෙ නෑ. ''දැන් අපි මොකද කරන්නෙ" හසිත කල්පනා කළා. හසිතලා හැමදා ම හවසට සෙල්ලම් කළේ දෙමටගොඩ දුම්රිය පොළ පිටුපස පුංචි පිට්ටනියේ. හසිත එයාගේ යාළුවො ටික එතැනට කැඳෙව්වා. මීටරේ දුරින් හිටගන්න කිව්වා.

''අපේ තාත්තා ළඟ ස්මාර්ට් ෆෝන් එකක් තියෙනවා. මම ටීචර් එවන පාඩම් හැමදා ම හවසට ඔයාලට කියලා දෙන්නම්" හසිත කිව්වා.



යාළුවන්ගේ මුහුණු සතුටින් එළිය වැටුණා. හසිත තමයි හැමදා ම හයේ පන්තියෙ පළවෙනියා. ගුරුවරු උගන්වන ඕන ම දෙයක් එක පාරින් ම තේරුම් ගන්න හසිතට පුළුවන් කියලා යාළුවෝ දැනගෙන හිටියා. ඒ වගේ ම යාළුවෝ හැමෝ ම පාසලේ අමාරු දේවල් අහගත්තේ හසිතගෙන්. ඕන ම අමාරු දෙයක් පැහැදිලි කරලා කියලා දෙන්නත් හසිතට පුළුවන්කම තිබුණා.

"ඒත් පොඩි ප්‍රශ්නයක් තියෙනවා. අපේ තාත්තාගේ ෆෝන් එකට කාඩ් දාන්න සල්ලි නෑ."

"අයියෝ..." යාළුවො දුකෙන් කිව්වා.

"දුක් වෙන්න එපා. මම ඒකටත් විසඳුමක් කල්පනා කළා." හසිත පැහැදිලි කළා.

"කොරෝනා නිසා කඩවලින් බඩු ගන්න යන්න හැමෝට ම බෑ. එහා පාරෙ සිරිල් මුදලාලිගෙ කඩේ බඩු විකුණාගන්න විදියක් නෑ කියලා සිරිල් මුදලාලි අපේ තාත්තාට කිව්වලු. අපි මෙහෙම වැඩක් කරමු. එහා පාරෙ නෝනලාගේ මහත්වරුන්ගේ ගෙවල්වලට ඕන කරන බඩු ලයිස්තුව අපේ තාත්තගේ ෆෝන් එකට එවන්න කියමු."

"ඇයි සිරිල් මුදලාලිට ෆෝන් එකක් නැද්ද ?" නිපුණි අතුරු ප්‍රශ්නයක් ඇහුවා.

"නෑ. මුදලාලිට දැන් වයස යි. ෆෝන් පාවිච්චි කරන්නෙත් නැහැ. ඉන්නෙත් තනියම. කඩේ වැඩ කරන අයියලා දෙන්නත් එන්නෙ නැහැ ලු කොරෝනා නිසා" හසිත පැහැදිලි කළා.

"ඉතින් ඉතින් කියන්නකො" වරුණ උනන්දුවෙන් කිව්වා.

"ඉතින් එහෙම බඩු ලයිස්තු එව්වා ම අපි සිරිල් මුදලාලිගේ කඩෙන් ඒ බඩු ටික අරගෙන, අපේ තාත්තගේ අත් කරත්තෙ දාගෙන, ඒ නියමිත ගෙදරට ගිහින් දෙමු. දවසකට අපි දෙන්නා ගානෙ මාරුවෙන් මාරුවට වැඩ කරමු. "


ඒක හොඳ යෝජනාවක් බව යාළුවන්ට තේරුණා.

"ඒත් ඒකෙන් අපට ලැබෙන ප්‍රයෝජනය මොකක්ද ? අනෙක, එහෙම සල්ලි පස්සෙ දෙනකම් බඩු දෙන්න සිරිල් මුදලාලි කැමති වෙයි ද?" දසුනි ඇහුවා.

"මම මේ අදහස තාත්තාට කිව්වා. තාත්තා සිරිල් මුදලාලිගෙන් ඇහුවා. මුදලාලි වැඩේට කැමති යි. අපි බඩු ගිහින් දෙනවට එක බඩු මල්ලකට රු.20 ගානෙ අපට දෙන්නත් සිරිල් මුදලාලි පොරොන්දු වුණා. සිරිල් මුදලාලි එහා පාරෙ නෝනලා මහත්වරුන්ට පණිවිඩයක් යැව්වලු මේ ගැන. එයාලත් වැඩේට කැමතියි." හසිත කිව්වා.

ඉතින් ප්‍රදේශයේ මහජන සෞඛ්‍ය පරීක්ෂක මහත්තයාගෙනුත් අවසර අරගෙන හසිතලා වැඩේ පටන් ගත්තා. මේ පුංචි දරුවෝ ඉගෙන ගන්න, ගන්නා උත්සාහය හැමෝ ම අගය කළා. කොරෝනා වෛරසයෙන් ආරක්ෂා වෙන්න අනුගමනය කළ යුතු දේවල් මහජන සෞඛ්‍ය පරීක්ෂකතුමා හසිතලාට කියලා දුන්නා. ඒ විතරක් නෙවෙයි එතුමා මුහුණු ආවරණ කිහිපයක් සහ අත සෝදන දියර බෝතලයකුත් හසිතලාට දුන්නා.

මේ විදියට තාත්තගේ ෆෝන් එකට කාඩ් ගන්න අවශ්‍ය මුදල් සොයා ගන්න හසිතලාට පුළුවන් වුණා. ඉතින් දැන් අන්තර්ජාලය මාර්ගයෙන් ගුරුතුමී එවන පාඩම් හසිත හොඳින් ඉගෙන ගන්නවා. ඊට පස්සේ හවසට යාළුවො ටික රැස් කරලා මීටරේ දුරින් වාඩි කරලා ඒ පාඩම් කියලා දෙනවා. යාළුවන්ට කියලා දෙන නිසා හසිතට ඒ පාඩම් තවත් හොඳින් මතක හිටියා. යාළුවො කරන අභ්‍යාස ටිකත් හසිත ජංගම දුරකතනය මාර්ගයෙන් ගුරුතුමියට යැව්වා.



ගුරුතුමිය ඒවා හරි වැරදි සලකුණු කරලා එව්වා. හසිතගෙත් මිතුරන්ගෙත් උනන්දුව ගුරුතුමිය ගොඩක් අගය කළා. ඉතින් මේ විදියට හසිතයි එයාගේ යාළුවොයි හරි ම සතුටින් පාඩම් වැඩ එකක් වත් මග නො හැර ඉගෙන ගත්තා. ඒ නිසා හසිතලාගේ අධ්‍යාපනය උදුරා ගන්න කොරෝනාවට බැරි වුණා.

## ● මෙම කතාවෙන් ඉස්මතු වන කුසලතා

- කණ්ඩායමක් ලෙස වැඩ කිරීම (Team work)
- නායකත්ව කුසලතා (Leadership Skills)
- මූල්‍ය කළමනාකරණය (Financial Management)
- විකුණුම් සහ අලෙවිකරණය (Sales and Marketing)
- විශ්වසනීයත්වය (Dependability)
- අභිප්‍රේරණය (පෙලඹ වීම) හා උද්යෝගය (Motivation and Enthusiasm)
- අන්‍යයන්ට උපකාර කිරීම (Helping Others)
- උපායශීලී බව (Tactical)
- අනුවර්තනය වීමේ හැකියාව (Adaptability)
- තීරණ ගැනීම (Decision Making)
- සැලසුම්කරණය (Planning)
- සහයෝගිතාව (Co-operation)
- සහකම්පනය (Empathy)
- තොරතුරු සාක්ෂරතාව (Information Literacy)

## ● ක්‍රියාකාරකම්

1. මේ කතාවේ හසිත ළඟ ඇති හොඳ ගුණාංග ලියන්න
2. ඔබ ඉගෙන ගන්නා දේ මිතුරන්ට කියා දීමෙන් ඔබට ලැබෙන ප්‍රයෝජන ලියන්න.
3. ඔබට මුහුණ දීමට සිදු වූ මෙවැනි වෙනත් අභියෝගයක් ජය ගත් හැටි විස්තර කරන්න.
4. අභියෝග ජය ගැනීම සඳහා අප විසින් වර්ධනය කර ගත යුතු කුසලතා මොනවා ද?

## දිවිය දිනන කතා
### ඇගයීම් පත්‍රිකා ආකෘතිය

කතාවේ නම................................................ දිනය.........................

| අනු අංකය | ඇගයීම් නිර්ණායක / නම | නිවැරදි උච්චාරණයෙන් යුතු ව කියවයි. | කතාව ආශ්‍රයෙන් අසන ප්‍රශ්නවලට පිළිතුරු සපයයි. | හුවමාරු කුසලතා හඳුනා ගෙන ප්‍රකාශ කරයි. | මනා නිමාවකින් යුතු ව නියමිත වේලාවට ක්‍රියාකාරකම් සිදු කර ඉදිරිපත් කරයි. | හුවමාරු කුසලතා ජීවිතයට බද්ධ කර ගනිමින් කටයුතු කරන බව ප්‍රදර්ශනය කරයි. | මුළු ලකුණු |
|---|---|---|---|---|---|---|---|
| | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |

### ලකුණු දීමේ නිර්ණායක සඳහා ප්‍රමිති

| ඇගයීම් නිර්ණායක | ලකුණු 20යි (ඉතා හොඳයි) | ලකුණු 15යි (හොඳයි) | ලකුණු 10යි (සතුටුදායකයි) | ලකුණු 05යි (සාමාන්‍යයයි) | ලකුණු 03යි (සංවර්ධනය විය යුතුයි) |
|---|---|---|---|---|---|
| නිවැරදි උච්චාරණයෙන් යුතු ව කියවයි. | වැරදීමට හැකි උපරිම වචන සංඛ්‍යාව 5කි. | වැරදීමට හැකි උපරිම වචන සංඛ්‍යාව 10කි. | වැරදීමට හැකි උපරිම වචන සංඛ්‍යාව 15කි. | වැරදීමට හැකි උපරිම වචන සංඛ්‍යාව 20කි. | වැරදීමට හැකි උපරිම වචන සංඛ්‍යාව 25ට වැඩි නම් |
| කතාව ආශ්‍රයෙන් අසන ප්‍රශ්නවලට පිළිතුරු සපයයි. | අසන ලද ප්‍රශ්න පහට ම නිවැරදි පිළිතුරු සපයයි. | අසන ලද ප්‍රශ්න පහෙන් හතරකට නිවැරදි පිළිතුරු සපයයි. | අසන ලද ප්‍රශ්න පහෙන් තුනකට නිවැරදි පිළිතුරු සපයයි. | අසන ලද ප්‍රශ්න පහෙන් දෙකකට නිවැරදි පිළිතුරු සපයයි. | අසන ලද ප්‍රශ්න පහෙන් එකකට නිවැරදි පිළිතුරු සපයයි. |
| හුවමාරු කුසලතා හඳුනා ගෙන ප්‍රකාශ කරයි. | කතාව ඇසුරෙන් හුවමාරු කුසලතා පහක් ප්‍රකාශ කරයි. | කතාව ඇසුරෙන් හුවමාරු කුසලතා හතරක් ප්‍රකාශ කරයි. | කතාව ඇසුරෙන් හුවමාරු කුසලතා තුනක් ප්‍රකාශ කරයි. | කතාව ඇසුරෙන් හුවමාරු කුසලතා දෙකක් ප්‍රකාශ කරයි. | කතාව ඇසුරෙන් හුවමාරු කුසලතා එකක් ප්‍රකාශ කරයි. |
| මනා නිමාවකින් යුතු ව නියමිත වේලාවට ක්‍රියාකාරකම් සිදු කර ඉදිරිපත් කරයි. | ක්‍රියාකාරකම් පහක් සම්පූර්ණ කරයි. | ක්‍රියාකාරකම් හතරක් සම්පූර්ණ කරයි. | ක්‍රියාකාරකම් තුනක් සම්පූර්ණ කරයි. | ක්‍රියාකාරකම් දෙකක් සම්පූර්ණ කරයි. | ක්‍රියාකාරකම් එකක් සම්පූර්ණ කරයි. |
| හුවමාරු කුසලතා ජීවිතයට බද්ධ කර ගනිමින් කටයුතු කරන බව ප්‍රදර්ශනය කරයි. | හුවමාරු කුසලතා පහකට වැඩි ප්‍රමාණයක් හැසිරීමේ දී ප්‍රදර්ශනය කරයි. | හුවමාරු කුසලතා හතරකට වැඩි ප්‍රමාණයක් හැසිරීමේ දී ප්‍රදර්ශනය කරයි. | හුවමාරු කුසලතා තුනකට වැඩි ප්‍රමාණයක් හැසිරීමේ දී ප්‍රදර්ශනය කරයි. | හුවමාරු කුසලතා දෙකකට වැඩි ප්‍රමාණයක් හැසිරීමේ දී ප්‍රදර්ශනය කරයි. | හුවමාරු කුසලතා එකකට වැඩි ප්‍රමාණයක් හැසිරීමේ දී ප්‍රදර්ශනය කරයි. |

- ශිෂ්‍යයා වඩාත් කැමැති නිර්මාණයක් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
  කතාවක් නිර්මාණය කිරීම/නාට්‍ය පිටපතක් නිර්මාණය කිරීම/නාට්‍යයක් රඟ දැක්වීම/වීඩියෝ පටයක් නිර්මාණය කිරීම/පුවත්පතකට ලිපියක් සකස් කර පළ කිරීම/ගීතයක් නිර්මාණය කිරීම/ කවි පන්තියක් නිර්මාණය කිරීම
  ලකුණු 100යි.



# 10 ශීතාගාරයක සිර වී...

මලිත්, දෙමාපියන් සහ තමන්ගේ නංගි ද සමග බොහෝ සතුටින් ජීවත් වුණා. ඔහු හරි ම ක්‍රියාශීලී වගේ ම සුහදශීලී තරුණයෙක්. හොඳ අධ්‍යාපනයක් ද ලබා තිබුණා. මලිත් රැකියාව කළේ මත්ස්‍ය ව්‍යාපාරය හා සම්බන්ධ ආයතනයක ප්‍රධාන කාර්යාලයේ. ඔහු ඒ කාර්යාලයේ දෙවෙනියා. ප්‍රධාන කාර්යාලය පිහිටා තිබුණේ මිනිසුන් දහස් ගණනක් යන එන විශාල සාප්පු සංකීර්ණයක දෙවන මහලේ. ඔහු හැම දවසක ම තම රැකියාවට ගියේ හරි ම සතුටින්. කාර්යාලයේ කවුරුත් ඔහු සමග සුහද යි. සෑම දිනක ම උදෑසන යන විටත් රැකියාව නිම වී ආපසු එන විටත් සාප්පු සංකීර්ණයේ දොරටුවේ සිටි ආරක්ෂක නිලධාරියාට සුබ පතන්නත් හිනා වෙන්නත් ඇතැම් දිනක විහිළුවක් කරන්නත් මලිත් අමතක කළේ නැහැ. ආරක්ෂක නිලධාරියාත් මලිත්ට පෙරළා ප්‍රතිචාර දැක්වූවා. මලිත් තම වැටුපෙන් නංගිගේ අධ්‍යාපන කටයුතුවලට වැය කළා. දෙමාපියන්ට සැලකුවා. ඒ අතර අනාගතය සඳහා ඉතිරි කරන්නත් අමතක කළේ නැහැ.

ඒත් එක දවසක නො සිතූ දෙයක් සිදු වුණා. එදා මලිත් දවසේ වැඩ අවසන් වෙලා පැමිණීමේ ලේඛනයේ පිට වීමත් සටහන් කොට තම මිතුරකු පැමිණෙන තුරු හිඳ ගෙන සිටියා. ඔහු දැක්කා එළියේ තිබුණු මාළු පෙට්ටියක්. ඒක ශීතාගාරයෙන් තියන්න සේවකයන්ට අමතක වෙලා. මලිත් මාළු පෙට්ටියත් රැගෙන ශීතාගාරයට ගියා. ඒක කුඩා ශීතාගාරයක්. විවිධ මාළු වර්ගවල සාම්පල් තියන්න තමයි ඒක භාවිත කළේ. මලිත් මාළු පෙට්ටිය, ඇතුළේ තිබුණු රාක්කයක තිබ්බා. තැන්තැන්වල තිබුණු මාළු පෙට්ටි කිහිපයකුත් පිළිවෙළට ඇසුරුවා. සාමාන්‍යයෙන් කාර්යාලයේ ප්‍රධානියා තමයි අවසානයට එයින් පිට වෙන්නේ. ඔහු දැක්කා බාගෙට විවෘත ව තිබුණු ශීතාගාරය. ඔහු එය අගුළු දැම්මා. ඔහු දැන ගෙන හිටියේ නැහැ මලිත් ඇතුළේ සිටි බව. ප්‍රධානියා කාර්යාලය ද වසා දමා පිටව ගියා.



මලිත් සිය කාර්යය අවසන් කර දොර අසලට ආවා. දොර විවෘත කරන්නට උත්සාහ කළා. කුමක් හෝ වැරැද්දක් සිදු ව ඇති බව මලිත්ට තේරුණා. ඔහු දොරට ගැහුවා. කෑගැසුවා. ඒත් එළියෙන් කිසි ම ප්‍රතිචාරයක් නැහැ. කුමක් කරන්න ද මලිත්ට සිතා ගන්න බැරිව ගියා. දුරකතනය සෙවුවා. එතකොටයි මතක් වුණේ දුරකතනය ශීතාගාරය ඇතුළට රැගෙන නො ආ බව. අද සෙනසුරාදා නැවත කාර්යාලය විවෘත කරන්නේ සඳුදා. එතෙක් ශීතාගාරය තුළ කිසිවෙක් ජීවත් ව නො සිටින බව මලිත්ට දැනුණා. මලිත් මාළු පෙට්ටි අතර අතරමං වුණා. මලිත් වෙලාව බැලුවා. රාත්‍රී 11.00 යි.

ඒ අතර මලිත්ගේ දෙමාපියන් ඔහුගේ ප්‍රමාදය ගැන කලබල වී සිටියා. වරින් වර දුරකතන ඇමතුම් ගත්තත් නාද වීම මිස ප්‍රතිචාරයක් නැහැ. වෙනදා රාත්‍රී 10.00ට පමණ පැමිණෙන තම පුතු තව මත් නො පැමිණීම ඔවුන්ට මහත් ගැටලුවක්. මලිත්ගේ මිතුරා ද වරින් වර දුරකතන ඇමතුම් ගත්ත ද මලිත්ගෙන් ප්‍රතිචාරයක් නො ලැබීම ගැන කලබල වුණා. ඔහු මලිත්ගේ නිවසට ද කතා කළා. දෙමාපියන් ද කලබල වී ඇති බව දැන ගත් ඔහු මලිත්ගේ නිවසට ගියා. මලිත් ඇසුරු කරන අනෙක් මිතුරන්ට ද කතා කළා. ඔවුන් ද පැවසුවේ මලිත් අද දින මුණ නො ගැසුණු බව යි.

මලිත්ගේ මිතුරා නැවත සාප්පු සංකීර්ණය අසලට ගොස් එහි සිටි ආරක්ෂක නිලධාරියාගෙන් මලිත් ගැන විමසුවා. තමන් සේවයට පැමිණියේ රාත්‍රී 12.00ට බවත් ඒ වන විට සියලු කාර්යාල හා සාප්පු වසා තිබුණු බවත් ඔහු පැවසුවා. දැන් වෙලාව රාත්‍රී 1.00 යි.

මලිත්ට දැන් නම් හොඳට ම අමාරු යි. දෑත දෙපය ගල් ගැහිලා වගේ. ශීතල උහුලන්න බැහැ. ඔහු ශීතලෙන් මිදීම සඳහා ව්‍යායාම කරන්න පටන් ගත්තා. ඒත් ටික වෙලාවක් ගත වන විට වෙහෙස යි. බඩගින්නත් දැනුණා. ශීතාගාරය තුළ ඒ මේ අත ඇවිද්දා. ඔහු දැක්කා ඉටි කොළ ඇසිරූ කාඩ්බෝඩ් පෙට්ටියක්. මලිත් කාඩ්බෝඩ් ඉරුවා. අත් දෙකෙත් කකුල් දෙකෙත් එතුවා. ඉටි කොළ අරගෙන අතපය වෙලුවා. ඒත් ශීතල නම් දරා ගන්න අමාරු යි. කළ හැකි වෙනත් දෙයක් හිතා ගන්නත් අමාරු යි.

''තවත් බලා ඉන්න බැහැ. අපි යමු පොලීසියට''

ඒ යෝජනාව කළේ මලිත්ගේ තාත්තා. මලිත්ගේ තාත්තත් මලිත්ගේ මිතුරෙකුත් පොලීසියට ගියා. අනෙක් මිතුරන් සාප්පු සංකීර්ණය අසලට ගියා. දැන් වෙලාව පෙ.ව. 4.00ත් වෙලා. ඒ වන විට සාප්පු සංකීර්ණයේ ප්‍රධාන දොරටුවේ සිටි ආරක්ෂක නිලධාරියා වෙනුවට වෙනත් අයෙක් ඇවිත්. ඔහු සාමාන්‍යයෙන් දවල් කාලය තුළ නිතර ම සිටින ආරක්ෂක නිලධාරියා. ඔහු දැක්කා තරුණ පිරිසක් සාප්පු සංකීර්ණය අසල සිටින බව. ඔහු ඔවුන්ට කතා කළා. මෙතැන සිටීමට හේතුව විමසුවා. මලිත්ගේ යහළුවන් සිද්ධිය ගැන ආරක්ෂක නිලධාරියාට පැවසුවා.

''මට පෙන්වන්න යාළුවගේ ෆොටෝ එකක්''

මිතුරන් තමන්ගේ ජංගම දුරකතනවල තිබුණු මලිත්ගේ ඡායාරූප ආරක්ෂක නිලධාරියාට පෙන්නුවා.

''මේ මහත්තයා අද උදේ වැඩට ආවා. ඒත් හවස පිට වුණේ නැහැ'' ආරක්ෂක නිලධාරියා කිව්වා.

''මහත්තයා කොහොම ද ඒක හරියට ම කියන්නෙ.'' මලිත්ගේ මිතුරන් ආරක්ෂක නිලධාරියාගෙන් ඇහුවේ පුදුමයෙන්.

''දරුවනේ, මේ සාප්පු සංකීර්ණයට දවසකට දහස් ගාණක් මිනිස්සු එනවා යනවා. හරි ම කලබලයෙන් තමයි යන්නේ එන්නේ. ඒත් මේ මහත්තයා මම හොඳට දන්නවා. ඒකට හේතුව තමයි මේ මහත්තයා හැමදා ම උදේට හිනා වෙලා කතා කරලා යන්නේ. හවසටත් එහෙම යි. ඒක වෙන කවුරුත් නො කරන දෙයක්. ඒ නිසයි මට මේතරම් මතක තියෙන්නේ.'' ආරක්ෂක නිලධාරියා උත්තර දුන්නා. මිතුරන් මේ කතාව මලිත්ගේ තාත්තාට කිව්වා. මලිත්ගේ තාත්තා පොලීසියට මේ කතාව කිව්වා. පොලිසිය කාර්යාලයේ කළමනාකරුත් මලිත්ගේ තාත්තාත් සමග ඉක්මනින් ම සාප්පු සංකීර්ණයට ආවා. කළමනාකරු හැකි ඉක්මනින් කාර්යාලයත් ශීතාගාරයත් විවෘත කළා. මලිත් සිහිසුන් ව ශීතාගාරය තුළ වැටී සිටියා. මාළු පෙට්ටි කිහිපයකුත් ඔහු අසල වැටී තිබුණා. මලිත් වහා ම රෝහලට ඇතුළත් කරනු ලැබුවා.

පැය කිහිපයකින් මලිත්ට සිහිය ආවා. ඔහුට දැනුණේ එලොව ගිහින් මෙලොව ආවා වගේ. තම දෙමාපියන් ද සොයුරිය ද මිතුරන් ද ආරක්ෂක නිලධාරියා ද ඔහු වටා සිටින අයුරු දුටුවා. සුපුරුදු සිනහව මලිත්ගේ මුව පුරා ඇඳී ගියා.

(සත්‍ය සිදු වීමක් ඇසුරෙන්)

## ● මෙම කතාවෙන් ඉස්මතු වන කුසලතා

- සහයෝගිතාව (Co-operation)
- සහකම්පනය (Empathy)
- ඉවසීම (Patience)
- අනුවර්තනය වීමේ හැකියාව (Adaptability)
- පුද්ගල සම්බන්ධතා (Human Relations)
- වෙහෙස මහන්සි වී වැඩ කිරීමට කැමති බව (Willingness to work hard)
- කරුණාව (Kindness)
- ආචාරශීලී බව (Politeness)

## ● ක්‍රියාකාරකම්

1. කතාවේ අන්තර්ගතය පිළිබඳ මිතුරන් සමග සාකච්ඡා කරන්න.
2. මෙම කතාවෙන් අපට ලබා ගත හැකි ආදර්ශ සටහන් කර ගන්න.
3. මලිත් මුහුණ දුන් අද්දැකීමට ඔබට මුහුණ දීමට සිදු වූයේ නම් ඔබ ගන්නා ක්‍රියාමාර්ග විස්තර කරන්න.
4. කරුණාවන්ත බව ආචාරශීලී බව නිසා ලැබෙන ප්‍රතිලාභ පන්තිය තුළ සාකච්ඡා කරන්න.
5. ඔබ අසා ඇති මෙබඳු කතා එකතු කරන්න. එම කතා ඇසුරෙන් පොත් පිංචක් සකස් කරන්න.

## දිවිය දිනන කතා
### ඇගයීම් පත්‍රිකා ආකෘතිය

කතාවේ නම................................................ දිනය.........................

| අනු අංකය | ඇගයීම් නිර්ණායක / නම | නිවැරදි උච්චාරණයෙන් යුතු ව කියවයි. | කතාව ආශ්‍රයෙන් අසන ප්‍රශ්නවලට පිළිතුරු සපයයි. | හුවමාරු කුසලතා හඳුනා ගෙන ප්‍රකාශ කරයි. | මනා නිමාවකින් යුතු ව නියමිත වේලාවට ක්‍රියාකාරකම් සිදු කර ඉදිරිපත් කරයි. | හුවමාරු කුසලතා ජීවිතයට බද්ධ කර ගනිමින් කටයුතු කරන බව ප්‍රදර්ශනය කරයි. | මුළු ලකුණු |
|---|---|---|---|---|---|---|---|
| | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |

### ලකුණු දීමේ නිර්ණායක සඳහා ප්‍රමිති

| ඇගයීම් නිර්ණායක | ලකුණු 20යි (ඉතා හොඳයි) | ලකුණු 15යි (හොඳයි) | ලකුණු 10යි (සතුටුදායකයි) | ලකුණු 05යි (සාමාන්‍යයයි) | ලකුණු 03යි (සංවර්ධනය විය යුතුයි) |
|---|---|---|---|---|---|
| නිවැරදි උච්චාරණයෙන් යුතු ව කියවයි. | වැරදීමට හැකි උපරිම වචන සංඛ්‍යාව 5කි. | වැරදීමට හැකි උපරිම වචන සංඛ්‍යාව 10කි. | වැරදීමට හැකි උපරිම වචන සංඛ්‍යාව 15කි. | වැරදීමට හැකි උපරිම වචන සංඛ්‍යාව 20කි. | වැරදීමට හැකි උපරිම වචන සංඛ්‍යාව 25ට වැඩි නම් |
| කතාව ආශ්‍රයෙන් අසන ප්‍රශ්නවලට පිළිතුරු සපයයි. | අසන ලද ප්‍රශ්න පහට ම නිවැරදි පිළිතුරු සපයයි. | අසන ලද ප්‍රශ්න පහෙන් හතරකට නිවැරදි පිළිතුරු සපයයි. | අසන ලද ප්‍රශ්න පහෙන් තුනකට නිවැරදි පිළිතුරු සපයයි. | අසන ලද ප්‍රශ්න පහෙන් දෙකකට නිවැරදි පිළිතුරු සපයයි. | අසන ලද ප්‍රශ්න පහෙන් එකකට නිවැරදි පිළිතුරු සපයයි. |
| හුවමාරු කුසලතා හඳුනා ගෙන ප්‍රකාශ කරයි. | කතාව ඇසුරෙන් හුවමාරු කුසලතා පහක් ප්‍රකාශ කරයි. | කතාව ඇසුරෙන් හුවමාරු කුසලතා හතරක් ප්‍රකාශ කරයි. | කතාව ඇසුරෙන් හුවමාරු කුසලතා තුනක් ප්‍රකාශ කරයි. | කතාව ඇසුරෙන් හුවමාරු කුසලතා දෙකක් ප්‍රකාශ කරයි. | කතාව ඇසුරෙන් හුවමාරු කුසලතා එකක් ප්‍රකාශ කරයි. |
| මනා නිමාවකින් යුතු ව නියමිත වේලාවට ක්‍රියාකාරකම් සිදු කර ඉදිරිපත් කරයි. | ක්‍රියාකාරකම් පහක් සම්පූර්ණ කරයි. | ක්‍රියාකාරකම් හතරක් සම්පූර්ණ කරයි. | ක්‍රියාකාරකම් තුනක් සම්පූර්ණ කරයි. | ක්‍රියාකාරකම් දෙකක් සම්පූර්ණ කරයි. | ක්‍රියාකාරකම් එකක් සම්පූර්ණ කරයි. |
| හුවමාරු කුසලතා ජීවිතයට බද්ධ කර ගනිමින් කටයුතු කරන බව ප්‍රදර්ශනය කරයි. | හුවමාරු කුසලතා පහකට වැඩි ප්‍රමාණයක් හැසිරීමේ දී ප්‍රදර්ශනය කරයි. | හුවමාරු කුසලතා හතරකට වැඩි ප්‍රමාණයක් හැසිරීමේ දී ප්‍රදර්ශනය කරයි. | හුවමාරු කුසලතා තුනකට වැඩි ප්‍රමාණයක් හැසිරීමේ දී ප්‍රදර්ශනය කරයි. | හුවමාරු කුසලතා දෙකකට වැඩි ප්‍රමාණයක් හැසිරීමේ දී ප්‍රදර්ශනය කරයි. | හුවමාරු කුසලතා එකකට වැඩි ප්‍රමාණයක් හැසිරීමේ දී ප්‍රදර්ශනය කරයි. |

- ශිෂ්‍යයා වඩාත් කැමැති නිර්මාණයක් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
  කතාවක් නිර්මාණය කිරීම/නාට්‍ය පිටපතක් නිර්මාණය කිරීම/නාට්‍යයක් රඟ දැක්වීම/වීඩියෝ පටයක් නිර්මාණය කිරීම/පුවත්පතකට ලිපියක් සකස් කර පළ කිරීම/ගීතයක් නිර්මාණය කිරීම/ කවි පන්තියක් නිර්මාණය කිරීම
  ලකුණු 100යි.



# 11 පිල් කඩ

දිනක් සවස්වරුවේ විදුලි කොටමින් ගොරවමින් වැස්සක් වසින්නට විය. රාත්‍රි කාලය වන විට එය ධාරානිපාත වරුසාවක් බවට පත් විය. උදෑසන ම අවදි වූ විදුර කුඹුර දිහා බලා පුදුමයට පත් විය.

''සුරේෂ් අයියේ, සුරේෂ් අයියේ, කෝ කමල්, ඇයි විදුර මල්ලි?''

''බලන්නකො අයියේ, ඊයේ රෑ වැස්සට අපේ කුඹුරේ වතුර පිරිලා.''

''එන්න චාමර අපිත් යමු ද? වතුර බලන්න? ''

''පුතාලා ඇවිදින්න යන්න එපා. වැව උතුරල ලු.'' අම්මා කීවා ය.

''එපා, එපා, අනේ අම්මේ,'' වතුර පාර සැර යි. බහින්න බැහැ.

''අනේ! මම ආසයි අම්මේ, අර බලන්නකෝ අපේ යාය ම යට වෙලා මූද වාගේ.''

''ඔව් අයියේ, අද මුහුද අපේ ගෙදර ළඟට ම ඇවිල්ලා වාගේ.'' නංගි කීවා ය.

''සුරේෂ් අයියේ, දැන් අපි මොකද කරන්නෙ ?''

''ආ... හරි මට හොඳ අදහසක් ආවා. අපි පාරුවක් හදමු. ඒකෙ නැගලා වතුර බලන්න යමු.''

''ආ... ඒක හොඳ අදහසක් සුරේෂ් අයියේ. අපේ ගෙදර කෙසෙල් ගස් වගයක් පෙරළිලා තිබුණා. මම ඒවා අරගෙන එන්නම් චාමර කීවේ ය.''

''මම මාන වැල් ටිකක් කඩා ගෙන එන්නම්. තව මොනව ද ඕනේ?''

''පුහු පොල් ගෙඩි හතරක් ඕනෑ.''

''ආ... අපේ ගෙදර තිබුණා.'' විදුර කීවේ ය.

සමන් වැටෙන් ඇල්බීසියා පොලු කිහිපයක් කඩා ගත්තේ ය.

''මෙන්න අපි කෙසෙල් කොට ගෙනාවා. මල්ලි තව එකක් අර ගෙන එනවා. දැන් අපි පාරුව හදමු.''

ඔවුහු කෙසෙල් කොටන් ඇල්බීසියා ලී අතර හිර කර මාන වැල්වලින් කඳට බැන්දෝ ය. ඉන් පසු පුහු පොල් ගෙඩි හතර මුළු හතරේ එල්ලූහ.

''ආ... දැන් හරි ඔය තියෙන්නේ දඬුමොනරේ වාගේ'' යැයි සුරේෂ් අයියා පැවසුවේ ය.

''අයියේ, මමත් එනවා මමත් ආසයි වතුර බලන්න.'' නංගි කීවා ය.

''අනේ නංගි ඔයා තාම චූටි නේ? අපි ගිහින් එන්නම්. ඇවිල්ලා නංගි අපේ කුඹුර වටේ රවුමක් එක්ක යන්නම්. හොඳේ.''

''සමන් අයියේ, මල්ලිලා සෙල්ලම් කරන ටයර් දෙකක් තිබුණා නේ ද? ඒකත් ගනිමු.''

''ආ... ඔව් ඒක හොඳ යි. සූදානම් ශරීරෙ කෝකටත් හොඳයි කියනවා නේ?'' සුරේෂ් අයියා සිනා සී කීවේ ය.

''ආ... ලෑලි කෑලි දෙකකුත් ගන්න මල්ලි ඒකෙන් තමයි හබල් ගහන්නේ. එහෙනම් අපි පාරුව වතුරට දාමු. අම්මේ අපි යනවා.''



''හා... හොඳයි පුතාලා පරිස්සමින් යන්න.''

''සුරේෂ් අයියා ඉස්සරහින් නගින්න. විදුර මේ පැත්තට වෙන්න. බලා ගෙන පරිස්සමින් ඉඳගන්න.''

''ආ... අර පැත්තෙ වතුර සැරයි. අපි මේ පැත්තට පදිමු. සුරේෂ් අයියේ හරි ම ලස්සන යි. මුහුදේ යනවා වාගේ මට දැනෙන්නේ.''

විදුර කීවේ ය.

''කමල් අයියේ, අර බලන්නකෝ''

''අර, අර, ඈත වැව් බැම්මට උඩින් මාර ගහ යට කවුද දෙන්නෙක් ඉන්නවා නේ ද?''

''ඔව්, ඔව්, දෙන්නෙක් ඉන්නවා.''

''අන්න අපව දැක්කා. අපිට අත වනනවා.''

''අනේ, සුරේෂ් අයියේ අපි එතනට යමු.''

''ඒ අය අසරණ වෙලා වගේ අපි ඒ අයට උදව් කරමු. ඒ අර වැව පහළ සිටි සියාතු සීයයි ආච්චියි නේද?''

''ඔව් මයි අපි ඒ දෙන්නා බේරාගමු අයියේ.''

''ආ... සීයෙ මොකද මේ?''

''අනේ පුතේ ඊයේ රෑ මහ වැස්සට අපේ ගෙය කඩා වැටුණා. මේ රෙදි කඩමාලු ටිකක් අරගෙන අපි දෙන්නා මෙතැනට ආවා. අනේ පුතාලා ආ එක ලොකු දෙයක්''

ආච්චි කීවා ය.

''කමල් මල්ලි විදුර මල්ලි මෙතන මාර ගහ ළඟ ඉන්න. අපි දෙන්නා ආච්චියි සීයයි එගොඩ කරලා එන්නම්.''

''හා... හොඳයි සුරේෂ් අයියේ. එහෙම කරමු.''

''එන්න සීයෙ නගින්න පාරුවට. ඔය ආච්චිගෙ අත අල්ල ගන්න, රෙදි මල්ල මට දෙන්න. අපි ආයෙත් එන්නම්. ඔය දෙන්නා එක්ක යන්න.''

''සීයෙ දැන් අපි අපේ ගෙදර යමු. සීයලාට ගොඩක් මහන්සි ඇති නේ?''

''අනේ! අපි නිසා පුතාලට කරදරයක් නේ ද?''

''නෑ සීයේ මොන කරදරයක් ද? අපි ඔයාලට උදව් කරන්න ඕනනේ?''

''ආ... එන්න සීයෙ මෙතනින් බහින්න. කෝ දෙන්න ඔය බෑග් එක. හා... හා... බලා ගෙන පය තියන්නේ, ලිස්සයි. එන්න, ආච්චි මගේ අත අල්ල ගන්න. හා... දැන් බහින්න.''

''අම්මේ, අන්න අයියලා ඇවිල්ලා. මේ සියාතු සීයයි ආච්චියි කොහෙද හිටියේ අයියේ.''

''නංගි සීයලාගේ ගෙදර ඊයේ රෑ වැස්සට කැඩිලා වැව් බැම්ම උඩ හිටියේ අපි ගිහින් එක්ක ගෙන ආවා.''

''අනේ මේ ළමයි අපේ පණ බේරුවා.''

''නංගි, ආච්චියි සීයයි ගෙදර එක්ක යන්න. අපි විදුර මල්ලිලා එක්කර ගෙන එන්නම්.''

''හා... එන්න, එන්න, ගේ ඇතුළට. අපේ පුතාලා ලොකු හපන්කමක් නේ කරල තියෙන්නෙ?''

''අනේ! ඔව්. නෝනා, මේ ළමයි නො හිටින්න අපිට මොනවා වෙයි ද මන්දා.''

''දැන් සීයලාට බඩගිනි ඇති ඉන්න මම කෑම ලැස්ති කරන්නම්'' අම්මා කීවා ය.

''අන්න අයියලත් එනවා. එන්න ආච්චි කෑම කමු. සීයා මෙතනින් ඉඳගන්න''

''හා... හොඳයි. අනේ බොහොම පින් ඔය හැමෝට ම. ඊයේ දවල්ට කොස් තම්බලා කෑවා. ඊට පස්සේ තමයි මේ බත් ටිකක් කන්නේ.''

''අනේ පව් නංගි සීයලාට හොඳට ම බඩගිනි ඇති. ඊයෙ රෑටත් කාලා නෑ. සීයලා හැමදා ම මෙහෙ ඉන්න. අපි ඔයාලා බලා ගන්නම්.''

''අනේ බෑ පුතේ වතුර අඩු වුණා ම ආච්චිලාගේ ගමට යනවා.''

''නෑ නෑ සීයේ ඔයාලා කොහෙවත් යන්න එපා. අපි සීයලාට ගෙයක් හදල දෙන්නම්.''


''නේ ද? සුරේෂ් අයියේ, ඔව් ඔව් අපි එකතු වුණොත් ඒක කරන්න පුළුවන්. අර දෙණියේ කැල්ලෙ උඩ පැත්තෙ හදන්න පුළුවන්.''තාත්තා කීවේ ය.

''ඔව් මල්ලි එතෙන්ට වතුර එන්නෙත් නැහැ උසයි නේ? අපි එතන හදමු.''

''හොඳයි පුතාලා වැඩේ පටන් ගන්නකො. අපිත් උදව් කරන්නම්.'' අම්මා කීවා ය.

''එහෙනම් සුරේෂ් අයියේ අපි හෙට ම වැඩේ පටන් ගනිමු. අපි උඩගෙදර අයියලාටත් කියමු. පියල්ටත් කියමු. තව රාජු අයියටත් කියමු. එයත් එයි. මේ නිවාඩු කාලයේ හැමෝ ම ඉන්නවා නේ? අපි එකතු වෙලා හොඳ වැඩක් කරමු.''

පසු දින ගමේ ළමයි සියලු දෙනා ම කැති උදලු පොරෝ අරගෙන දෙණිය ළඟට රැස්වූහ. බාලදක්ෂ කණ්ඩායමක් මෙන් නො ඉවසිල්ලෙන් බලා සිටියහ.



''අපි පළමුවෙන් ම මෙතන සුද්ද කරමු.
ඊට පස්සේ ගෙපළ කපමු.'' සුරේෂ් කිව්වේ ය.

''ඔව්, ඒක හොඳ යි. රාජුයි ජගතුයි පියලුයි මායි
කැලේට ගිහින් අවශ්‍ය ලී දඬු කපා ගෙන එන්නම්'' යැයි විදුර කීවේ ය.

''සමනුයි කපිලයි ගිහිල්ලා වැල් කඩා ගෙන එන්න. තුෂාරි අක්කේ ඔයාලා එකතු
වෙලා පොල් අතු වියන්න. වහලට දමන්න.''

''හොඳයි විදුර මල්ලි අපි ඒක කරන්නම්. මාමට කියලා අතු ටිකක් කපා ගන්නම්.
අන්න සුදු මාමා එනවා.''

''ආ... පුතාලා මොක්ක ද? මේ ශ්‍රමදානයක් ද?''

''ඔව්, මාමේ අර සියාතු සීයලාගේ ගේ ඊයේ මහ වැස්සට කඩා වැටිලා. අපි මෙතන
ගෙයක් හදනවා.''

''ඒක බොහොම හොඳ වැඩක් විදුර පුතේ. මමත් ඔයාලට උදවු කරන්නම්. අපේ
ගෙදර කිතුල් ගහක් වැටිලා තිබුණා ඒක හොඳට මෝරලා අවශ්‍ය පරාල ටික මම
හදලා දෙන්නම්. තව පුවක් ගස් දෙකකුත් ඇති ඒකත් පලලා දෙන්නම්.''

''ලොකු උදව්වක් මාමේ, බොහොම ස්තුති යි.''

''ගමේ දරුවෝ එකතු වෙලා කරන වැඩේට අපි උදව් කරන්න එපාය.''

''රාජු අයියේ, රාජු අයියේ,''

''ඇයි? චතුරි නංගි'' ''මෙන්න මේ ගහෙන් කොස් ගෙඩි හතරක් පහක් කඩලා
දෙන්නකෝ. අපි ඔයාලට දවල්ට කන්න කොස් තම්බලා පොල් සම්බෝලයක් හදා
ගෙන එන්නම්.''

''නයි මිරිසුත් දාන්න නංගි''

''හොඳයි රාජු අයියේ. යමු නංගි අපි තේ ටිකක් හදා ගෙන එමු. මේ අයට බොන්න දෙන්න.''

ගමේ ළමයි එකතු වෙලා වැඩිහිටියන්ගේ ද උදව් ඇතිව දින තුන හතරකින් කාමර දෙකක් සහිත ඉතා ලස්සන වරිච්චි බිත්ති සහිත ගෙයක් සාදා නිම කළහ. සියලු දෙනාගේ ම කතා බහට ලක් වුණේ ගෙයි ඉදිරිපිට ඇති පිල් කඩ පිළිබඳව යි. එය ඉතා විසිතුරු ලෙස නිර්මාණය කර තිබුණි.

එහි ඉඳ ගත් විට අවට පරිසරය ඉතා හොඳින් නිරීක්ෂණය වේ. කන්ද උඩ නිසා පාරේ යන එන අය ද හොඳින් පෙනිණ. සියාතු සීයා පිල් කඩ උඩ ඉඳ ගෙන වටපිට බැලුවේ ය. ටික වෙලාවකින් සීයගෙ දෙනෙතින් කඳුළු බිඳු කිහිපයක් රූරා වැටෙන්නට විය.

''අනේ මගේ දරුවන්ට යෝධ බල, යෝධ වීරිය ලැබෙන්න ඕනෑ. අපිට මේ කළ උපකාරයට. මට නම් මේක හිතා ගන්නවත් බෑ. හීනයක් වගේ අපිට මාලිගාවක් ලැබුණා වගේ සතුටක් දැනෙන්නේ. නේ ද හාමිනේ?'' කියමින් සියාතු සීයා දෑත් එක් කොට සියලු දෙනාට ම ආචාර කළේ ය.

## • මෙම කතාවෙන් ඉස්මතු වන කුසලතා

- මුල පිරීම (Initiative)
- සංවිධාන කිරීම හා සැලසුම් කිරීම (Organisation and Planning)
- කණ්ඩායම් වැඩ (Teamwok)
- ගැටලු විසඳීම (Problem Solving)
- තීරණ ගැනීම (Decisiveness)
- නිර්මාණාත්මක චින්තනය (Creative Thinking)
- සහයෝගිතාව (Co-operation)
- සහකම්පනය (Empathy)
- වෙහෙස මහන්සි වී වැඩ කිරීමට කැමැති වීම (Willing to Work Hard)
- කරුණාව (Kindness)

## • ක්‍රියාකාරකම්

1. මෙම කතාව පිළිබඳව පවුලේ අය සමග සාකච්ඡා කරන්න.
2. පාසලේ මිතුරන් සමග මෙම කතාව පිළිබඳ අදහස් සාකච්ඡා කරන්න.
3. තමන් මුහුණ දුන් එවැනි අවස්ථා පිළිබඳ මිතුරන්ගෙන් විමසන්න.
4. වැඩිහිටියන්ට සැලකීමේ වැදගත්කම පිළිබඳව මිතුරන් සමග සාකච්ඡා කරන්න. ඔවුන්ගේ අද්දැකීම් හුවමාරු කර ගන්න.
5. පොදු වැඩවල දී සාමූහික ව කටයුතු කිරීමේ වැදගත්කම හා එකමුතුකමේ අගය පැහැදිලි කරන්න.

## දිවිය දිනන කතා
### ඇගයීම් පත්‍රිකා ආකෘතිය

කතාවේ නම............................................... දිනය.........................

| අනු අංකය | ඇගයීම් නිර්ණායක / නම | නිවැරදි උච්චාරණයෙන් යුතු ව කියවයි. | කතාව ආශ්‍රයෙන් අසන ප්‍රශ්නවලට පිළිතුරු සපයයි. | හුවමාරු කුසලතා හඳුනා ගෙන ප්‍රකාශ කරයි. | මනා නිමාවකින් යුතු ව නියමිත වේලාවට ක්‍රියාකාරකම් සිදු කර ඉදිරිපත් කරයි. | හුවමාරු කුසලතා ජීවිතයට බද්ධ කර ගනිමින් කටයුතු කරන බව ප්‍රදර්ශනය කරයි. | මුළු ලකුණු |
|---|---|---|---|---|---|---|---|
| | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |

### ලකුණු දීමේ නිර්ණායක සඳහා ප්‍රමිති

| ඇගයීම් නිර්ණායක | ලකුණු 20යි (ඉතා හොඳයි) | ලකුණු 15යි (හොඳයි) | ලකුණු 10යි (සතුටුදායකයි) | ලකුණු 05යි (සාමාන්‍යයි) | ලකුණු 03යි (සංවර්ධනය විය යුතුයි) |
|---|---|---|---|---|---|
| නිවැරදි උච්චාරණයෙන් යුතු ව කියවයි. | වැරදීමට හැකි උපරිම වචන සංඛ්‍යාව 5කි. | වැරදීමට හැකි උපරිම වචන සංඛ්‍යාව 10කි. | වැරදීමට හැකි උපරිම වචන සංඛ්‍යාව 15කි. | වැරදීමට හැකි උපරිම වචන සංඛ්‍යාව 20කි. | වැරදීමට හැකි උපරිම වචන සංඛ්‍යාව 25ට වැඩි නම් |
| කතාව ආශ්‍රයෙන් අසන ප්‍රශ්නවලට පිළිතුරු සපයයි. | අසන ලද ප්‍රශ්න පහට ම නිවැරදි පිළිතුරු සපයයි. | අසන ලද ප්‍රශ්න පහෙන් හතරකට නිවැරදි පිළිතුරු සපයයි. | අසන ලද ප්‍රශ්න පහෙන් තුනකට නිවැරදි පිළිතුරු සපයයි. | අසන ලද ප්‍රශ්න පහෙන් දෙකකට නිවැරදි පිළිතුරු සපයයි. | අසන ලද ප්‍රශ්න පහෙන් එකකට නිවැරදි පිළිතුරු සපයයි. |
| හුවමාරු කුසලතා හඳුනා ගෙන ප්‍රකාශ කරයි. | කතාව ඇසුරෙන් හුවමාරු කුසලතා පහක් ප්‍රකාශ කරයි. | කතාව ඇසුරෙන් හුවමාරු කුසලතා හතරක් ප්‍රකාශ කරයි. | කතාව ඇසුරෙන් හුවමාරු කුසලතා තුනක් ප්‍රකාශ කරයි. | කතාව ඇසුරෙන් හුවමාරු කුසලතා දෙකක් ප්‍රකාශ කරයි. | කතාව ඇසුරෙන් හුවමාරු කුසලතා එකක් ප්‍රකාශ කරයි. |
| මනා නිමාවකින් යුතු ව නියමිත වේලාවට ක්‍රියාකාරකම් සිදු කර ඉදිරිපත් කරයි. | ක්‍රියාකාරකම් පහක් සම්පූර්ණ කරයි. | ක්‍රියාකාරකම් හතරක් සම්පූර්ණ කරයි. | ක්‍රියාකාරකම් තුනක් සම්පූර්ණ කරයි. | ක්‍රියාකාරකම් දෙකක් සම්පූර්ණ කරයි. | ක්‍රියාකාරකම් එකක් සම්පූර්ණ කරයි. |
| හුවමාරු කුසලතා ජීවිතයට බද්ධ කර ගනිමින් කටයුතු කරන බව ප්‍රදර්ශනය කරයි. | හුවමාරු කුසලතා පහකට වැඩි ප්‍රමාණයක් හැසිරීමේ දී ප්‍රදර්ශනය කරයි. | හුවමාරු කුසලතා හතරකට වැඩි ප්‍රමාණයක් හැසිරීමේ දී ප්‍රදර්ශනය කරයි. | හුවමාරු කුසලතා තුනකට වැඩි ප්‍රමාණයක් හැසිරීමේ දී ප්‍රදර්ශනය කරයි. | හුවමාරු කුසලතා දෙකකට වැඩි ප්‍රමාණයක් හැසිරීමේ දී ප්‍රදර්ශනය කරයි. | හුවමාරු කුසලතා එකකට වැඩි ප්‍රමාණයක් හැසිරීමේ දී ප්‍රදර්ශනය කරයි. |

- ශිෂ්‍යයා වඩාත් කැමැති නිර්මාණයක් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
  කතාවක් නිර්මාණය කිරීම/නාට්‍ය පිටපතක් නිර්මාණය කිරීම/නාට්‍යයක් රඟ දැක්වීම/වීඩියෝ පටයක් නිර්මාණය කිරීම/පුවත්පතකට ලිපියක් සකස් කර පළ කිරීම/ගීතයක් නිර්මාණය කිරීම/ කවි පන්තියක් නිර්මාණය කිරීම

  ලකුණු 100යි.



# 12 පසිඳුයි යාළුවොයි

පසිඳු දඟකාර නමුත් වගකීම් සහිත දරුවෙක්. ඉගෙනීමට දක්වන දක්ෂතාව නිසා ම පසිඳු ශිෂ්‍යත්ව විභාගයෙන් සමත් වී නගරයේ පාසලකට ඇතුළත් වෙන්න හැකියාව ලබනවා. ඒත්, ඔහු තමන්ගේ ගමේ යහළුවන් අමතක කළේ නම් නැහැ. පසිඳුගේ දෙමව්පියනුත් පසිඳුට නිදහසේ ඉගෙන ගැනීමට හා ගමේ යහළුවන්ගේ ඇසුර ලබන්න ඉඩ දුන්නා. පසිඳුට ඉන්නවා, හොඳ ම යාළුවෝ හතර දෙනෙක්.

ඔවුන් හරි ම එකමුතු යි. රහස් නැහැ. එහෙත් පසුගිය දවසක පසිඳු ගමේ ගියා ම නුවන්, මෙත්සුක හා රිසිඳු යන යහළුවෝ එයාව බලන්න ආවා. ඒත් සමීර ආවේ නැහැ. පසිඳුට පුදුම යි. සමීර ගැන. අනෙක් යහළුවන්ගෙන් සමීර ගැන ඇහුවම එයාලා කිව්වෙත් සමීර ටික දිනකින් හමු නො වුණු බව යි. ඔවුන්ට හිතාගන්න බැහැ සමීරට මොකද වුණේ කියලා. මේ ගැන බලන්න යාළුවෝ හතර දෙනා ම ගියා සමීරගේ ගෙදර. සමීර තම යහළුවන් දැකලා පුදුම වුණා. සතුටු වුණා.

සමීර එක්ක කතා කරන කොට තමයි, දැන ගත්තේ සමීරගේ අම්මා දරුණු රෝගයකට ගොදුරු වෙලා කියලා. ඉතින් ගෙදර සියලු ම වැඩ කරන්නේ සමීරගේ තාත්තා. සමීර පුළුවන් විදිහට තාත්තට උදව් කරනවා. තාත්තට හරියට රැකියාවක් කර ගන්න විදිහක් නැහැ. ගෙදර අඩුපාඩු ගොඩ යි. ටික වෙලාවක් සමීරගේ ගෙදර ගත කරපු යහළුවෝ නැවත ඉක්මනින් එක දවසක එන බව පවසලා ආපසු පිටත් වුණා.



ආපසු එන ගමනේ හතර දෙනා කතා වුණේ සමීරට උදව්වක් කරන්නේ කොහොමද කියලා. ඔවුන් හිතුවේ සමීරගේ තාත්තට නිවසේ සිට කරන්න රැකියාවක් තිබුණොත් ප්‍රශ්න ගොඩක් විසඳගන්න පුළුවන් කියලා. යහළුවෝ හතර දෙනා පසුව දා හමුවන්න පොරොන්දු වී තම තමන්ගේ නිවෙස්වලට ගියා. පසිඳු බර කල්පනාවක ඉන්නවා දුටු පසිඳුගේ තාත්තා පසිඳුට කතා කරලා ඇහුවා.

''ඇයි පුතා, දුකෙන් ඉන්නේ'' කියලා

පසිඳු සමීරගේ ගෙදර තොරතුරු තාත්තාට කිව්වා.

පසුව දා නිවාඩු දිනයක් නිසා පසිඳුගේ තාත්තා පසිඳුගේ යාළුවොත් එක්ක සමීරගේ ගෙදර ගියා. යහළුවෝ කතා කරමින් ඉන්න අතර දැක්කා තාත්තලා දෙන්නා බර කතාවක ඉන්නවා. පස්සේ තාත්තලා මිදුලට ගියා. සමීරගේ ගෙදර මිදුල ටිකක් ලොකුයි. පසිඳුගේ තාත්තා කෘෂිකර්ම උපදේශකවරයෙක් හොඳින් ගෙවතු වගාව කිරීමෙන් ආදායමක් ලබා ගන්නා ආකාරය පසිඳුගේ තාත්තා විස්තර කළා.

සමීරගේ තාත්තත් ඒ වැඩේට කැමති වුණා. යාළුවෝ හැමෝට ම හරි සතුටු යි. පසිඳුගේ තාත්තාගේ හා යහළුවන් පස් දෙනාගේ උදව්වෙන් ටික දිනකින් ම වගා කිරීමට සුදුසු බිමක් සකස් කර ගන්න සමීරගේ තාත්තාට හැකි වුණා. මේ ගැන දැන ගත්ත බොහෝ දෙනෙක් සමීරගේ පවුලට උදව් කළා. හැම දෙනාගේ ම උදව්වෙන් සශ්‍රීක ගෙවත්තක් සකස් කරගන්න හැකියාව ලැබුණා. දැන් යහළුවෝ පස් දෙනාට හරි ම සතුටු යි. ගමේ සියලු දෙනා මේ යහළුවන්ගේ ක්‍රියාව අගය කළා.

## ● මෙම කතාවෙන් ඉස්මතු වන කුසලතා

- සංවේදන සම්බන්ධතා ගොඩ නැගීමේ හැකියාව (Empathy/ Ability to Build Relationship)
- සහකම්පනය (Empathy)
- ගැටලු විසඳීම (Problem Solving)
- සහයෝගීතාව (Co-operation)
- සංවිධාන හැකියාව (Organization)

## ● ක්‍රියාකාරකම්

1. ඔබ පසිඳු නම්, සමීර මුහුණ දෙන ගැටලුව විසඳා ගැනීමට ඔබ යෝජනා කරන විසඳුම කුමක් ද ?
2. මෙම කතාවෙන් අපට ගත හැකි ආදර්ශ, ඔබේ පන්තියට ඉදිරිපත් කරන්න.
3. ගැටලුවලට විසඳුම් සෙවීමේ දී අපට වැඩිහිටියන්ගේ උපදෙස් අවශ්‍ය වන්නේ ඇයි ?
4. "හොඳ ළමයි" ගැන එස්. මහින්ද හිමියන් රචනා කරන ලද කවියක් පහත සඳහන් වේ. එම කවිය තාලයට ගායනා කරන්න. එවැනි කවි ඔබත් රචනා කරන්න.

පොත පතට හිත දෙන<br>
දෙගුරුන් බසට හික්මෙන<br>
හොඳ ළමයින් වසන<br>
ගෙදර සුරවිමනක්ය බබළන

## දිවිය දිනන කතා
### ඇගයීම් පත්‍රිකා ආකෘතිය

කතාවේ නම............................................... දිනය.........................


| අනු අංකය | ඇගයීම් නිර්ණායක / නම | නිවැරදි උච්චාරණයෙන් යුතු ව කියවයි. | කතාව ආශ්‍රයෙන් අසන ප්‍රශ්නවලට පිළිතුරු සපයයි. | හුවමාරු කුසලතා හඳුනා ගෙන ප්‍රකාශ කරයි. | මනා නිමාවකින් යුතු ව නියමිත වේලාවට ක්‍රියාකාරකම් සිදු කර ඉදිරිපත් කරයි. | හුවමාරු කුසලතා ජීවිතයට බද්ධ කර ගනිමින් කටයුතු කරන බව ප්‍රදර්ශනය කරයි. | මුළු ලකුණු |
|---|---|---|---|---|---|---|---|
| | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |

### ලකුණු දීමේ නිර්ණායක සඳහා ප්‍රමිති

| ඇගයීම් නිර්ණායක | ලකුණු 20යි (ඉතා හොඳයි) | ලකුණු 15යි (හොඳයි) | ලකුණු 10යි (සතුටුදායකයි) | ලකුණු 05යි (සාමාන්‍යයයි) | ලකුණු 03යි (සංවර්ධනය විය යුතුයි) |
|---|---|---|---|---|---|
| නිවැරදි උච්චාරණයෙන් යුතු ව කියවයි. | වැරදීමට හැකි උපරිම වචන සංඛ්‍යාව 5කි. | වැරදීමට හැකි උපරිම වචන සංඛ්‍යාව 10කි. | වැරදීමට හැකි උපරිම වචන සංඛ්‍යාව 15කි. | වැරදීමට හැකි උපරිම වචන සංඛ්‍යාව 20කි. | වැරදීමට හැකි උපරිම වචන සංඛ්‍යාව 25ට වැඩි නම් |
| කතාව ආශ්‍රයෙන් අසන ප්‍රශ්නවලට පිළිතුරු සපයයි. | අසන ලද ප්‍රශ්න පහට ම නිවැරදි පිළිතුරු සපයයි. | අසන ලද ප්‍රශ්න පහෙන් හතරකට නිවැරදි පිළිතුරු සපයයි. | අසන ලද ප්‍රශ්න පහෙන් තුනකට නිවැරදි පිළිතුරු සපයයි. | අසන ලද ප්‍රශ්න පහෙන් දෙකකට නිවැරදි පිළිතුරු සපයයි. | අසන ලද ප්‍රශ්න පහෙන් එකකට නිවැරදි පිළිතුරු සපයයි. |
| හුවමාරු කුසලතා හඳුනා ගෙන ප්‍රකාශ කරයි. | කතාව ඇසුරෙන් හුවමාරු කුසලතා පහක් ප්‍රකාශ කරයි. | කතාව ඇසුරෙන් හුවමාරු කුසලතා හතරක් ප්‍රකාශ කරයි. | කතාව ඇසුරෙන් හුවමාරු කුසලතා තුනක් ප්‍රකාශ කරයි. | කතාව ඇසුරෙන් හුවමාරු කුසලතා දෙකක් ප්‍රකාශ කරයි. | කතාව ඇසුරෙන් හුවමාරු කුසලතා එකක් ප්‍රකාශ කරයි. |
| මනා නිමාවකින් යුතු ව නියමිත වේලාවට ක්‍රියාකාරකම් සිදු කර ඉදිරිපත් කරයි. | ක්‍රියාකාරකම් පහක් සම්පූර්ණ කරයි. | ක්‍රියාකාරකම් හතරක් සම්පූර්ණ කරයි. | ක්‍රියාකාරකම් තුනක් සම්පූර්ණ කරයි. | ක්‍රියාකාරකම් දෙකක් සම්පූර්ණ කරයි. | ක්‍රියාකාරකම් එකක් සම්පූර්ණ කරයි. |
| හුවමාරු කුසලතා ජීවිතයට බද්ධ කර ගනිමින් කටයුතු කරන බව ප්‍රදර්ශනය කරයි. | හුවමාරු කුසලතා පහකට වැඩි ප්‍රමාණයක් හැසිරීමේ දී ප්‍රදර්ශනය කරයි. | හුවමාරු කුසලතා හතරකට වැඩි ප්‍රමාණයක් හැසිරීමේ දී ප්‍රදර්ශනය කරයි. | හුවමාරු කුසලතා තුනකට වැඩි ප්‍රමාණයක් හැසිරීමේ දී ප්‍රදර්ශනය කරයි. | හුවමාරු කුසලතා දෙකකට වැඩි ප්‍රමාණයක් හැසිරීමේ දී ප්‍රදර්ශනය කරයි. | හුවමාරු කුසලතා එකකට වැඩි ප්‍රමාණයක් හැසිරීමේ දී ප්‍රදර්ශනය කරයි. |

- ශිෂ්‍යයා වඩාත් කැමැති නිර්මාණයක් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
  කතාවක් නිර්මාණය කිරීම/නාට්‍ය පිටපතක් නිර්මාණය කිරීම/නාට්‍යයක් රඟ දැක්වීම/වීඩියෝ පටයක් නිර්මාණය කිරීම/පුවත්පතකට ලිපියක් සකස් කර පළ කිරීම/ගීතයක් නිර්මාණය කිරීම/ කවි පන්තියක් නිර්මාණය කිරීම

ලකුණු 100යි.



# 13 දුර්ග භූමිය

එකෝමත් එක රටක 'දුර්ගභූමී' නමින් ප්‍රත්‍යන්ත ජනපදයක් විය. මේ ප්‍රදේශයේ ජනයා අධික උෂ්ණාධික දේශගුණයෙන් ද වර්ෂාපතනයේ ඌනතාවෙන් ද පීඩා වින්දාහ. තම තමන්ගේ කෘෂිකාර්මික කටයුතු සඵල නො වූයෙන් බොහෝ ජනයා මේ ජනපදය අත්හැර යන්නට වූහ.

දුර්ග භූමියෙහි වනස්පති වෘක්ෂ කිසිවක් නො වී ය. ලඳු කැලෑ සහ තෘණ භූමිවලින් ගහන මෙහි වෘක්ෂලතාවන් හරිත පැහැ ගන්නේ වර්ෂා කාලයට පමණි. වර්ෂයේ වැඩි කාලයක් අනුභවයට සුදුසු ආහාරයක් නො ලැබෙන බැවින් වන සිවුපාවන් ද මේ භූමිය වාසභූමි කොට ගත්තේ විරල වශයෙනි.

දුර්ග භූමියෙහි ලඳු කැලෑවට මැදි ව මහා පර්වතයක් විය. මේ පර්වතයට අධිපති කිසියම් යක්ෂයෙක් මේ භූමියට වර්ෂාව නො දෙන්නේය'යි ජනපදවාසීහු සිතූහ. ඒ පර්වතයෙන් යක්ෂයා පන්නා දමා ජනපදය සශ්‍රීක කරන්නැයි ජනපදවාසීහු රජතුමාගෙන් ඉල්ලා සිටියහ.

ජනපදවාසීන්ගේ ඉල්ලීමට කන් දුන් රජතුමා පර්වතයට අධිපති යක්ෂයෙක් ඇතැයි නො ඇදහී ය. ස්වාභාවික හේතු සාධක මත වර්ෂාව නො ලැබීම නිසා ජලය හිඟ වීමෙන් මේ ජනපදය වචනයේ පරිසමාප්ත අර්ථයෙන් ම දුර්ග භූමියක් වී ඇති සැටි රජතුමාගේ අවධානයට ලක් විය. දුර්ග භූමිය සෞභාග්‍යවත් භූමියක් කරලීමට රජතුමා අධිෂ්ඨාන කර ගත්තේ ය.

රට පුරා වෙසෙන නොයෙක් ශිල්ප ශාස්ත්‍ර දත් පඬිවරුන්ගෙන් දුර්ග භූමි සංවර්ධන යෝජනා ලබා ගත්තේ ය. සියලු අදහස් යෝජනා සැලකිල්ලට ගත් රජතුමා දුර්ග භූමි ජනපදය මධ්‍යයේ පිහිටි විශාල පර්වතය තමාගේ මාලිගය බවට පත් කිරීමට තීරණය කළේ ය.

සුවිශාල පර්වතයට නැගීමට පියගැට පෙළක් ඉදි කර වී ය. පර්වතය වටා ගල් වඩුවන් ලවා විසිතුරු කැටයම් කර වී ය. සුදුසු තන්හි සිතුවම් ඇඳ පර්වතය විචිත්‍ර කළේ ය. වර්ෂා කාලයට පර්වතයෙන් බේරී වැටෙන ජලය රැස් කිරීමට වැව් පොකුණු රැසක් ඉදි කර වී ය. වියළි තැනිතලා භූමිය ඔස්සේ පර්වතය දෙසට හමා එන සුළඟේ බලයෙන් ජලය පර්වතය මතට ගෙන ඒමේ ජලනළ පද්ධතියක් නිර්මාණය කර වී ය. පර්වතය වටා ජල පෝෂක වෘක්ෂලතා සිටුවා පෝෂණය කර වී ය.

නො බෝ කාලයක් ගෙවී යන්නටත් මත්තෙන් දුර්ග භූමිය ජනාදරණීය ප්‍රදේශයක් බවට පත් වී ය. රජතුමාගේ සම්ප්‍රාප්තිය නිසා මහාමාත්‍යවරු ද සේනාපතිවරු ද මාලිගය අවට පදිංචි වූහ. ඒ හා සමග රාජ සම්මානයට පාත්‍ර වූ ප්‍රභූවරු ද දුර්ග භූමිය වාසභූමි කොට ගත්තෝ ය. දුර්ග භූමියෙහි මුල් පදිංචිකරුවෝ රාජරාජාධි මහාමාත්‍යවරුන්ට සේවා රාජකාරි කිරීමෙන් ධනය උපයා ගත්හ. ඒ ධනයෙන් ඔවුහු සුඛිත මුදිත වූහ. වැව් පොකුණු ඉදි කිරීම නිසා වෘක්ෂලතාවෝ හොඳින් වැඩුණාහ. වෘක්ෂලතා ගහන වීමෙන් වැසි වැඩි වී ය. වර්ෂාපතනය නිසා දුර්ග භූමිය ස්වර්ග භූමියක් වැනි වී ය.

භූමියෙහි වරදක් නො සිතා නිර්මාණාත්මක චින්තනයෙන් ද නවෝත්පාදනයෙන් ද අනූන මිනිසුන්ට ස්වර්ග රාජ්‍යයක් වුව ද ඉදි කළ හැකි බවට දුර්ග භූමි සංවර්ධනය හොඳ ම නිදසුනක් යැයි ලෝවැස්සෝ අදටත් කතා කරති.



## ● මෙම කතාවෙන් ඉස්මතු වන කුසලතා

- නිර්මාණශීලීත්වය හා නව්‍යකරණය (Creativity and Innovation)
- තීරණ ගැනීම (Decision Making)
- පරිසරයට ආදරය කිරීම (Love of Environment)
- කණ්ඩායම් වැඩ (Teamwork)
- නායකත්ව කුසලතා (Leadership Skills)
- ගැටලු විසඳීම (Problem Solving)

## ● ක්‍රියාකාරකම්

1. දුර්ග භූමිය ක්ෂේම භූමියක් කිරීමට රජතුමා හා ජනතාව ගත් ක්‍රියාමාර්ග කතාව ඇසුරෙන් විස්තර කරන්න
2. දුර්ග භූමියෙහි රජතුමාගේ චරිතයෙන් ඉස්මතු වන නායකත්ව කුසලතා මොනවා ද?
3. කණ්ඩායමක් ලෙස කටයුතු කිරීමෙන් වන ප්‍රයෝජන පන්තියට ඉදිරිපත් කරන්න.
4. කණ්ඩායමක් ලෙස කටයුතු කිරීමේ වැදගත්කම පෙන්වන වීඩියෝ අන්තර්ජාලයෙන් නරඹන්න.

   **https://www.youtube.com/watch?v=O-Hzzg1AtVs**

   **https://www.youtube.com/watch?v=RuQjYzP9PMo**

   **https://www.youtube.com/watch?v=4duPBWzf46E**

5. තමා වෙසෙන පරිසරය පවා වෙනස් කළ හැක්කේ මිනිසාට ම ය. යන මැයෙන් බුද්ධි මණ්ඩල සාකච්ඡාවක් මෙහෙය වන්න.

## දිවිය දිනන කතා
### ඇගයීම් පත්‍රිකා ආකෘතිය

කතාවේ නම.................................................. දිනය..........................

| අනු අංකය | ඇගයීම් නිර්ණායක / නම | නිවැරදි උච්චාරණයෙන් යුතු ව කියවයි. | කතාව ආශ්‍රයෙන් අසන ප්‍රශ්නවලට පිළිතුරු සපයයි. | හුවමාරු කුසලතා හඳුනා ගෙන ප්‍රකාශ කරයි. | මනා නිමාවකින් යුතු ව නියමිත වේලාවට ක්‍රියාකාරකම් සිදු කර ඉදිරිපත් කරයි. | හුවමාරු කුසලතා ජීවිතයට බද්ධ කර ගනිමින් කටයුතු කරන බව ප්‍රදර්ශනය කරයි. | මුළු ලකුණු |
|---|---|---|---|---|---|---|---|
| | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |

### ලකුණු දීමේ නිර්ණායක සඳහා ප්‍රමිති

| ඇගයීම් නිර්ණායක | ලකුණු 20යි (ඉතා හොඳයි) | ලකුණු 15යි (හොඳයි) | ලකුණු 10යි (සතුටුදායකයි) | ලකුණු 05යි (සාමාන්‍යයයි) | ලකුණු 03යි (සංවර්ධනය විය යුතුයි) |
|---|---|---|---|---|---|
| නිවැරදි උච්චාරණයෙන් යුතු ව කියවයි. | වැරදීමට හැකි උපරිම වචන සංඛ්‍යාව 5කි. | වැරදීමට හැකි උපරිම වචන සංඛ්‍යාව 10කි. | වැරදීමට හැකි උපරිම වචන සංඛ්‍යාව 15කි. | වැරදීමට හැකි උපරිම වචන සංඛ්‍යාව 20කි. | වැරදීමට හැකි උපරිම වචන සංඛ්‍යාව 25ට වැඩි නම් |
| කතාව ආශ්‍රයෙන් අසන ප්‍රශ්නවලට පිළිතුරු සපයයි. | අසන ලද ප්‍රශ්න පහට ම නිවැරදි පිළිතුරු සපයයි. | අසන ලද ප්‍රශ්න පහෙන් හතරකට නිවැරදි පිළිතුරු සපයයි. | අසන ලද ප්‍රශ්න පහෙන් තුනකට නිවැරදි පිළිතුරු සපයයි. | අසන ලද ප්‍රශ්න පහෙන් දෙකකට නිවැරදි පිළිතුරු සපයයි. | අසන ලද ප්‍රශ්න පහෙන් එකකට නිවැරදි පිළිතුරු සපයයි. |
| හුවමාරු කුසලතා හඳුනා ගෙන ප්‍රකාශ කරයි. | කතාව ඇසුරෙන් හුවමාරු කුසලතා පහක් ප්‍රකාශ කරයි. | කතාව ඇසුරෙන් හුවමාරු කුසලතා හතරක් ප්‍රකාශ කරයි. | කතාව ඇසුරෙන් හුවමාරු කුසලතා තුනක් ප්‍රකාශ කරයි. | කතාව ඇසුරෙන් හුවමාරු කුසලතා දෙකක් ප්‍රකාශ කරයි. | කතාව ඇසුරෙන් හුවමාරු කුසලතා එකක් ප්‍රකාශ කරයි. |
| මනා නිමාවකින් යුතු ව නියමිත වේලාවට ක්‍රියාකාරකම් සිදු කර ඉදිරිපත් කරයි. | ක්‍රියාකාරකම් පහක් සම්පූර්ණ කරයි. | ක්‍රියාකාරකම් හතරක් සම්පූර්ණ කරයි. | ක්‍රියාකාරකම් තුනක් සම්පූර්ණ කරයි. | ක්‍රියාකාරකම් දෙකක් සම්පූර්ණ කරයි. | ක්‍රියාකාරකම් එකක් සම්පූර්ණ කරයි. |
| හුවමාරු කුසලතා ජීවිතයට බද්ධ කර ගනිමින් කටයුතු කරන බව ප්‍රදර්ශනය කරයි. | හුවමාරු කුසලතා පහකට වැඩි ප්‍රමාණයක් හැසිරීමේ දී ප්‍රදර්ශනය කරයි. | හුවමාරු කුසලතා හතරකට වැඩි ප්‍රමාණයක් හැසිරීමේ දී ප්‍රදර්ශනය කරයි. | හුවමාරු කුසලතා තුනකට වැඩි ප්‍රමාණයක් හැසිරීමේ දී ප්‍රදර්ශනය කරයි. | හුවමාරු කුසලතා දෙකකට වැඩි ප්‍රමාණයක් හැසිරීමේ දී ප්‍රදර්ශනය කරයි. | හුවමාරු කුසලතා එකකට වැඩි ප්‍රමාණයක් හැසිරීමේ දී ප්‍රදර්ශනය කරයි. |

- ශිෂ්‍යයා වඩාත් කැමැති නිර්මාණයක් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
  කතාවක් නිර්මාණය කිරීම/නාට්‍ය පිටපතක් නිර්මාණය කිරීම/නාට්‍යයක් රඟ දැක්වීම/වීඩියෝ පටයක් නිර්මාණය කිරීම/පුවත්පතකට ලිපියක් සකස් කර පළ කිරීම/ගීතයක් නිර්මාණය කිරීම/ කවි පන්තියක් නිර්මාණය කිරීම
  ලකුණු 100යි.



# 14 කවුද දුප්පත්?

දිනක් ඉතා ම ධනවත් පවුලක පියෙක් ඔහුගේ හය වන ශ්‍රේණියේ ඉගෙනුම ලැබූ පුතා සමග නගරයෙන් ඈත ගමක් වන මීමුරේ ගමේ දින දෙකක් නැවතීමට ගියා. මහනුවර නගරයේ සිට කිලෝමීටර 65ක දුරකින් පිහිටි මෙම ගමට යාම ඉතා දුෂ්කර වූ අතර, ඒ ගමේ ජීවත් වූ බොහොමයක් පවුල් ඉතා දුප්පත් අය ලෙස ද මතයක් තිබුණා.

දින දෙකක් එම ගමේ සතුටින් ගත කළ ඔවුන් ආපසු නිවෙස් බලා යාමට පිටත් වුණා. ආපසු යන ගමන් පියා එම ගමන ගැන තම පුතාගේ මතය හා ආකල්පය විමසා සිටියා.

- දුප්පත් අය ජීවත් වන එම ගම පිළිබඳ සිතන්නේ කුමක් දැයි පියා තම පුතාගෙන් විමසා සිටියා.

- එවිට එම දරුවාගේ පිළිතුර නිසා පියාට යමක් සිතන්නට පෙලඹීමට සිදු වුණා.

- තාත්තා, මෙම ගමට මා ගෙනාවාට බොහොම ස්තුති යි.

- අපේ ගෙදර ඉන්නේ එක බල්ල යි.

- හැබැයි මේ ගමේ අයට බල්ලෝ සහ පූසෝ ද කිහිප දෙනෙක් ඉන්නවා.

- අපිට තියෙන්නේ එක පිහිනුම් තටාකය යි.

- ඒත් මේ ගමේ  ගංගා ඇළ දොළ කිහිපයක් ම තිබෙනවා.

- අපට තියෙන්නේ එක ඔන්චිල්ලාව යි.



- ඒ ගමේ දරුවන්ට වැල්වලින් සැදුණු ස්වාභාවික ඔන්චිල්ලා හැමතැන ම තිබෙනවා.
- අපේ ගෙදර ආරක්ෂාවට ගේ වටේට බැම්මක් තියෙනවා.
- ඒ ගමේ අයට එකිනෙකාගෙන් අන්‍යෝන්‍ය ආරක්ෂාව ලැබෙනවා.
- අපි කඩෙන් බිත්තර මිල දී ගන්නවා.
- ඔවුන් ගමේ දී ම ලැබෙන බිත්තර දිනපතා අනුභව කරනවා.
- අපි පිටිකිරි පිටරටින් ගෙනැවිත් බොනවා.
- ඔවුන් දොවා ගත් විගස ම නැවුම් කිරි පානය කරනවා.
- අපි වසවිස සහිත එළවළු සහ පලතුරු සුපිරි වෙළඳ සැල්වලින් මිලට ගන්නවා.
- එම ගමේ අය තම වත්තේ වැවෙන වස විසවලින් තොර ස්වාභාවික එළවළු හා පලතුරු දිනපතා පරිභෝජනය කරනවා.
- එම ගමේ අය පාන්පිටි වෙනුවට සහල් පිටි, කුරක්කන් පිටි, කිතුල් පිටි ආදිය යොදා ගෙන ආහාර පිළියෙල කර ගන්නවා.
- උදේට ඔරලෝසුවේ එලාම් වෙනුවට, ඒ ගමේ කුකුළන්ගේ හැඬලීම හා කුරුල්ලන්ගේ නාදය ඇහෙනවා.
- පවුලේ සියලු දෙනා සහයෝගයෙන් තම කටයුතු සිදු කර ගන්නවා.
- අපි පාසල් යන්නේ වාහනයෙන් මහපාරේ රථ වාහන තදබදයෙන් යුතු පාරවල්වල පැය ගණන් ගෙවෙනවා. ඒත් ඔවුන් නිවසේ සිට සුළු වේලාවකින් යහළුවන් සමග තම පාසලට පයින් ම යනවා.
- අපේ පරිසරයේ හැමතැන ම කසළ දකින්න පුළුවන්. ඒත් එම ගමේ කිසි ම තැනක කසළ දක්නට නැහැ.

- අපේ පරිසරය විවිධ ශබ්දවලින් දූෂණය වෙලා. එහෙත් එම ගමේ තියෙන්නේ හරි ම නිස්කලංක පරිසරයක්.

''මට නම් හිතෙන්නේ අපි තමයි, දුප්පත්. ඒ අයට මුදල් හිඟ ඇති. ලොකු වාහන, නිවාස නැතුව ඇති, එහෙත් සතුටින් සිටීම හා ස්වාභාවික පරිසරයේ නිදහසේ ජීවත් වීම, අතින් ගත් කල ඔවුන් අපිට වඩා ගවු ගණනක් ඉදිරියෙන් සිටිනවා කියලයි, මට හිතෙන්නේ.''

තම පුතාගේ චින්තනය පිළිබඳව පියා සතුටටත් පුදුමයටත් පත් වුණා.

(අන්තර් ජාලය ඇසුරෙන්)



## ● මෙම කතාවෙන් ඉස්මතු වන කුසලතා

- පරිසරය පිළිබඳ ඇල්ම (Environmental Consciousness)
- පරිසරය ආරක්ෂා කිරීම (Protecting the Environment)
- පරිසරය පිළිබඳ සංවේදී බව (Sensitivity to the Environment)

## ● ක්‍රියාකාරකම්

1. මෙම කතාව නිවසට ගොස් තම දෙමාපියන්ට, ආච්චි සීයාට, තම සහෝදර සහෝදරියන්ට කියා දෙන්න.
   - ඔවුන්ගේ ප්‍රතිචාරය සටහන් කර ගන්න.
   - ඊළඟ දිනයේ දී ඒ ගැන යහළුවන් සමග පාසලේ දී සාකච්ඡා කරන්න.
   - පන්තිය ඉදිරියේ පැහැදිලි කරන්න.
2. පරිසරය ආරක්ෂා කිරීමේ වැදගත්කම විදහා පාන
   - ලිපි, කෙටි කතා, රචනා කොට පුවත් පත්වල පළ කිරීම
   - නාට්‍ය, කවි, වීඩියෝ වැඩ සටහන්, රූපවාහිනී වැඩ සටහන් පටිගත කොට සමාජ මාධ්‍යයට ඉදිරිපත් කරන්න.
3. ඉතා ම නිර්මාණශීලී වැඩසටහන් තෝරා අගය කිරීම හා සියලු දෙනා අතර බෙදා හැරීම කරන්න.
4. පාසලේ "පරිසර සංගමය", "මාධ්‍යය අංශය" ආදිය සමග ඒකාබද්ධ වැඩ සටහන් සකස් කරන්න.



## දිවිය දිනන කතා
### ඇගයීම් පත්‍රිකා ආකෘතිය

කතාවේ නම................................................ දිනය..........................

| අනු අංකය | ඇගයීම් නිර්ණායක / නම | නිවැරදි උච්චාරණයෙන් යුතු ව කියවයි. | කතාව ආශ්‍රයෙන් අසන ප්‍රශ්නවලට පිළිතුරු සපයයි. | හුවමාරු කුසලතා හඳුනා ගෙන ප්‍රකාශ කරයි. | මනා නිමාවකින් යුතු ව නියමිත වේලාවට ක්‍රියාකාරකම් සිදු කර ඉදිරිපත් කරයි. | හුවමාරු කුසලතා ජීවිතයට බද්ධ කර ගනිමින් කටයුතු කරන බව ප්‍රදර්ශනය කරයි. | මුළු ලකුණු |
|---|---|---|---|---|---|---|---|
| | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |

### ලකුණු දීමේ නිර්ණායක සඳහා ප්‍රමිති

| ඇගයීම් නිර්ණායක | ලකුණු 20යි (ඉතා හොඳයි) | ලකුණු 15යි (හොඳයි) | ලකුණු 10යි (සතුටුදායකයි) | ලකුණු 05යි (සාමාන්‍යයයි) | ලකුණු 03යි (සංවර්ධනය විය යුතුයි) |
|---|---|---|---|---|---|
| නිවැරදි උච්චාරණයෙන් යුතු ව කියවයි. | වැරදීමට හැකි උපරිම වචන සංඛ්‍යාව 5කි. | වැරදීමට හැකි උපරිම වචන සංඛ්‍යාව 10කි. | වැරදීමට හැකි උපරිම වචන සංඛ්‍යාව 15කි. | වැරදීමට හැකි උපරිම වචන සංඛ්‍යාව 20කි. | වැරදීමට හැකි උපරිම වචන සංඛ්‍යාව 25ට වැඩි නම් |
| කතාව ආශ්‍රයෙන් අසන ප්‍රශ්නවලට පිළිතුරු සපයයි. | අසන ලද ප්‍රශ්න පහට ම නිවැරදි පිළිතුරු සපයයි. | අසන ලද ප්‍රශ්න පහෙන් හතරකට නිවැරදි පිළිතුරු සපයයි. | අසන ලද ප්‍රශ්න පහෙන් තුනකට නිවැරදි පිළිතුරු සපයයි. | අසන ලද ප්‍රශ්න පහෙන් දෙකකට නිවැරදි පිළිතුරු සපයයි. | අසන ලද ප්‍රශ්න පහෙන් එකකට නිවැරදි පිළිතුරු සපයයි. |
| හුවමාරු කුසලතා හඳුනා ගෙන ප්‍රකාශ කරයි. | කතාව ඇසුරෙන් හුවමාරු කුසලතා පහක් ප්‍රකාශ කරයි. | කතාව ඇසුරෙන් හුවමාරු කුසලතා හතරක් ප්‍රකාශ කරයි. | කතාව ඇසුරෙන් හුවමාරු කුසලතා තුනක් ප්‍රකාශ කරයි. | කතාව ඇසුරෙන් හුවමාරු කුසලතා දෙකක් ප්‍රකාශ කරයි. | කතාව ඇසුරෙන් හුවමාරු කුසලතා එකක් ප්‍රකාශ කරයි. |
| මනා නිමාවකින් යුතු ව නියමිත වේලාවට ක්‍රියාකාරකම් සිදු කර ඉදිරිපත් කරයි. | ක්‍රියාකාරකම් පහක් සම්පූර්ණ කරයි. | ක්‍රියාකාරකම් හතරක් සම්පූර්ණ කරයි. | ක්‍රියාකාරකම් තුනක් සම්පූර්ණ කරයි. | ක්‍රියාකාරකම් දෙකක් සම්පූර්ණ කරයි. | ක්‍රියාකාරකම් එකක් සම්පූර්ණ කරයි. |
| හුවමාරු කුසලතා ජීවිතයට බද්ධ කර ගනිමින් කටයුතු කරන බව ප්‍රදර්ශනය කරයි. | හුවමාරු කුසලතා පහකට වැඩි ප්‍රමාණයක් හැසිරීමේ දී ප්‍රදර්ශනය කරයි. | හුවමාරු කුසලතා හතරකට වැඩි ප්‍රමාණයක් හැසිරීමේ දී ප්‍රදර්ශනය කරයි. | හුවමාරු කුසලතා තුනකට වැඩි ප්‍රමාණයක් හැසිරීමේ දී ප්‍රදර්ශනය කරයි. | හුවමාරු කුසලතා දෙකකට වැඩි ප්‍රමාණයක් හැසිරීමේ දී ප්‍රදර්ශනය කරයි. | හුවමාරු කුසලතා එකකට වැඩි ප්‍රමාණයක් හැසිරීමේ දී ප්‍රදර්ශනය කරයි. |

- ශිෂ්‍යයා වඩාත් කැමැති නිර්මාණයක් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
  කතාවක් නිර්මාණය කිරීම/නාට්‍ය පිටපතක් නිර්මාණය කිරීම/නාට්‍යයක් රඟ දැක්වීම/වීඩියෝ පටයක් නිර්මාණය කිරීම/පුවත්පතකට ලිපියක් සකස් කර පළ කිරීම/ගීතයක් නිර්මාණය කිරීම/ කවි පන්තියක් නිර්මාණය කිරීම

ලකුණු 100යි.



# 15 නූලෙන් බේරුණු විදුරංග

දසුන්, තරුෂ, දිනිති, කවීශා ඇතුළු මිතුරු පිරිස එදත් වෙල් එළියට එකතු වුණා. අසල පාසල්වල හය, හත, අට පන්තිවල ඉගෙන ගන්නා ඔවුන් සතියකට දිනක් දෙකක් මේ විදියට වෙල් එළියට එකතු වෙන්නේ ක්‍රීඩා කරන්න.

''අපි අද ක්‍රිකට් ගහමු.'' ඒ යෝජනාව ගෙනාවේ විසල්.


''නෑ අපි වෙන සෙල්ලමක් කරමු.'' තරුෂ වෙනත් අදහසක් පැවසුවා.

''එහෙනම් අපි එල්ලේ ගහමු'' කවීශාගේ අදහස වුණේ එල්ලේ ක්‍රීඩා කරන්න.

තවත් අය අදහස් ඉදිරිපත් කළා. ඒත් ඒ සියලු අදහස්වලින් පස්සෙ හැමෝ ම කවීශාගේ අදහසට එකඟ වුණා. කවීශාගේ නායකත්වයෙන් එක කණ්ඩායමකුත් විසල්ගේ නායකත්වයෙන් තවත් කණ්ඩායමකුත් හැදුණා. එදා තරගය දිනුවේ කවීශාගේ කණ්ඩායම.

එල්ලේ ක්‍රීඩාව අවසානයේ තරුෂ තවත් යෝජනාවක් කළා. ඒ අඹ කඩන්න. අඹ ගහ තිබුණේ වෙල්යාය කෙළවරේ තිබුණු ඇළ අයිනේ. ඇළෙන් එහා පැත්තෙ ගෙවල් දෙක තුනක් තිබුණා.

''කවුද අද අඹ ගහට නගින්නෙ'' දිනිති ඇහුවා. විදුරංග ස්වකැමැත්තෙන් ගහට නගින්න ඉදිරිපත් වුණා. පොල් පිත්තක් හේත්තු කරලා මිතුරන්ගේ උදව්වෙන් විදුරංග ගහට නැග්ගා. යාළුවෝ ටික ගහ වටේ. විදුරංග අඹ කඩලා ඇළට දැම්මා. කිහිප දෙනෙක් ඇළට බැහැලා වැටෙන අඹ එකතු කළා.



විදුරංග දැක්කා තමන් සිටි තැනට ටිකක් එහායින් වෙල පැත්තට වෙන්න හොඳට ඉදුණු අඹ පොකුරක්. ඔහු හරහට තිබුණු අත්තක් දිගේ බඩගා ගෙන අඹ පොකුර කිට්ටුවට ගියා. අමාරුවෙන් අත දික්කරලා අඹ පොකුර කඩන්න හැදුවා. ඒත් එක්ක ම විදුරංගගේ සමබරතාව ගිළිහුණා. විදුරංග ලිස්සුවා. අඹ අත්තේ අමාරුවෙන් එල්ලුණා. කකුලක් තියා ගන්නවත් පහළින් අත්තක් ඇත්තෙත් නැහැ. බිම හිටපු මිතුරන්ට ඉබේ කෑගැසුණා. ඈළ පැත්තෙ අත්තක් නම් ඈළට පනින්නවත් තිබුණා. ඒත් මෙතනින් බිමට වැටුණොත් අතක් පයක් කැඩෙනවා ම යි. විදුරංගට කරන දෙයක් හිතා ගන්නවත් බැහැ. තව විනාඩි දෙක තුනකට වඩා එල්ලිලා ඉන්නත් බැහැ.

''බය වෙන්න එපා විදුරංග ටික වෙලාවක් ඔහොම ඉන්න. අපි ඔයාට මොකුත් වෙන්න දෙන්නේ නැහැ'' දසුන්ගේ කටහඬ විදුරංගට ඇහුණා. විදුරංග හිතට දිරිය ගත්තා.

දසුන් තම මිතුරන් ඇමතුවා.

''විසල්, දිනිති, තරුෂ, මධූක හැමෝ ම වටේ තියෙන පොල්ලතු ගේන්න. විදුරංග ඉන්න තැනට යටින් එලන්න. ඉක්මන් කරන්න. විදුරංගට වැඩි වෙලාවක් ඔහොම ඉන්න බැහැ.''

යාළුවෝ ටික ඉක්මනින් ක්‍රියාත්මක වුණා. දැන් ගහ යට පොල්ලතු ගොඩයි. ඒ අතර දසුන් ඉක්මනින් ඈළට එහා පැත්තෙ තියෙන ගෙදරට දිවුවා. වැලේ වනල තිබුණු ඇඳ රෙදි දෙකක් අරගෙන ආවා.

''හැමෝ ම එන්න පොල්ලතු ගොඩ වටේට හිටගන්න. පොල්ලතුවලට ඉහළින් මේ ඇඳ රෙද්ද අල්ලා ගන්න. සියලු දෙනා ම දසුන්ගේ අණ පිළිපැද්දා.

''විදුරංග දැන් අත් දෙක අත හරින්න. බය වෙන්න එපා මොකුත් වෙන්නේ නැහැ'' දසුන්ගේ හඬ ඇහුණු විදුරංග බිම බැලුවා. ඔහු දැක්කේ ඔහුට පහළින් පලසක් එළා තියෙන ආකාරය යි. ඒ වටේට මිතුරු පිරිස. විදුරංගගේ බිය තුනී වුණා.

හිතට දහිරිය අරගෙන අඹ අත්ත අත හැරියා. විදුරංග ඇඳ රෙදි මතට පාත් වුණා. විදුරංගගේ බරටයි වැටුණු වේගයටයි විදුරංග ඇඳ රෙදිත් එක්ක ම පොල්ලතු ගොඩ මතට වැටුණා. විදුරංගට සීරීමක්වත් නැහැ. යාළුවො ටික සතුටෙන් කෑගැහුවා. දසුන්ගේ ක්ෂණික වැඩ පිළිවෙළ නිසා එදා විදුරංග බේරුණා.

ඒත් නැවත වතාවක් මේ වගේ අවදානම් වැඩ කරන්න කලින් දෙ තුන් වතාවක් හිතන්න ඕනැ. විදුරංගයි යාළුවොයි ඇළ ඉවුරෙ ඉඳ ගෙන අඹ කන ගමන් කතා වුණා.

## ● මෙම කතාවෙන් ඉස්මතු වන කුසලතා

- නායකත්ව කුසලතා (Leadership Skills)
- කණ්ඩායම් වැඩ (Team work)
- තීරණ ගැනීම (Decisiveness)
- ඇහුම්කන් දීම (Listening)
- සහයෝගිතාව (Co-operation)
- සාකච්ඡා කිරීම (Negotiation)
- උපායශීලී බව (Tactfulness)

## ● ක්‍රියාකාරකම්

1. මේ කතාව කියවා එහි අන්තර්ගතය මිතුරන් සමග සාකච්ඡා කරන්න.
2. ඔබ මුහුණ දුන් මෙබඳු අද්දැකීම් පන්තියට ඉදිරිපත් කරන්න.
3. දසුන් සතු වූ නායකත්ව කුසලතා පෙළ ගස්වන්න.
4. ඔබ දසුන් නම් ඔබ මෙහි දී ගන්නා ක්‍රියාමාර්ග විස්තර කරන්න.
5. ඔබ මුහුණ දුන් මෙබඳු අද්දැකීමක් කතන්දරයක් ලෙස ලියන්න.

   එය පාසලේ හෝ පන්තියේ හෝ ඇති බිත්ති පුවත්පතට යොමු කරන්න.

## දිවිය දිනන කතා
### ඇගයීම් පත්‍රිකා ආකෘතිය

කතාවේ නම................................................ දිනය.........................

| අනු අංකය | ඇගයීම් නිර්ණායක / නම | නිවැරදි උච්චාරණයෙන් යුතු ව කියවයි. | කතාව ආශ්‍රයෙන් අසන ප්‍රශ්නවලට පිළිතුරු සපයයි. | හුවමාරු කුසලතා හඳුනා ගෙන ප්‍රකාශ කරයි. | මනා නිමාවකින් යුතු ව නියමිත වේලාවට ක්‍රියාකාරකම් සිදු කර ඉදිරිපත් කරයි. | හුවමාරු කුසලතා ජීවිතයට බද්ධ කර ගනිමින් කටයුතු කරන බව ප්‍රදර්ශනය කරයි. | මුළු ලකුණු |
|---|---|---|---|---|---|---|---|
| | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |

### ලකුණු දීමේ නිර්ණායක සඳහා ප්‍රමිති

| ඇගයීම් නිර්ණායක | ලකුණු 20යි (ඉතා හොඳයි) | ලකුණු 15යි (හොඳයි) | ලකුණු 10යි (සතුටුදායකයි) | ලකුණු 05යි (සාමාන්‍යයි) | ලකුණු 03යි (සංවර්ධනය විය යුතුයි) |
|---|---|---|---|---|---|
| නිවැරදි උච්චාරණයෙන් යුතු ව කියවයි. | වැරදීමට හැකි උපරිම වචන සංඛ්‍යාව 5කි. | වැරදීමට හැකි උපරිම වචන සංඛ්‍යාව 10කි. | වැරදීමට හැකි උපරිම වචන සංඛ්‍යාව 15කි. | වැරදීමට හැකි උපරිම වචන සංඛ්‍යාව 20කි. | වැරදීමට හැකි උපරිම වචන සංඛ්‍යාව 25ට වැඩි නම් |
| කතාව ආශ්‍රයෙන් අසන ප්‍රශ්නවලට පිළිතුරු සපයයි. | අසන ලද ප්‍රශ්න පහට ම නිවැරදි පිළිතුරු සපයයි. | අසන ලද ප්‍රශ්න පහෙන් හතරකට නිවැරදි පිළිතුරු සපයයි. | අසන ලද ප්‍රශ්න පහෙන් තුනකට නිවැරදි පිළිතුරු සපයයි. | අසන ලද ප්‍රශ්න පහෙන් දෙකකට නිවැරදි පිළිතුරු සපයයි. | අසන ලද ප්‍රශ්න පහෙන් එකකට නිවැරදි පිළිතුරු සපයයි. |
| හුවමාරු කුසලතා හඳුනා ගෙන ප්‍රකාශ කරයි. | කතාව ඇසුරෙන් හුවමාරු කුසලතා පහක් ප්‍රකාශ කරයි. | කතාව ඇසුරෙන් හුවමාරු කුසලතා හතරක් ප්‍රකාශ කරයි. | කතාව ඇසුරෙන් හුවමාරු කුසලතා තුනක් ප්‍රකාශ කරයි. | කතාව ඇසුරෙන් හුවමාරු කුසලතා දෙකක් ප්‍රකාශ කරයි. | කතාව ඇසුරෙන් හුවමාරු කුසලතා එකක් ප්‍රකාශ කරයි. |
| මනා නිමාවකින් යුතු ව නියමිත වේලාවට ක්‍රියාකාරකම් සිදු කර ඉදිරිපත් කරයි. | ක්‍රියාකාරකම් පහක් සම්පූර්ණ කරයි. | ක්‍රියාකාරකම් හතරක් සම්පූර්ණ කරයි. | ක්‍රියාකාරකම් තුනක් සම්පූර්ණ කරයි. | ක්‍රියාකාරකම් දෙකක් සම්පූර්ණ කරයි. | ක්‍රියාකාරකම් එකක් සම්පූර්ණ කරයි. |
| හුවමාරු කුසලතා ජීවිතයට බද්ධ කර ගනිමින් කටයුතු කරන බව ප්‍රදර්ශනය කරයි. | හුවමාරු කුසලතා පහකට වැඩි ප්‍රමාණයක් හැසිරීමේ දී ප්‍රදර්ශනය කරයි. | හුවමාරු කුසලතා හතරකට වැඩි ප්‍රමාණයක් හැසිරීමේ දී ප්‍රදර්ශනය කරයි. | හුවමාරු කුසලතා තුනකට වැඩි ප්‍රමාණයක් හැසිරීමේ දී ප්‍රදර්ශනය කරයි. | හුවමාරු කුසලතා දෙකකට වැඩි ප්‍රමාණයක් හැසිරීමේ දී ප්‍රදර්ශනය කරයි. | හුවමාරු කුසලතා එකකට වැඩි ප්‍රමාණයක් හැසිරීමේ දී ප්‍රදර්ශනය කරයි. |

- ශිෂ්‍යයා වඩාත් කැමැති නිර්මාණයක් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
  කතාවක් නිර්මාණය කිරීම/නාට්‍ය පිටපතක් නිර්මාණය කිරීම/නාට්‍යයක් රඟ දැක්වීම/වීඩියෝ පටයක් නිර්මාණය කිරීම/පුවත්පතකට ලිපියක් සකස් කර පළ කිරීම/ගීතයක් නිර්මාණය කිරීම/ කවි පන්තියක් නිර්මාණය කිරීම
  ලකුණු 100යි.

# දිවිය දිනන කතා

6 ශ්‍රේණිය

සිංහල



ජාතික අධ්‍යාපන ආයතනය